වාර්ෂික වාර්තාව

2024

පොල් සංවර්ධන අධිකාරිය

Ministry of Plantation and Community Infrastructure

No 54, Nawala Road, Narahenpita Colombo 5, Sri Lanka.
www.cda.gov.lk

අපගේ දර්ශනය

"පොල් කර්මාන්තය දළ දේශීය
නිෂ්පාදනය සඳහා
වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම
දායකත්වය ලබා දෙන්නා වීම සහ
නිෂ්පාදන අළෙවි විවිධාංගීකරණයේ දී
ගෝලීය නායකයා වීම."

අපගේ මෙහෙවර

ගෘහස්ථ පාරිභෝජනය සහ කර්මාන්තය සඳහා
පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම
තහවුරු කිරීම මඟින්,
පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය
ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය
සඳහා ඉහළ දායකත්වයක් කරා
ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

හැඳින්වීම

පොල් සංවර්ධන අධිකාරිය පිහිටුවීමට පෙර මුල් අවධියේ පොල් මණ්ඩලය නමින් ස්ථාපිත කර පසුකාලීනව එය පොල් සැකසුම් මණ්ඩලය, කෙඳි මණ්ඩලය හා පොල් අලෙවි මණ්ඩලය ලෙස විමධ්‍යගත කරන ලදී. පසුව එම සියළුම ආයතන එක් කොට සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි "පොල් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුයි" යන 111 වන කොටසේ 24 වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

ඉන්පසු 1980 දී පොල් සංවර්ධන අධිකාරිය නමින් වර්තමාන ආයතනය පොල් සහ පොල් නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධ ප්‍රධාන ආයතනය වශයෙන් පිහිටුවන ලදී.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරියට හිමි වූ බලතල අනුව පිරිසැකසුම්, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ, දේශීය හා විදේශීය වශයෙන් අලෙවි සංවර්ධන හා පර්යේෂණ යන ක්ෂේත්‍රයන් හි සහ කර්මාන්තයට අදාල ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අමාත්‍යතුමාට සහය දැක්වීම යනාදී අනෙකුත් අනුබද්ධිත කාර්යයන් හි දී පොල් කර්මාන්තය හා සම්බන්ධ ප්‍රධාන ආයතනය වශයෙන් නියාමන බලතල භාවිතය, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම, මඟ පෙන්වීම, තාක්ෂණය ලබා දීම, ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ මූල්‍යාධාර ලබා දීම යනා දී කාර්යයන් හි නිරත වේ.

මෙයට අමතරව පිරිසැකසුම්, තත්ත්ව පාලනය හා තත්ත්ව ආරක්ෂණය, අලෙවිකරණය යනාදී අංශයන්ට අදාලව කර්මාන්තයේ නිරත සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධ සංවර්ධන හා පහසුකම් සැලසීමේ කටයුතු, අධීක්ෂණ හා නියාමන කටයුතු ආදී සෘජු මෙහෙයුම් කාර්යයන් වලදී හා සමස්ත කර්මාන්තයේ උන්නතිය සඳහා වගකීම දැරීමට පොල් සංවර්ධන අධිකාරිය වෙත බලතල පැවරී ඇත.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යයමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන අංශය යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර ඒ එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකරගැනීමේ දී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශ වලට සහය වේ.

සභාපති ප්‍රධානියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩ කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සියළුම අංශ වල අංශ ප්‍රධානීන් හරහා ඉටු කරනු ලබයි. මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2024 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 181ක් වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් 31 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.


සභාපතිගේ සමාලෝචනය

ගෝලීය පොල් නිෂ්පාදනයේ 4 වන ස්ථානය හිමිකරගෙන සිටින ශ්‍රී ලංකාවේ වර්තමාන පොල් වගා බිම් ප්‍රමාණය 10,999,83ක් පමණ වේ. ඉන් අක්කර 20 ට අඩු සුළු පරිමාණ වගාවන්, වගා බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 84%ක් පමණ වන අතර අක්කර 20 ට වඩා වැඩි වගා බිම් ප්‍රතිශතයක් ලෙස 16%ක් පමණ වේ. ඈත අතීතයේ සිටම ලාංකික ජනතාවගේ ප්‍රධාන ආහාරයක් ලෙස පොල්, භාවිතා වී ඇති අතර, වර්තමානය වන විට වාර්ෂික පොල් නිෂ්පාදනයෙන් 60%ක් පමණ පොල් ගෘහස්ථ පරිභෝජනය සඳහා ද, 40% ක් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදාගනු ලබයි.

ඒ අනුව පොල් නිෂ්පාදන, පොල් මද ආශ්‍රිත, පොල් ලෙළි ආශ්‍රිත හා පොල් කටු ආශ්‍රිත කර්මාන්ත ලෙස වර්ගකළ හැකිය. පොල් සංවර්ධන අධිකාරිය (පො.සං.අ.) වශයෙන් අපගේ මූලික අරමුණු වනුයේ ගෘහස්ථ පරිභෝජනයට සහ කර්මාන්ත සඳහා පොල් හා පොල් නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම දීර්ඝකාලීන වාණිජමය ඵලදායීතාවය, ජාතික ආර්ථිකය නගාසිටුවීමෙහි ලා, පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහල නැංවීම වේ. 2023 වර්ෂයට සාපේක්ෂව 12 % ක පොල් ඵලදායි, තුළින් අඩුවීමක් වාර්තා වූ 2024 සඳහා, මෙතෙක් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ ලබා ඇති ඉහළම අපනයන ආදායම වන රු. බිලියන 257.9 (ඇ.එ.ජ. ඩොලර් මිලියන 854.93) ක වාර්තාගත වැඩිවීමක්, ලබා ගැනීමට හැකිවීම සතුටුදායක කරුණකි. පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මකභාවය තහවුරු කිරීම හා පවත්වාගැනීම සඳහාද පො.සං.අ. කටයුතු කරන අතර පොල් කර්මාන්ත ලියාපදිංචි කර BRCGS, ISO, GMP වැනි තත්ත්ව සහතික ලබා ගැනීමට උපදෙස් හා විශේෂඥය දැනුම ලබා දීම, කප්රුක ණය යෝජනා ක්‍රමය වැනි අඩු පොළී ණය ලබා දීම් තුලින් ව්‍යාපාරය දියුණු කිරීමට දිරියක් වීම, පුහුණු වැඩසටහන් හා දේශීය විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට නිෂ්පාදකයන් හා අපනයනකරුවන් සම්බන්ධ කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලාංකික නිෂ්පාදන 40කට අධික ප්‍රමාණයක් ලොව රටවල් 150කට පමණ අපනයනය කිරීම හා ඒවායේ ඉල්ලුම හා ගුණාත්මකභාවය පවත්වා ගැනීමට අප නිෂ්පාදකයින්ට හැකියාව ලැබී ඇත.

2023-2024 වර්ෂවලදී සුදුමැස්සා ව්‍යාප්තිය සහ පොල් පොහොර යෙදීමේ ගැටළු හේතුවෙන් පොල් නිෂ්පාදනය අඩුවීම, දේශීය අගය එකතු කරන ලද නිෂ්පාදන වලට අපනයන වෙළඳපොලේ වැඩි ඉල්ලුමක් ඇතිවීම හා සමගාමීව වෙළඳපොළ පොල් මිලෙහි යම් වැඩි වීමක් සිදුවිය. පොල් නිෂ්පාදන අපනයනය කඩාකප්පල් කිරීමකින් තොරව පාරිභෝගික ජනතාවට පොල් සහන මිලකට ලබා දීම සහතික කිරීම සඳහා පොල් නිෂ්පාදන ආනයනය කර අගය එකතුකර අපනයනය සඳහා අවසර දීම පිළිබඳව ක්‍රියාමාර්ග, මාර්ගෝපදේශයන් හා අනුමැතීන් දැනටමත් සකස් කර ඇත. ඒ අනුව පොල් ගෙඩි මිලියන 200කට සමාන පොල් නිෂ්පාදන අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා සැලසුම්කර තිබේ. ආනයනය කරන ලද අමුද්‍රව්‍ය අගය එකතුකර අපනයනය මගින් විදේශ විනිමය ලබා ගැනීම සහ දේශීය පොල් දේශීය පාරිභෝගිකයාහට අඩුමිලට ලබාගැනීමට හැකිවීම මේ මගින් අපේක්ෂා කෙරේ. ගුණාත්මකභාවයෙන් අනූන වියලන ලද පොල් කැබලි ආනයනය, පො.සං.අ.යේ නියාමනය සහිතව නිෂ්පාදනය කර ඇසුරුම් කර බෙදාහැරීම මගින් දේශීය පාරිභෝගිකයා ගුණාත්මක හා ලාභදායී පොල් තෙල් ලබාදීම සඳහාද සියලු කටයුතු සිදුකරමින් පවතී.

දැනට කර්මාන්ත සඳහා යොදා නොගෙන ගෘහස්ථව ඉතිරිවන පොල් කටු හා පොල් ලෙලි කර්මාන්ත වලට යොමුකිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින අතර පාසල් ළමුන් කේන්ද්‍ර කරගත් පොල් කටු එකතු කිරීමේ වැඩසටහනක් 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇත. මහාපරිමාණ නිෂ්පාදකයින් මෙම වැඩසටහනට සම්බන්ධකරදීම තුලින් පාසල් සංවර්ධනය සඳහා ආදායමක් ලබාගැනීමේ හැකියාවද සලසා දී තිබේ. ගෘහස්ථ පොල් පරිභෝජනය වෙනුවට ලාභදායී, කාලය ඉතිරිකරන සහ පහසුදායී පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහාද පොල් සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් පවතී. ගෘහස්ථ පරිභෝජනය අවම කර වැඩි පොල් ප්‍රමාණයක් කර්මාන්ත සඳහා යොමු කිරීම මෙහි අරමුණ වේ. වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, පො.සං.අ., පොල් පර්යේෂණ ආයතනය, පොල් වගාකිරීමේ මණ්ඩලය, එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO), ලංකා පොල් කර්මාන්ත මණ්ඩලය (CCCI) එක්ව පොල් කර්මාන්තයේ මාර්ගගත සිතියම සහ උපායමාර්ගික සැලැස්ම වසර දහයක් සඳහා සකස්කිරීමට මුලපුරා ඇති අතර පොල් වගාව ප්‍රචලිත කිරීම තුලින් පොල් ඵලදාව ගෙඩි මිලියන 4200 ක් දක්වා ඉහල නැංවීමටත්, 2030 වන විට පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදායම ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.5 දක්වා ඉහල නැංවීම අපගේ අරමුණ වේ.



ශාන්ත රණතුංග
සභාපති

2024 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්


- මහාචාර්ය රොෂාන් පෙරේරා මහතා (2024.01.01 සිට 2024.09.30 දක්වා) - සභාපති
- ශාන්ත රණතුංග මහතා (2024.10.08 සිට) - සභාපති
- පී.එස්.නිලංකි මිය
- සමරසේන කලහේවත්ත මහතා
- එන්.එස්.වනසිංහ මහතා
- ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මහතා
- උපාලි ධම්මික ද සිල්වා මහතා
- ඒ.එස්.බී.නාගහපිටිය මහතා
- ටී.එම්.ජූඩ් ඇන්ටන් පීරිස් මහතා

} 2024.09.18 දක්වා

සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

මහාචාර්ය රොෂාන් පෙරේරා මහතා (2024.01.01 සිට 2024.09.30 දක්වා)	- සභාපති
ශාන්ත රණතුංග මහතා (2024.10.08 සිට)	- සභාපති
1 එස්.එස්. පුරසිංහ මහත්මිය	- අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ)
2 එම්.පී. සන්ධ්‍යා කාන්ති මහත්මිය	- අධ්‍යක්ෂ (මුදල්)
3 එච්.එම්.ඩී. වාසුලා හේරත් මහත්මිය (2024.01.01 සිට 2024.09.14 දක්වා)	- අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) රා.ආ
එම්.එම්. පුෂ්පකාන්ත මහතා(2024.11.04 සිට)	- අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) රා.ඉ
4 ඊ.ඩබ්.ඩී.වී.යූ. රම්‍යදාස මහතා (2024.01.01 සිට)	- අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) රා.ආ
5 ඒ.ආර්. කුලතුංග මහතා (2024.01.01 සිට 2024.11.03 දක්වා)	- අධ්‍යක්ෂ (පරිපාලන) රා.ආ
එස්.ඩබ්ලිව්. රසිකා මහත්මිය (2024.11.07 සිට)	- අධ්‍යක්ෂ (පරිපාලන) රා.ඉ
6 ටී. ඉෂානි බුද්ධිකා ආනන්ද මෙනවිය (2024.01.01 සිට 2024.02.28 දක්වා)	- අභ්‍යන්තර විගණක රා.ආ
එන්.එම්. සමරසිංහ මහත්මිය (2024.03.01 සිට)	- අභ්‍යන්තර විගණක

ආයතනයේ සංවිධාන ව්‍යුහය



කෙටි යෙදුම් :

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නිඅධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට. - කළමණාකරණ මට්ටම
4. අභ්‍යන්තර වි.නිලධාරී - අභ්‍යන්තර විගණන නිලධාරී
5. පරි. නිලධාරී - පරිපාලන නිලධාරී
6. ආර්. පර්. නිලධාරී- ආථර්ික පයෙර්ෂණ නිලධාරී
7. සැ. සං. නිලධාරී - සැකසුම් සංවර්ධන නිලධාරී
8. තත්. පාලන නිලධාරී- තත්ත්ව පාලන නිලධාරී
9. කණි.කළ. - කණිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ. සං. හා. පර්. - අලෙවි සංවර්ධන හා පයෙර්ෂණ
11. තත්. පා. හා ආර. තත්ත්ව පාලන හා තත්.ආරක්ෂණ

පටුන

		පරිච්ඡේද අංකය
1	සැකසුම් සංවර්ධන අංශය	09-20
2	තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය	21-33
3	අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය	34-41
4	පරිපාලන අංශය	42-44
5	මුදල් අංශය	45-79
6	අභ්‍යන්තර විගණන අංශය	80-81
7	විගණකාධිපති වාර්තාව	82-90

01. සැකසුම් සංවර්ධන අංශය

1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ 20 වගන්තිය ප්‍රකාරව, පොල් සංවර්ධන අධිකාරියේ අරමුණු, ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මගින් අධිකාරිය වෙත පවරා තිබෙන අතර, ඉන් පොල් කර්මාන්තයේ නිෂ්පාදන ක්‍රියාවලිය, කාර්මික ක්‍රියාවලිය, පොල් සහ පොල් නිෂ්පාදන මෙරට සහ අපනයන වෙළඳපොළට යැවීම සම්බන්ධ අධීක්ෂණය කිරීමේ කටයුතු සහ කර්මාන්ත සංවර්ධනය කිරීමේ කටයුතු සැකසුම් සංවර්ධන අංශය මගින් සිදු කෙරේ.

ඒ යටතේ පසුගිය වසරේ මෙන්ම 2024 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය සැලසුම් සකස් කරන ලදී.

1. පොල් ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළු පොල් ආශ්‍රිත කර්මාන්තය නියාමනය කිරීම මගින් දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිති පිරිවිතර හා ගැළපෙන ලෙස සකස් කල නිෂ්පාදන අපනයනය සඳහා ඉදිරිපත් කිරීමට සහාය වීම.
2. දේශීය පොල්තෙල් කර්මාන්තය නඟාසිටුවීම සඳහා ක්‍රමවේද සකස් කිරීම හා ගුණාත්මක තත්ත්වයෙන් යුතු පොල්තෙල් පාරිභෝගිකයා අතට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
3. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන සහ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රමිති නියම කිරීම සහ ඒවා පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරවීම.
4. අගය වැඩිකල පොල් ආශ්‍රිත නව නිෂ්පාදන නිපදවීම සඳහා ශිල්පීය සහාය සහ මූල්‍ය සහාය ලබාදීම.
5. පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා කාරක හා ප්‍රාග්ධන පහසුකම් සලසා දීම මගින් නිෂ්පාදන කාර්යක්ෂමතාව, සඵලත්වය ඉහල නංවාලීම හා ඒකක පිරිවැය අවම කිරීම.
6. පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් සඳහා ඇති නව ප්‍රවණතා, තාක්ෂණය හා පර්යේෂණ සඳහා ප්‍රේරණය ඇති කිරීම හා නිපුණතා වර්ධනය සඳහා දේශීය හා විදේශීය තාක්ෂණය වෙත කර්මාන්තකරුවන් යොමු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් පුහුණු කිරීම.
7. අවිධිමත් කර්මාන්තය නඟාසිටුවීම, එහි තත්ත්වය වැඩි දියුණු කිරීම හා අපනයනකරුවන් සම්බන්ධ කිරීම හරහා ඒ සඳහා දායකත්වය ලබා දීම.

මෙම සැලසුම්කරණයෙන් පොල් සංවර්ධන අධිකාරියේ මෙහෙවර හා දැක්ම පදනම් කර ගනිමින්, තිරසාර සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ඉලක්කගත අපනයන ආදායම් වර්ධනය කර ගැනීම මූලික වශයෙන් අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, 2024 වර්ෂයේ ඉහත සඳහන් කල සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

1. පොල් ආශ්‍රිත කර්මාන්ත නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම

මේ තුළින් රටේ පවත්නා නීතිරීති හා රෙගුලාසි අනුව කර්මාන්තය පවත්වාගෙන යාමට කර්මාන්තකරුවන් යොමු කරවීම ප්‍රධාන අරමුණ වේ. 2024 වර්ෂයේ ද පොල් ආශ්‍රිත නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන් ලියාපදිංචි කිරීම පෙර වර්ෂයේදී මෙන් ලියාපදිංචි දිනයේ සිට වර්ෂයක කාලයක් වෙනුවෙන් ලබාදෙන ලදී. ලියාපදිංචිය වඩාත් පහසු කරලීම පිණිස, මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය ඉල්ලුම් කිරීමට කර්මාන්තකරුවන්ට අවස්ථා සලසා දෙන ලදී.

පෙර වසරවල මෙනම්, සියලුම පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා (සාම්ප්‍රදායික පොල්තෙල්, කොප්පරා, පොල් පැණි, පොල් සීනි හැර), ISO 22000:2018 ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකයත්, සියලුම කොහුබත් උපස්ථර සඳහා යහපත් නිෂ්පාදන භාවිතාවන් (GMP) පිලිබඳ සහතිකයත් ලබා ගැනීම අනිවාර්යය කෙරුණි. එම අවශ්‍යතා සම්පූර්ණ කරන ලද කර්මාන්තකරුවන් පහත පරිදි අධිකාරිය සමග ලියාපදිංචි වී ඇත.

වගුව 1: 2024 වර්ෂයේ කර්මාන්තකරුවන්ගේ ලියාපදිංචිය

	නිෂ්පාදන වර්ගය	2022	2023	2024
1	දිසිඳි පොල්	49	53	49
2	පොල් කිරම	16	15	19
3	පොල් තලප	16	20	16
4	කොප්පරා පොල්තෙල්	110	146	109
5	නැවුම් පොල්තෙල්	47	48	51
6	සුදු පොල්තෙල්	81	83	96
7	MCT තෙල්	3	3	03
8	MCT පවුඩර්	1	2	02
9	කාර්මික පොල්තෙල්	6	5	04
10	පොල් වතුර	25	20	22
11	පොල් විනාකිරි	1	1	01
12	කුරුටු පොල්තෙල්	34	29	35

	නිෂ්පාදන වර්ගය	2022	2023	2024
13	පොල් කිරි	28	28	29
14	පිටිකළ පොල්කිරි	6	7	10
15	පොල්කිරි ආශ්‍රිත නිෂ්පාදන	7	8	06
16	පොල් බටර්	9	9	11
17	පොල් සීනි	7	9	10
18	පිරිපහදු කරන ලද පොල්තෙල්	10	7	13
19	පොල් රා	1	1	01
20	මෘදු කාරක ජෙල්	1	1	01
21	කොප්පරා	27	19	15
22	පොල් තැවරුම	5	4	06
23	දිසිඳි පොල් නැවත ඇසුරුම	8	14	17
24	පොල් සිරප්	3	2	03
25	ගාන ලද මදපොල්	1	3	06
26	පොල් පැණි	9	9	10
27	පොල්කිරි සැකසුම්කරු	3	3	03
28	පොල් ඇමිනෝ	8	6	07
29	පොල් ජෑම්	1	1	-
30	දිසිඳි පොල් (පතුරු)	1	1	05
31	පොල් චතුර පවුඩර්	2	2	02
32	නැවුම් පොල්තෙල් පවුඩර්	1	1	01
33	නැවුම් පොල්තෙල් (කුරුටු සමඟ)	1	0	04
34	දිසිඳි පොල් (පතුරු - කුරුටු සහිත)	3	6	-
35	පොල් පිටි	13	17	21
36	පොල් ආශ්‍රිත මධ්‍යසාර	4	4	05
38	පොල් සම්බෝල	1	1	02
38	සක්‍රීය කාබන්	9	9	09
39	අගය එකතුකල සක්‍රීය කාබන්	1	-	-
40	කොහු /කොහු මෝල්	217	148	179
41	පොල්කටු අඟුරු කැට	9	7	14
42	Hub ක්‍රියාකරු	1	1	01
43	පොල්කටු අඟුරු	32	32	31
44	පොල්කටු කැබලි / පවුඩර්	5	7	4
45	පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ	7	7	22
46	නිමි භාණ්ඩ	111	108	107
47	කොහුබත් උපස්ථර	139	168	166
48	කෙඳි අතරමැදි නිපැයුම්	53	50	58
49	වෙනත්	9	35	23
	එකතුව	**1142**	**1160**	**1209**

2. පොල් වගාවේ ව්‍යාප්තියට සාපේක්ෂව කර්මාන්ත ව්‍යාප්තිය කිරීම සඳහා මැදිහත් වීම

පොල් වගාවට සාපේක්ෂව කර්මාන්ත ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව, නව ව්‍යාපාර ලියාපදිංචියේ දී, අදාල ප්‍රදේශය තුල කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා ඇති විභවතාවය අධ්‍යනය කිරීමෙන් අනතුරුව ඒ සඳහා අනුමැතිය ලබාදීමට අධිකාරියේ සහාය ලබා ගන්නා ලෙස කරන ලද ඉල්ලීමට අනුව, 2024 වර්ෂයේදී ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් පොල් ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම වෙනුවෙන් නව ව්‍යාපාර ලියාපදිංචි සහතික ලබා ගැනීමට අයදුම් කල කර්මාන්තකරුවන් 108 දෙනෙකු සඳහා පොල් සංවර්ධන අධිකාරියේ විරුද්ධත්වයක් නොමැති බවට වූ නිර්දේශය සහිත ලිපි නිකුත් කර ඇත. ඒ අනුව, 2024 දී ව්‍යාපාර ලියාපදිංචිය සඳහා නිර්දේශය ලබාදුන් පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් අතරින් දිස්ත්‍රික්ක අනුව සහ ලියාපදිංචිය අයදුම් කල පොල් ආශ්‍රිත කර්මාන්තය අනුව කර්මාන්තකරුවන් සංඛ්‍යාව පහත පරිදි වේ.

වගුව 2: 2024 වර්ෂයේ ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා අවසරය ලබාදීම (නිෂ්පාදන වර්ගය අනුව)

Dustruct\$ Product	ඉදල් කොහු	කාර්මික පොල් තෙල්	කොප්පරා	කොප්පරා පොල් තෙල	කොහු බෙරිය	කොහු ලණු	කොහු බෙල්ල	ටූඩයින	තිම් භාණ්ඩ/ කවඩි බුරුසු	පොල් පැණි	පොල්කිටුල අඟුරු	ගෘහාශ්‍රිත පොල්ලේලි කැබලි	කිරි කොහු	ඩිසිකුරු භාණ්ඩ	සුදු පොල් තෙල්	එකතුව
එකතුව	4	1	12	32	20	2	1	1	2	1	4	20	1	3	4	108

පොල් ආශ්‍රිත නව කර්මාන්ත ආරම්භ කිරීමේදී පොල් ත්‍රිකෝණයෙන් පරිබාහිරව ආරම්භ කර එම ප්‍රදේශ වල නිපදවනු ලබන පොල්, කර්මාන්ත අංශය සඳහා යොදා ගැනීමට කර්මාන්තකරුවන් වැඩි උනන්දුවක් ඇති කිරීමට පොල් සංවර්ධන අධිකාරිය අපේක්ෂා කරයි. ඒ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් මගින් උපදෙස් හා තාක්ෂණික දැනුම ලබාදීමත්, නව කර්මාන්ත පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමත් සිදු කෙරේ.

3. නියාමන කටයුතු සඳහා පොල් ආශ්‍රිත කර්මාන්ත පරීක්ෂා කිරීම, විගණනය සඳහා සහභාගී වීම, නිෂ්පාදනයන්ගේ අපනයන තොග නියැදි ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම සඳහා යොමු කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම

අධිකාරිය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයක් ලෙස මෙම කර්තව්‍යය හැඳින්විය හැකි ඒ අනුව, ක්‍රියාත්මක වෙමින් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් අංශය පෙර වර්ෂවල මෙන්ම 2024 වර්ෂයේ ද, පොල් ආශ්‍රිත කර්මාන්ත පරීක්ෂා කිරීම, ආදර්ශ ලබා ගැනීම, විශ්ලේෂණය සඳහා යොමු කිරීම හා අවශ්‍යතාවය පරිදි කර්මාන්තකරුවන් වෙත තාක්ෂණික උපදෙස් ලබාදීම සිදු කරන ලදී අධිකාරියේ ලියාපදිංචි නිෂ්පාදන ආයතන, ලියාපදිංචි අවස්ථාවේදීම පරීක්ෂාවට ලක් කෙරෙන අතර, නිෂ්පාදන වර්ගය අනුව එම කර්මාන්ත දෛනිකව, මාසිකව, කාර්තු වශයෙන් පරීක්ෂාවට ලක්කර ඇත. එහිදී, අහඹු ලෙස නියැදි පරීක්ෂාවක් සිදු කිරීම සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් නියැදි ලබා ගැනීම හා විශ්ලේෂණය සඳහා අධිකාරියේ රසායනාගාරය වෙත යොමු කිරීම ද සිදු කරන ලදී. එම විශ්ලේෂණ වාර්තාවල ප්‍රතිඵල මත අදාළ පරිදි කර්මාන්තකරුවන් වෙත තාක්ෂණික උපදෙස් ලබා දීම ක්ෂේත්‍ර නිලධාරීන් හරහා සිදු කෙරුණි.

මෙම වසරේදී, විවිධ නිෂ්පාදන නියැදි 8733ක් ලබාගෙන විශ්ලේෂණ කටයුතු වෙත යොමු කිරීමට සමත්ව ඇත. මෙම විශ්ලේෂණ මත පදනම්ව අදාල නිෂ්පාදනයන්ගේ තත්ත්වය ඉහල නැංවීම සඳහා කටයුතු කරන ලදී. එමඟින්, ලෝක වෙළඳපොළට තරඟකාරී නිෂ්පාදන යොමු කරවීම අධිකාරියේ ප්‍රධාන අපේක්ෂාවයි.

ප්‍රධාන පරීක්ෂා කිරීම්වලට අමතරව, පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000:2018 ආහාර සුරක්ෂිතතාව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ත්ව සහතික ලබාගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබාදීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, එම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට දායකවීම ද සැකසුම් සංවර්ධන අංශය හරහා සිදුකරන ලදී. SLAB (ශ්‍රී ලංකා ප්‍රතිතන ආයතනය) හා/හෝ IFA (International Accreditation Forum) යන ආයතන වල ප්‍රතිතනය වූ සහතිකකරණ ආයතන විගණන කටයුතු පවත්වන විට අධිකාරිය නියෝජනය කරමින්, විගණනය සඳහා පුහුණුවලත් ක්ෂේත්‍ර නිලධාරියෙකු ඒ සඳහා යොමු කරන අතර එම නිලධාරියා විසින් ලබාදෙන නිරීක්ෂණ වාර්තාවට අනුව අදාල ආයතනයන්හී පවතින දුර්වලතා නිවැරදි කිරීමට කටයුතු කිරීම සඳහා යොමු කරන ලදී. 2024 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 36ක ISO 22000:2018 විගණන පරීක්ෂණ හා කර්මාන්ත 89ක GMP විගණන පරීක්ෂණ සඳහා සහභාගී විය.

TIEP ක්‍රමවේදය ඔස්සේ ආනයනය වන හා අපනයනය වන පොල්තෙල් පරීක්ෂා කිරීම ද සැකසුම් සංවර්ධන අංශය හරහා සිදු කෙරුණි. මෙහිදී බහාලුම් 583ක පොල්තෙල් නියැදි රසායනාගාර පරීක්ෂාවන්ට යොමුකර ඇත. 2024 වර්ෂය අවසාන වන විට සැකසුම් සංවර්ධන අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් පොල්තෙල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලා, ආනයන අපනයන බහාලුම්, ගෙඩි පොල් හා තැඹිලි අපනයන බහාලුම් පරීක්ෂා කිරීම් 17,500 ක් පමණ සිදුකර ඇත.

4. අපනයන ආදර්ශ පරීක්ෂාව සඳහා යොමු කිරීම, අපනයන සහතික නිකුත් කිරීම හරහා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නියාමනය කිරීම

සැකසුම් සංවර්ධන අංශයේ සේවා සමායෝජන ඒකකය මගින් සපයනු ලබන ඉහත සඳහන් සේවාව තුළින්, අපනයනකරුවන් වෙත තම නිෂ්පාදන අපනයනයේදී නිෂ්කාෂණ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරගැනීමට මෙම සහතිකපත් ලබාදීම සිදු කෙරේ. මෙම තත්ත්ව සහතික නිකුත් කිරීම නිෂ්පාදන වල විශ්ලේෂණ පිරිවිතර හා සෘජුව සම්බන්ධ වන බැවින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදන සිදු කිරීමට ඔවුන් නිතැතින්ම පෙළඹේ.

2024 වර්ෂය තුල නිෂ්පාදිත දිසිදි පොල් වලින්, ක්ෂුද්‍රජීවී සහ භෞතික පරාමිති විශ්ලේෂණය කිරීම සඳහා දෛනික දිසිදි ආදර්ශ 7,922ක් සැකසුම් සංවර්ධන අංශය වෙත ලැබී ඇත. ඒ මත පදනම්ව අපනයන සහතික 4,330ක් නිකුත් කර ඇත. මෙම අපනයන සහතික සෑම දිසිදි පොල් අපනයනයකදීම ඉදිරිපත් කිරීම අනිවාර්ය කර ඇත.

වගුව 3: දිසිදී පොල් අපනයන තොග සඳහා ක්ෂුද්‍රජීවී හා භෞතික තත්ත්ව විශ්ලේෂණ සහතිකපත් නිකුත් කිරීම

සහතික වර්ගය	නිකුත් කල සහතිකපත් ගණන	
	2023	2024
සැල්මොනෙල්ලා රහිත බවට	1639	2020
භෞතික තත්ත්ව විශ්ලේෂණ	1639	2020
ඇෆ්ලටෝක්සින් රහිත බවට	101	136
සල්ෆර්ඩයොක්සයිඩ් රහිත බවට	137	154
මුළු ගණන	**3516**	**4330**

මීට අමතරව, අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් අවශ්‍යතා මත ගෙනවිත් භාරදෙන පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද ප්‍රතිඵල ලේඛණ අනුව පහත පරිදි විශ්ලේෂණ වාර්තා සහතික නිකුත් කර ඇත.

වගුව 4: කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම අනුව ලැබෙන ආදර්ශ සඳහා ප්‍රතිඵල වාර්තා නිකුත් කිරීම

නිෂ්පාදන වර්ගය	නිකුත් කල වාර්තා ගණන		
	2022	2023	2024
කොහු / කොහුබත්	337	347	363
පොල්තෙල්	294	269	53
දිසිදි පොල්	06	-	02
මේදය තරමක් ඉවත් කල දිසිදි පොල්	25	61	22
පොල් කිරි	03	26	04
පුන්නක්කු	09	-	-
පොල් ක්‍රීම්	03	02	02
තැඹිලි	01	-	04
පොල් වතුර	04	-	01
පොල්කටු අඟුරු	02	07	-
වෙනත්	-	10	03

එමෙන්ම TIEP ක්‍රමවේදය යටතේ පොල්තෙල් ආදර්ශ 583ක්, පොල් ඇමිනෝ ආදර්ශ 64 ක්, Coconut Rolls ආදර්ශ 3 ක්, පොල් සීනි ආදර්ශ 25 ක්, පොල් සිරප් ආදර්ශ 8 ක්, පොල් වතුර ආදර්ශ 4ක්, රසායනාගාර පරීක්ෂාවට ලක් කොට ඇත. ප්‍රතික්ෂේපිත පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ කාණ්ඩය යටතේ දිසිදි පොල් ආදර්ශ 4ක් ,පොල් කිරි ආදර්ශ 3ක් සහ පොල් වතුර ආදර්ශ 1ක් ද රැස්කර රසායනාගාරය වෙත පරීක්ෂාව සඳහා ලබා දී ඇත.

5. සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ හා කර්මාන්තවල සේවයේ නියුතු තාක්ෂණික සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුණතා සංවර්ධනය කිරීම

2024 වසර තුළදී සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා 09 ක් පවත්වා ඇත. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (Sri Lanka Standards Institution - SLSI), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනය (United Nations Industrial Development Organization - UNIDO) (BESPA ව්‍යාපෘතිය), කාර්මික සංවර්ධන මණ්ඩලය (Industrial Development Board - IDB), සහ පොල් පර්යේෂණ ආයතනය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය (National Institute of Plantation Management - NIPM), යන ආයතන මඟින් ලබාදී ඇත. මෙම පුහුණු පාඨමාලා සඳහා තාක්ෂණික පුහුණු පාඨමාලා, අපනයනය පිළිබඳ පුහුණු පාඨමාලා සහ කාර්යාල කටයුතු පිළිබඳ පාඨමාලා ඇතුළත් වූ අතර ඒ පිළිබඳව විස්තර පහත දක්වා ඇත.

වගුව 5: සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන් වෙත ලබාදෙන ලද පුහුණු වැඩසටහන්

පුහුණු පාඨමාලාව	පාඨමාලාව පැවැත්වූ ආයතනය
ISO 17020:2012 අභ්‍යන්තර විගණක	එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනය
UNIDO- SGS- ප්‍රධාන විගණක ISO 22000	එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනය
GMP- කෙඳි	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
අපනයන ප්‍රවර්ධන පුහුණු වැඩසටහන	කාර්මික සංවර්ධන මණ්ඩලය
ISO 22000	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
දැනුවත් කිරීමේ සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
පොල් අයිස්ක්‍රීම් සහ නාටාඩි කොකෝ	පොල් පර්යේෂණ ආයතනය
පොල් වතුර සහ තැඹිලි සැකසීම	පොල් පර්යේෂණ ආයතනය

6. සැකසුම් සංවර්ධන අංශයේ පරීක්ෂණ ඒකකය වෙත පරීක්ෂා කිරීම් සඳහා වූ ISO 17020:2012 ප්‍රතීතන / අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීමත් ඒ හරහා පරීක්ෂණ කටයුතු ගෝලීය වශයෙන් පිළිගත් ක්‍රමවේදය අනුව සිදු කිරීම

දිසිදි පොල් නිෂ්පාදනය සඳහා නියැදි ලබාගැනීම සහ පරීක්ෂා කිරීම් වෙනුවෙන්, පරීක්ෂණ ආයතන සඳහා එකී අනුකූලතාව පිළිබඳ තක්සේරුව ලබාගැනීම සඳහා වූ අන්තර්ජාතික ප්‍රමිති සහතික පද්ධතිය වනුයේ ISO 17020:2012 තත්ත්ව සහතික පද්ධතියයි. ඉහත ප්‍රමිතිය නොයෙකුත් පරීක්ෂණ ආයතනයන්හි ක්‍රියාපටිපාටීන් විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා උපකාරී වන්නා වූ අවශ්‍යතාවයන් ඉදිරිපත් කොට ඇත. යම් ආයතනයක් ඔවුන් විසින් කරගෙන යනු ලබන පරීක්ෂණ කටයුතුවල අනුකූලතාව වඩාත් අපක්ෂපාතී ලෙස සහ අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස මෙය ඉවහල් වේ. මෙමඟින් ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශ්වාසනීයත්වයක් ගොඩනැඟේ.

2024 වර්ෂය සඳහා වාර්ෂික විගණනය 2024 ඔක්තෝම්බර් 09 සහ නොවැම්බර් 29 දෙදින පවත්වන ලද අතර එහිදී නොගැළපීම් 10ක් පෙන්වාදෙන ලදී. මෙම නොගැළපීම් නිවැරදි කර ISO ක්‍රමවේදය තවදුරටත් වැඩිදියුණු කර ගැනීමට කටයුතු කර ඇත.

මෙම ප්‍රමිති සහතිකය ලබාගැනීම සඳහා අවශ්‍ය අත්පොත්, ලේඛන සහ වාර්තා සකස් කර ඇති අතර, ඒවා දෛනිකව යාවත්කාලීන කෙරේ. සැකසුම් සංවර්ධන අංශයේ මෙම ප්‍රමිති සහතිකය ලබාගැනීමේ කටයුතු සඳහා ක්‍රියාකරන නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පරීක්ෂකවරුන් සහ පරීක්ෂකවරුන් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (Sri Lanka Accreditation Board - SLAB) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (Sri Lanka Standard Institute) පුහුණුවීම් සඳහා සහභාගි කරවා ඇති අතර ඉදිරියට ද මීට අදාළ පුහුණුවීම් ලබාදීමට නියමිතව ඇත.

මෙයට අමතරව 2024 වසර තුළදී, දිසිදි පොල් නිෂ්පාදන වලට අමතරව, නැවුම් පොල්තෙල්, පොල් වතුර, පොල් කිරි, කොහුබත් උපස්ථර සහ සක්‍රීය කාබන් සඳහා අනුකූලතා සහතිකය ලබාගැනීමට අදාල කටයුතු සකසමින් පවතී. මේ සඳහා අවශ්‍ය අත්පොත්, දත්ත පද්ධතීන්, අභ්‍යන්තර විගණන ආදී කටයුතු සම්පූර්ණ කරන ලදී. ඒ අනුව, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට (Sri Lanka Accreditation Board - SLAB) අයදුම්පත යොමුකර, නව නිෂ්පාදන වෙනුවෙන් මෙම සහතිකය තව දුරටත් දීර්ඝ කර ගැනීමට කටයුතු කෙරේ.

එමෙන්ම, වලංගු කිරීමේ ක්‍රියාවලිය ද මෙම අනුකූලතා සහතිකයට සමගාමීව ආරම්භ කර ඇත. එහිදී, දිසිදි නිෂ්පාදන කර්මාන්තයේදී භාවිතා වන වාෂ්ප මඟින් විෂබීජහරණය කිරීම සහ තෙල් පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය වන පිරිපහදු කරන ලද, වර්ණ සහ ගන්ධය ඉවත්කිරීමේ ක්‍රියාවලිය සඳහා වලංගු කිරීමේ ක්‍රියාවලිය කාර්මික තාක්ෂණික ආයතනය (Industrial Technology Institute -ITI) සමඟ ඒකාබද්ධව සිදු කරමින් පවතී.

7. ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් නිෂ්පාදනය සඳහා කර්මාන්තකරුවන් යොමු කරවීම, සහාය වීම හා ගුණාත්මක පොල්තෙල් පරිභෝජනය සම්බන්ධව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පොල්තෙල් පරිභෝජනය සඳහා වැඩි නැඹුරුතාවයක් පවතින මෙවන් වකවානුවක පරිභෝජනයට සුදුසු වර්ගයේ පොල්තෙල් වෙළඳපලෙන් ලබා ගැනීම පාරිභෝගිකයාට ගැටළුවක් වී ඇත. තත්ත්වයෙන් බාල පරිභෝජනයට නුසුදුසු පොල්තෙල් වෙළඳපලේ පවතින බවත්, තත්ත්වයෙන් ඉහල පොල්තෙල් වල මිල ඉහල බැවින් පාරිභෝගිකයින් බොහෝමයක් පරිභෝජනයට නුසුදුසු සෞඛ්‍යයට අහිතකර මිල අඩු පොල්තෙල් මිලදී ගැනීමට පෙළඹෙන බවත් පෙනීගොස් ඇත.

පොල්තෙල් මිල ගණන් අඩු වීමට පහත කරුණු හේතු වී ඇත.

01. නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය නුසුදුසු තත්ත්වයේ වීම.

02. නිෂ්පාදනායතනයෙන් ඇසුරුම් කිරීමකින් තොරව වෙළඳපලට නිකුත් කරන පොල්තෙල්, තත්ත්වයෙන් බාල පොල්තෙල් සමඟ මිශ්‍ර කර විකිණීම.

මෙහි සඳහන් දෙවන කරුණ සම්බන්ධයෙන් සලකා බලා, වෙළඳපලෙන් පරිභෝජනයට සුදුසු ගුණාත්මකභාවයෙන් යුතු පොල්තෙල් පොල් සංවර්ධන අධිකාරියේ සහතිකය සමඟින් හඳුන්වාදීම මෙම නියමු ව්‍යාපෘතියෙන් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

වර්තමානයේ පොල්තෙල් නිෂ්පාදනායතන බොහොමයක් ඇසුරුම් කිරීමකින් තොරව පොල්තෙල් තොග වශයෙන් වෙළඳපොළට බෙදාහරින අතර, එම පොල්තෙල් වෙනත් තෙල් සමඟ මිශ්‍ර කිරීමේ හැකියාවක් පවතින බැවින් ඒවායේ තත්ත්වය පිළිබඳ ගැටළු පවතියි. එබැවින් එම ආයතන සහතික කිරීමේ ගැටළුවක් පවතියි. මෙයට පිලියමක් ලෙස නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 0.5ට වැඩි සියලුම පොල්තෙල් නිෂ්පාදනායතනවල නියාමන බලතල වැඩි කිරීම සඳහා 2024/08/21 දිනෙන් "දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීමට පියවර ගැනීම" යන මාතෘකාවෙන් නිකුත් කරන ලද කැබිනට් පත්‍රය ප්‍රකාරව අධිකාරියට බලය ලැබී ඇත.

මෙයට සමගාමීව ආරම්භ කරනු ලබන ව්‍යාපෘතිය මඟින් අධිකාරිය විසින් සහතික කරන ලද පොල්තෙල් ඇසුරුම් කර පාරිභෝගිකයා අතට පත් කිරීමට නිෂ්පාදකයා දිරිමත් කරනු ලැබේ. ඇසුරුම් කරනු ලබන පොල්තෙල් වල ගුණාත්මකභාවය නියමිත ප්‍රමිති පිරිවිතර හා ගැළපේද යන්න පරීක්ෂා කිරීම සිදු කරයි. එම ප්‍රතිඵල මත පදනම්ව උසස් තත්ත්වයෙන් යුතු පොල්තෙල් නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. ඒ සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් දේශීය පොල්තෙල් බවට තහවුරු කරන බවට වන සහතිකකරණ ලාංඡනයක් හඳුන්වාදීමට බලාපොරොත්තු වේ. පොල් සංවර්ධන අධිකාරියේ සහතිකකරණය යටතේ ලබාදෙනු ලබන එම ලාංඡනය වෙළඳපල ප්‍රචාරණ කටයුතු සඳහා නිෂ්පාදකයාට යොදා ගැනීමේ හැකියාවක් පවතියි. එමෙන්ම එම ලාංඡනය ලබාගැනීමේ අවශ්‍යතාවය මත අවසන් නිෂ්පාදිතය ඇසුරුම් කර වෙළඳපලට යොමු කිරීමට නිෂ්පාදකයා පෙළඹේ. මේ නිසා ගුණාත්මකභවින් යුතු, සහතිකකරණය කරන ලද ආරක්ෂිත නිෂ්පාදනයක් වෙළඳපලෙන් පාරිභෝගිකයාට ලබා ගැනීමේ හැකියාවක් ඇත. මෙහිදී අධිකාරිය විසින් සහතික කරන ලද සෑම පොල්තෙල් නිෂ්පාදනයක් සඳහාම අනුක්‍රමික අංකයක් හිමි වන අතර ආදර්ශ පරීක්ෂාවට මෙන්ම ආයතනය නිරන්තර පරීක්ෂාවටද ලක් වේ.

මීට අදාලව සිදු කිරීමට නියමිත ව්‍යාපෘතිය සහ ඊට අදාල නීති රීති සහ රෙගුලාසි සාකච්ඡා වට කිහිපයක් යටතේ සාකච්ඡා කර කෙටුම්පත් කරන ලදී. 2025 වර්ෂයේදී එහි රෙගුලාසි සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් අවසර ලබාගැනීමටත්, ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු කරගෙනයාමටත් බලාපොරොත්තු වේ.

ගුණාත්මක පොල්තෙල් නිෂ්පාදනය සම්බන්ධයෙන් කර්මාන්තකරුවන් දැනුවත් කිරීම

උසස් තත්ත්වයෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනය, පොල්තෙල් වල තත්ත්ව පරීක්ෂාවන්, පොල්තෙල් නිෂ්පාදනාගාරය තුළ පවත්වා ගත යුතු ගුණාංග, පොල්තෙල් නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පිලිබඳ දැනුවත් කිරීම, වෙළඳපලෙන් පරිභෝජනයට සුදුසු ගුණාත්මකභාවයෙන් යුතු පොල්තෙල් පාරිභෝගිකයා අතට පත් කිරීම සම්භන්ධයෙන් සහ අධිකාරිය විසින් හඳුන්වා දෙනු ලබන තරු පහ ලාංඡනය යන කරුණු ඇතුළත්වන ලෙස දැනුවත් කිරීමේ වැඩමුළු 06ක් ගාල්ල, ගම්පහ, පුත්තලම, හම්බන්තොට, කොළඹ සහ කළුතර යන දිස්ත්‍රික්ක වල සහ උතුරු පළාතේ පවත්වන ලදි. මේ සඳහා P-03 වැය ශීර්ෂය යටතේ රු.1,134,439/- ක මුදලක් වැය වී ඇත.

වැඩසටහන් මාලාවෙන් අපේක්ෂිත ප්‍රතිඵල:

- උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය යොදාගෙන නිෂ්පාදන කටයුතු සිදු කිරීමට පෙළඹවීම.
- වියලුම් යන්ත්‍ර භාවිතයෙන් පොල් වියලීම ප්‍රචලිත කිරීම
- තත්ත්වයෙන් උසස් සහ ගුණාත්මකභවින් ඉහල පොල්තෙල් වෙළඳපල සඳහා යොමු කිරීම.
- පොල්තෙල් නිෂ්පාදනායතනය තුළම ඇසුරුම් කිරීමට පෙළඹවීමට යොමු කිරීම තුළින් පොල්තෙල් කලවම් කර විකිණීමට අවස්ථා අහිමි කිරීම.

රූපය 1.2.3.4.5: දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක්









පොල්තෙල් ආදර්ශ තත්ත්ව පරීක්ෂාවන්

සෑම පොල්තෙල් ආදර්ශයක්ම පොල්තෙල් ආදර්ශ පරීක්ෂාවන් කර්මාන්ත ලියාපදිංචියේදී සිදු කරනු ලැබේ. මීට අමතරව අධිකාරියේ තරු 5 ලබාගත් ආයතන සහ වෙළඳපල පොල්තෙල් ආදර්ශයන් අහඹු ලෙස පරීක්ෂාවට ලක් කෙරේ. ඒ අනුව 2024 වර්ෂයේදී අධිකාරියේ ලියාපදිංචිවීමේදී පරීක්ෂක විසින් ලබාගත් ආදර්ශ 168ක් ද, අධිකාරියේ තරු 5 ලබාගත් ආයතන වලින් ලබාගත් ආදර්ශ 29 ක් ද, අහඹු ලෙස වෙළඳපලෙන් ලබාගත් ආදර්ශ 157ක් ද පරීක්ෂා කිරීම් වලට ලක් කර තිබුණි. ඒ අනුව P-03 ව්‍යාපෘතිය යටතේ පරීක්ෂා කල මුළු ආදර්ශ ගණන 354කි.

(i) පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරන පොල්තෙල් කර්මාන්තායතන වල ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

සැකසුම් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තායතන ලියාපදිංචි කිරීමේ වැඩසටහනේ අංගයක් ලෙස 2024 වර්ෂයේ අධිකාරියේ ලියාපදිංචි වන ආයතනවල නිෂ්පාදනය කරනු ලබන පොල්තෙල් වල ගුණත්වය මැන බැලීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ SLS 32: 2017 ට අනුරූපව පොල්තෙල් වල ඇෆ්ලටෝක්සින් අගය පරීක්ෂා කිරීම සඳහා ලියාපදිංචි කර්මාන්තායතන වලින් ආදර්ශ 168ක් උපයෝගී කරමින් විශ්ලේෂණ වාර්තා ලබා ගන්නා ලදී.

ඒ ඒ ආයතනවල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා පිරිවිතරයන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යනය කර නිවැරදි කරගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලද අතරඋ විශ්ලේෂිත තොරතුරු පදනම් කර ගනිමින් අදාල වැඩසටහනේ ඉදිරි කටයුතු 2025 දී සිදු කරගෙන යනු ලැබේ.

(ii) වෙළඳපොළේ අලෙවි කරනු ලබන පොල්තෙල් පරීක්ෂා කිරීම

වෙළඳපොළේ පරිභෝජනය සඳහා අලෙවි කරනු ලබන පොල්තෙල් වල ප්‍රමිතිය සොයා බැලීම සඳහා 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පොල්තෙල් නියැදි 157ක් පරීක්ෂා කරන ලදී.

ඒ අනුව 2024 වර්ෂයේදී වෙළඳපලේ අලෙවි කරන පොල්තෙල් අහඹු ලෙස ලබාගත් නියැදි වල පරීක්ෂණ වාර්තා අනුව තත්ත්වය පහත පරිදි වේ.

වගුව 6 : පොල්තෙල් විශ්ලේෂණ තොරතුරුවල සාරාංශය

	ප්‍රමාණය	ප්‍රතිශතයක් ලෙස
පරීක්ෂා කල නියැදි ගණන	354	-
ඇෆ්ලටෝක්සින් අඩංගු සම්පූර්ණ නියැදි ගණන	13	4%
ඇෆ්ලටෝක්සින් අඩංගු නොමැති නියැදි ගණන	343	96%

ඉහත නියැදි පරීක්ෂණ ප්‍රතිඵල අනුව වෙළඳපොලේ අලෙවි කරනු ලබන පොල්තෙල් වලින් 4%ක අනුමත ප්‍රමිති පරාසය ඉක්මවා ඇෆ්ලටෝක්සින් අඩංගු බව නිරීක්ෂණය වේ. මෙහිදී නාගරික ප්‍රදේශ වලින් බැහැර ග්‍රාමීය ප්‍රදේශ වල අලෙවි කරන පොල්තෙල්වල වැඩි වශයෙන් ඇෆ්ලටෝක්සින් අඩංගු වීම සැලකිය යුතු කරුණකි. 2023 හා 2024 වර්ෂවල මෙම විශ්ලේෂණ තොරතුරු හා 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහනේ ප්‍රතිඵල මත පදනම්ව, පොල්තෙල් නිෂ්පාදනය සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඒ අනුව ක්‍රියාත්මක වීමට අධිකාරිය අපේක්ෂා කරනු ලැබේ.

(iii) තරු 05 ලාංඡනය ලබාදීම සඳහා ආදර්ශ විශ්ලේෂණය

වෙළඳපොලේ අලෙවි කරනු ලබන ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් හඳුනාගැනීමත්, පොල්තෙල් කර්මාන්තායතන උසස් තත්ත්වයේ නිෂ්පාදන සිදුකිරීම උනන්දු කරවීම සඳහාත්, ඉලක්ක කර 2019 වර්ෂයේදී පොල් තෙල් සඳහා තරු 05 ලාංඡනය ලබාදීමට කටයුතු කරන ලදී.

රූපය 6 : ප්‍රමිතිගත පොල්තෙල් සඳහා ලබාදෙනු ලබන ලාංඡනය



මෙහිදී පරීක්ෂා කරනු ලබන නියැදි වල ප්‍රමිති පරාමිතීන්ට අමතරව නිෂ්පාදන ක්‍රියාවලිය ද පරීක්ෂාකර පහත පරිදි තරු 05 ලාංඡනය ලබාදීම සිදු කරයි.

1. පොල්තෙල් මුඩුවී නොමැති බව
2. වෙනත් තෙල් වර්ග සමඟ මිශ්‍ර නොකරන බව
3. අහිතකර ලෙස ඇෆ්ලටෝක්සීන් අඩංගු නොමැති බව
4. කිසිඳු රසායනික ද්‍රව්‍යයක් නිෂ්පාදනය සඳහා යොදා නොගන්නා බව
5. කර්මාන්තශාලාව සහ නිෂ්පාදන ක්‍රියාවලිය පොල් සංවර්ධන අධිකාරියේ නීතිරීති වලට අනුකූල බව (මෙහිදී පොල් මද වියලීම සඳහා වියලුම් යන්ත්‍ර භාවිතා කිරීම වැදගත් වේ.)

යන කරුණු මත සුදුසු කර්මාන්තශාලා හඳුනාගැනීම සිදු කරයි. ඒ අනුව මේ වනවිට ආයතන 17ක් තරු ලකුණු සහතිකය ලබා ඇති අතර, ලාංඡනය ලබාගත් ආයතන වල නිෂ්පාදනය කර ඇසුරුම් කරනු ලබන පොල්තෙල් සඳහා ලේබලයේ තරු ලාංඡනය භාවිතයට අවසර ලබාදී ඇත.

ඒ අනුව ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනයට නිෂ්පාදකයින් යොමු කරවීම හා ඒ මඟින් පොල්තෙල් කර්මාන්තය නඟාසිටුවීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලද, අවසන් පාරිභෝගිකයා අරමුණු කරගනිමින් වෙළඳපොලට නිකුත් කරනු ලබන පොල්තෙල්වල නිෂ්පාදන ක්‍රියාවලිය ද සැළකිල්ලට ගනිමින් සමස්ථ ප්‍රමිතිය පිළිබඳව තරු 5 කින් යුතු ප්‍රමිති සහතිකරණයකින් යුතු ලාංඡනයක් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය අබණ්ඩ ලෙස 2024 වසරේ ද ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, පාරිභෝගික සේවා අධිකාරිය හා පොල් සංවර්ධන අධිකාරිය යන ආයතන වලින් සැදුම්ලත් කමිටුව විසින් ආයතන පරීක්ෂාවන් සිදුකරන ලදී. එම ආයතන වල සිදුකලයුතු නිවැරදි කිරීම් පෙන්වාදෙන ලදී.

2024 වසරේ තරු 05 ලාංඡනය සඳහා නියැදි 29ක් පරීක්ෂා කරන ලදී. එමෙන්ම නියැදි පරීක්ෂාවන්ට අනුව ආයතන 2ක් තරු 05 ලාංඡනය සඳහා අයදුම්පත් සම්පූර්ණ කර ලබා දී ඇත.

8. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා පොලී ප්‍රතිදාන ලබා දීම තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව, "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය 2015.02.25 දින එම බැංකුව සමඟ අත්සන් කල අවබෝධතා ගිවිසුමක් මඟින් ආරම්භ කරන ලදි. ඒ අනුව පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචියට කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් ආකර්ෂණය කර ගැනීමට හා ඒ හරහා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කරා ලඟා කරවීම අරමුණු කර ගනිමින් අඩු පොලී සහන ණය යෝජනා ක්‍රමය පවත්වා ගෙනයනු ලැබේ. එහිදී පැවති යම් සංශෝධන හේතුවෙන් පෙර ගිවිසුම අවසන් කර 2020 ජූනි මස 04 දින නව අවබෝධතා ගිවිසුම අනුව ඉදිරි වර්ෂ 10 ක් සඳහා මෙම ණය යෝජනා ක්‍රමය පවත්වාගෙන යනු ලබයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය මඟින් සෘජුව කර්මාන්තකරුට 6%ක වාර්ෂික පොළියක් යටතේ ණය මුදල් ලබා දෙයි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගන්නා කර්මාන්තකරුවන් විසින් සෘජුව 6% ක වාර්ෂික පොළියක් යටතේ ණය වාරික බැංකුවට ගෙවන බැවින් එකී පොළිය අධිකාරියට තත්කාලීන වියදමක් නොවේ. එනමුත් මෙම ණය යෝජනා ක්‍රමය වෙතින් කර්මාන්තකරු බැංකුවට ගෙවන 6% ක පොළියෙන් අඩක් (3%) අධිකාරිය විසින් බැංකුවට ගෙවනු ලැබේ.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2020.06.04 දිනැතිව අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව එතෙක් ලබා දුන් රු. මිලියන 2.0 ක ණය මුදල රු. මිලියන 3.5ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව රු. මිලියන 2.0 ක් දක්වා ණය මුදල් ලබාගෙන තිබූ කර්මාන්තකරුවන් හට රු. මිලියන 3.5 ක් දක්වා වූ ඉතිරි ණය මුදල් ලබා දීමට 2020 වර්ෂය තුලදී කටයුතු කර ඇත. මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ ණය ලබා ගත් කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගුව 7: ණය යෝජනා ක්‍රමයේ සමස්ථ ප්‍රගතිය

වර්ෂය	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	
	ප්‍රතිලාභීන් ගණන	ලබා දුන් ණය මුදල රු. මිලියන
2020	11	11.80
2021	31	36.15
2022	24	41.89
2023	67	65.15
2024	06	16.00
එකතුව	**139**	**170.99**

වගුව 8: 2024 වසරේ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව)

2024.12.31 දිනට අධිකාරිය වෙත ලද අයදුම්පත් ගණන	39
2024 වසරේ ණය ලබා දී ඇති අයදුම්පත් ගණන	06
ඊට අදාළ ණය මුදල	16,000,000.00

මීට අමතරව මෙම ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සුදුසුකමක් ලෙස අධිකාරියේ ලියාපදිංචිය ද බලපාන බැවින් ණය ලබා ගැනීමේ අරමුණ ඇතිව නව ලියාපදිංචිකරුවන් ලෙස ලියාපදිංචියේ වර්ධනයක් ද ඇති වී ඇත. එනම් ණය යෝජනා ක්‍රමය මෙන්ම අනිකුත් සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්තකරුවන් අධිකාරියේ ලියාපදිංචිය සඳහා යොමු කිරීම ද වක්‍රාකාරව සිදුවේ.

මෙම වසරේදී ණය මුදල් ලබා දීමේදී පොල්තෙල් කර්මාන්තය වෙත අවධානය විශේෂයෙන් යොමු කරන ලදී. එහිදී පොල් වියළීමේ ක්‍රමවේදය පිළිබඳ සැලකූ ණය අයදුම්පත් විශ්ලේෂණය සඳහා පත් කරන ලද කමිටුව විසින් පොල්තෙල් කර්මාන්තය සඳහා ණය මුදල් නිර්දේශ කිරීමේදී වියළුම් යන්ත්‍ර මිලදී ගැනීමට පමණක් නිර්දේශ ලබා දෙන ලදී.

තවද, කොහු කර්මාන්තය සඳහා ද බැංකු ණය ලබාගැනීමේ වැඩි නැඹුරුතාවයක් මෙම වර්ෂයේදී දක්නට ලැබුණි. මෙම වර්ෂය තුළදී කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය තුළින් ණය මුදල් ලබා දීමේදී වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී.

එනම්,

- ණය අයදුම්පත් ඇගයීම් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. එකී කමිටුව මසකට වරක් රැස් වී අයදුම්පත් පරීක්ෂා කිරීම සිදු කරන අතර කමිටු නිර්දේශය මත ණය මුදල් ලබා දීම තීරණය කරයි
- ණය අයදුම්කරුවන්හට ණය මුදල් ලබා දීමේදී ව්‍යාපාර ලියාපදිංචි සහතිකය වසර 03 ක් තිබීම
- පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය වසරක් හෝ තිබීම
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය වසර 03 ට අඩු කර්මාන්තායන කමිටුව විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ණය මුදල් ලබා දීම
- නව කර්මාන්ත ආරම්භයට ණය මුදල් ලබා නොදීම
- වැනි වෙනස්කම් සිදු කරන ලදී.

"කප්රුක ජය ඉසුර - සුර්ය බලශක්ති" ණය යෝජනා ක්‍රමය

2024 වර්ෂයේදී මෙම කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය පවත්වාගෙන යන අතරතුර තවත් ණය යෝජනා ක්‍රමයක් ලෙස "කප්රුක ජය ඉසුර - සුර්ය බලශක්ති" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

අපනයනය කේන්ද්‍ර කරගත් පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් දිරිගන්වමින් ඔවුන්ගේ නිෂ්පාදනයන් හී තත්ත්වය උසස් කරලීම, කාර්යක්ෂමතාවය වර්ධනය, අන්තර්ජාතික වෙළඳපොළ සඳහා සුදුසු නිෂ්පාදනයන් එළිදැක්වීම සඳහා වැය වන පිරිවැය අවම කර ගැනීම අරමුණු කර ගනිමින් සූර්ය බල ශක්ති පද්ධති සවි කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පොල් සංවර්ධන අධිකාරිය එක්ව මෙම විශේෂ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ණය යෝජනා ක්‍රමයට අදාලව 2024 නොවැම්බර් මස 21 වන දින අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී. කර්මාන්තකරුවන් 20 දෙනෙකු සඳහා අවස්ථාව ලබා දෙන ලද අතර එක කර්මාන්තකරුවෙකු වෙත රු. මිලියන 10 ක් ලබා දෙන අතර වාර්ෂික පොළිය 6% ක් වේ.

එම ණය යෝජනා ක්‍රමය සඳහා පහත පරිදි සුදුසු කර්මාන්තකරුවන් තෝරා ගන්නා ලදී.

- පොල් සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවියේ දැන්වීම් පල කරන ලද අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවන ලදී.
- එම අයදුම්පත් අතරින් සුදුසුකම්ලත් කර්මාන්තකරුවන් කමිටුවක් විසින් තෝරා ගත් අතර ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාවයන් හා අපනයන විස්තර ලබා ගන්නා ලදී.
- එමඟින් ද තෝරා ගනු ලැබූ කර්මාන්තකරුවන්ගේ වසර 3 ක විගණන කල ගිණුම් විස්තර ලබාගන්නා ලදී.
- එකී විස්තර ලබා දුන් කර්මාන්තකරුවන් 13 දෙනෙකු සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

9. පොල් ආශ්‍රිත නව නිෂ්පාදන පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම

2024 වර්ෂයට අදාලව සැකසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්මට ඡ-5 යටතේ ආර්ථික වටිනාකමින් වැඩි පොල් ආශ්‍රිත නිෂ්පාදන හඳුනාගැනීම සහ අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම බලාපොරොත්තු විය. ඒ සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන කරනු ලබන ව්‍යවසායකයන් හඳුනාගෙන එම ව්‍යවසායකයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙම දැනුවත් කිරීම අදියර 02 ක් යටතේ සිදු කරන ලදී. පහත සඳහන් නිෂ්පාදන දෙක සඳහා න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුව ද සහිතව පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව සිදු කරන ලදී.

1. නාටාඩි කොකෝ

පොල් වතුර උපයෝගී කර ගනිමින් සිදු කල හැකි අගය වැඩි කල නිෂ්පාදනයක් වන නටාඩි කොකෝ අනුපුරක ආහාරයකි. මේ සඳහා ජාත්‍යන්තර වෙළඳපොල තුළ විශාල ඉල්ලුමක් මෙන්ම ඉහල අගයකින් යුතු නිෂ්පාදනයකි. දැනට පොල් කර්මාන්තය තුළ ප්‍රයෝජනයට නොගෙන නාස්ති වන පොල් වතුර කාර්යක්ෂමව පොල් කර්මාන්තය සඳහා භාවිතා කිරීම අපේක්ෂාව වේ.

2. පොල් අයිස් ක්‍රීම්

පොල් කිරි අමුද්‍රව්‍ය කර ගනිමින් අයිස් ක්‍රීම් නිෂ්පාදනය සිදු කිරීම සඳහා කටයුතු සිදු කරන ලදී. වෙළඳපොල තුළ පොල් අයිස් ක්‍රීම් කලාතුරකින් දැකිය හැකි නමුත් නිවැරදි තාක්ෂණය භාවිතය අඩු කමින් ගුණාත්මකභවින් අඩු නිෂ්පාදන නිරීක්ෂණය විය. එම තත්ත්වය ද මඟහරවා ගනිමින් තාක්ෂණය නිවැරදිව භාවිතා කරමින් රසවත් සහ ගුණාත්මකව සිදු කිරීම සඳහා ව්‍යවසායකයන් දැනුවත් කිරීම සිදු කරන ලදී.

රූපය 7: පවත්වන ලද පුහුණු වැඩසටහන් කීපයක්







10. අවිධිමත් කර්මාන්ත සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා පුහුණු වැඩසටහන්, තාක්ෂණික නුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, උපකරණ ලබා දීම, නිෂ්පාදන ගැණුම්කරුවන් සම්බන්ධ කිරීම හා පසු විපරම් කිරීම

පොල් ආශ්‍රිත නිෂ්පාදන විධිමත්ව සහ අවිධිමත්ව සිදු කරනු ලබන අතර, නිෂ්පාදන තුළින් ලබන අපනයන ආදායමින් 10% ක පමණ ප්‍රමාණයක් අවිධිමත්ව සිදු කරනු ලබන නිෂ්පාදන වලින් ලබා ගනී.

අවිධිමත්ව පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සිදු කිරීම මගින්, ගුණාත්මකභවෙන් අඩු නිෂ්පාදන සිදු කිරීම මෙන්ම අමුද්‍රව්‍ය නාස්ති වීමක් සිදු වේ. එම තත්ත්වය අවම කිරීමේ අරමුණින් සහ ග්‍රාමීය ආර්ථිකය නංවාලීමේ අරමුණ ඇතිව ඒ ඒ ප්‍රදේශ වල පොල් ආශ්‍රිත නිෂ්පාදන ආරම්භ කිරීමේ ඇති විභවතාවය සලකා බලා පොල් ආශ්‍රිත නිෂ්පාදන ඒකක ස්ථාපනය කිරීම සිදු කරන ලදී.

ඒ අනුව, ඒ ඒ ප්‍රදේශ වල ගෘහස්ථව සිදු කල හැකි තවාෂි බුරුසු, ඉදල් හා කොසු, කොහු ලණු, ආදී නිෂ්පාදන පිළිබඳව ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත්වන අඩු ආදායම්ලාභීන් තෝරා ඔවුන් අතරින් පොල් නිෂ්පාදන සිදු කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් සඳහා එම නිෂ්පාදනය පිළිබඳව තාක්ෂණික දැනුම ලබා දී කණ්ඩායම් ගත කර ගැනුම්කරුවෙකු සම්බන්ධ කර එම ව්‍යාපෘති සිදු කරන ලදී.

ඒ අනුව, පහත සඳහන් දිස්ත්‍රික්ක 12 ක ප්‍රතිලාභීන් 590 ක් සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් පවත්වමින් නිෂ්පාදන වල ගුණාත්මක බව රැකගැනීම සඳහා කටයුතු කරන ලදී.

- රත්නපුර
- කුරුණෑගල
- අම්පාර
- කිලිනොච්චි
- ගාල්ල
- ගම්පහ
- මාතර
- කළුතර
- පුත්තලම
- මොණරාගල
- හම්බන්තොට
- යාපනය

රූපය 8,9,10,11: ඉදල් හා කොසු නිෂ්පාදනය









රූපය 12,13: පාපිසි නිෂ්පාදන තාක්ෂණික හුවමාරු වැඩසටහන





රූපය 14,15 : තවාමි බුරුසු නිෂ්පාදන තාක්ෂණික හුවමාරු වැඩසටහන





රූපය 16,17 : පොල් කටු ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදන තාක්ෂණික හුවමාරු වැඩසටහන





රූපය 18,19 : පොල් ආශ්‍රිත රසකැවිලි හා අයිස් ක්‍රීම් නිෂ්පාදන තාක්ෂණික හුවමාරු වැඩසටහන





පාසල් සිසුන් අතර පොල් කටු, සහ පොල් ලෙලි එකතු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අපතේ යන පොල් කටු හා පොල් ලෙලි, කර්මාන්ත කරා යොමු කිරීමේ අරමුණින් හා පොල් කටු නිසි ලෙස බැහැර නොකිරීමෙන් ඇතිවන පරිසර ගැටළු අවම මට්ටමක පවත්වාගැනීම සඳහා පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 18ක් මාතර දිස්ත්‍රික්කය කේන්ද්‍රය කරගනිමින් පවත්වන ලදී. මෙහිදී දිස්ත්‍රික්කයේ පාසල් 18ක පරිසර කව හා සම්බන්ධවී පාසල් ළමුන් දැනුවත් කිරීම හා ඔවුන් මගින් පොල්කටු එකතු කිරීමට ක්‍රමවේද සකස් කරන ලදී.

රූපය 20,21,22,23 : පොල්කටු එකතු කිරීම සම්බන්ධව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්









02. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

රසායනාගාර පරීක්ෂණ සිදුකිරීම මගින් පොල් නිෂ්පාදන අපනයන තොගවල තත්ත්වය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි රසායනාගාර පරීක්ෂණ සිදුකරදීම, ජාත්‍යන්තරව පිළිගත් උසස් රසායනාගාර පරීක්ෂණ සේවාවක් සැපයීම සඳහා ISO 17025 ප්‍රතීතන තත්ත්වයට අදාල කාර්යයන් පවත්වාගෙන යාම, විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් සඳහා රසායනාගාර කාර්ය මණ්ඩලය යොමුකිරීම, මාසික සැලැස්මක් යටතේ ජංගම රසායනාගාර සේවාව පවත්වාගැනීම තුළින් දිසිදි පොල් නිෂ්පාදනායතනයන්හි නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම, ආදර්ශ පරීක්ෂා කිරීම සහ ප්‍රමිති අවශ්‍යතා පිළිබඳව උපදෙස් දීම, කර්මාන්තයේ අවශ්‍යතාව පරිදි විෂගතවූ ස්ථාන හඳුනාගැනීමේ පරීක්ෂණ (swab) සිදුකිරීම සහ අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය විසින් සිදුකරන පොල් නිෂ්පාදනාගාර නියාමනය කිරීමේ කාර්යය යටතේ රැස්කරනු ලබන විවිධ පොල් නිෂ්පාදන ආදර්ශ සඳහා රසායනාගාර පරීක්ෂණ සිදුකරදීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. මෙම කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂිකව සකස්කල ක්‍රියාකාරී සැලැස්මක් අනුව කටයුතු කරනු ලැබේ.

තත්ත්ව පාලන අංශයේදී පරීක්ෂා කරනු ලබන සියළුම ආදර්ශ සැකසුම් සංවර්ධන අංශය විසින් රසායනාගාර වෙත යොමුකරන අතර, ජංගම රසායනාගාරයෙන් රැගෙන එන ආදර්ශ ද සැකසුම් සංවර්ධන අංශයට යොමුකරනු ලැබේ. පරීක්ෂණ සිදුකිරීමෙන් පසු සියළුම පරීක්ෂණ වාර්තා සැකසුම් සංවර්ධන අංශය වෙත යොමුකරනු ලබන අතර එම අංශය විසින් අදාල පාර්ශ්වයන් වෙත එකී වාර්තා බෙදා හරිනු ලැබේ. නියාමන ආදර්ශයන්හි ප්‍රතිඵල අනුව හඳුනාගන්නා ලද ප්‍රමිති අඩුපාඩු පිළිබඳව සැකසුම් සංවර්ධන අංශය දැනුවත් වන අතර පොල් නිෂ්පාදන කර්මාන්තයේ අඩුපාඩු මඟහරවා ගනිමින් නිෂ්පාදන කාර්යයන් විධිමත්ව සිදුකිරීමට අවශ්‍ය උපදෙස්, සැකසුම් සංවර්ධන අංශය විසින් එවැනි පාර්ශවකරුවන් වෙත ලබාදීම සිදුකරයි.

තත්ත්ව පාලන අංශය විසින් ඉහත කී පරීක්ෂණ කටයුතුවලට අමතරව අවශ්‍යතාව පරිදි සෙසු කාර්යයන් සඳහා ද සහභාගී වන අතර පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හී වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්ද වැඩමුළු සහ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම, ප්‍රතිඅපනයන තොග පරීක්ෂා කිරීම සඳහා කර්මාන්තශාලා අවශ්‍යතාව පරිදි නිරීක්ෂණය, වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම සහ දැනට ප්‍රමිතීන් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධවී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධිකාරියේ ප්‍රමිති සැකසීමේ කාර්යයන් සඳහා සහභාගිවීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හී සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ඉල්ලීම් පරිදි අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා කාර්මික පුහුණු අවස්ථා සැපයීම සහ තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා දායකත්වය ලබාදීම සහ ඉල්ලීම් පරිදි දින 60-90 දිසිදි ආදර්ශ පරීක්ෂා කිරීම යනාදිය අංශය විසින් සිදුකර ඇත.

ඉහත කී සියළු කාර්යයන් තුළින් 2024 වසරේදී තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් ලබා ඇති ප්‍රගතිය විස්තරාත්මකව පහත ඉදිරිපත් කර ඇත.

Q1. අපනයනය සහ දේශීය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හී තත්ත්වය සහතික කිරීම

මෙරට පවතින සියළුම දිසිදි පොල් නිෂ්පාදනාගාර පොල් සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති අතර ඒවාහි දෛනිකව සිදුකරන දිසිදි නිෂ්පාදනයන්ගෙන් රැස්කර තත්ත්ව පාලන අංශයට සපයනු ලබන ආදර්ශ සඳහා සැල්මොනෙල්ලා පරීක්ෂාව සහ භෞතික පරීක්ෂණ 8ක් බැගින් රසායනාගාරයේදී පරීක්ෂා කෙරේ. දිසිදි පොල් අපනයනයේදී රේගුවෙන් නිදහස් කිරීම සඳහා මෙම පරීක්ෂණ වාර්තා අනිවාර්යය වන බැවින් ඉහල ප්‍රමුඛත්වයක් ලබාදී මෙම දෛනික දිසිදි ආදර්ශ පරීක්ෂා කිරීම සිදුකරනු ලැබේ.

පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයි.


A. පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම

- **දිසිදි පොල්**


වගුව 9: දිසිදි පොල්වල පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම

වර්ෂය	ඉලක්කය ආදර්ශ	ප්‍රගතිය ආදර්ශ	ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	සැල්මොනෙල්ලා විෂගතවීමේ ප්‍රතිශතය
2023	5000	7386	148%	0.83 (61 ආදර්ශ)
2024	7000	7733	110%	0.43 (33 ආදර්ශ)

ප්‍රස්තාරය 01: දිසිදි නිෂ්පාදන හා ආදශර් ලැබීම



ප්‍රස්තාරය 02: දිසිදි පොල් දෛනික ආදශර්යන්හි සැල්මොනෙල්ලා විෂගතවීම




● කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන

වගුව 10: කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වල පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම

වර්ෂය	ඉලක්කය ආදර්ශ	ප්‍රගතිය ආදර්ශ	පරීක්ෂණ ගණන	ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	විෂගතවීමේ ප්‍රතිශතය (%)	
					සැල්මොනෙල්ලා	ඊ-කෝලයි
2023	1500	1546	1957	103%	1.29 (04 ආදර්ශ)	0.13 (02 ආදර්ශ)
2024	1500	1682	2064	112%	3.31 (12 ආදර්ශ)	1.38 (05 ආදර්ශ)


ප්‍රස්ථාරය 03: කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ක්ෂුද්‍රජීවී පරීක්ෂාව



B. දිසිඳි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරීක්ෂා සිදුකිරීම සහ සහතික කිරීම

දිසිඳි පොල් හි වර්ණයඋ වර්ග කිරීමඋ තෙතමනයඋ රසඋ සුවඳඋ අපද්‍රව්‍යඋ කුරුටුඋ තෙල් බෙරීම යන භෞතික හා සංවේදි පරීක්ෂා ලෙස පරීක්ෂණ සිදුකර ඇති

ප්‍රස්ථාරය 04: දෛනික දිසිඳි පොල් නිෂ්පාදනයන්හි භෞත රසායනික පරීක්ෂාව



වගුව 12: දෛනික දිසිදි පොල් නිෂ්පාදනයන්හී භෞත රසායනික පරීක්ෂාව

වර්ෂය	ඉලක්කය ආදර්ශ	ප්‍රගතියආදර්ශ	පරීක්ෂණ ගණන	ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	තත්ත්ව දෝෂ වාර්තාවීම
2023	5000	7507	60056	150%	6.15 (462 ආදර්ශ)
2024	7000	7910	63280	113%	5.95 (471 ආදර්ශ)

තත්ත්ව දෝෂ වාර්තා වීම පරාමිතිය අනුව දැක්වීම

වගුව 12: තත්ත්ව දෝෂ වාර්තා වීම පරාමිතිය අනුව දැක්වීම

පරාමිතිය	එකඟ නොවූ ආදර්ශ	
	ගණන	%
වර්ණය	62	13.2
තෙල් බේරීම	13	2.8
දැවුනු කැබලි	57	12.1
තෙතමනය	30	6.4
බාහිර අපද්‍රව්‍ය	11	2.3
කුරුටු	143	30.4
වර්ග කිරීම	219	46.5
රස හා සුවඳ	134	28.5

(ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් ප්‍රමිතිය හා එකඟ නොවී ඇති)

Q2. පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම

රසායනාගාර පරීක්ෂණ සේවා අවශ්‍ය වන ඉල්ලුම්කරුවන් විසින් අධිකාරිය වෙත ආදර්ශ භාරදී සැකසුම් සංවර්ධන අංශය හරහා පරීක්ෂණ ඉල්ලුම් කරනු ලැබේ. අවශ්‍ය පරාමිතීන්ට අනුව ක්ෂුද්‍රජීවී, රසායනික, භෞතික සහ සංවේදි පරීක්ෂා මේ යටතේ සිදු කෙරේ.


මීට අමතරව, පොල් නිෂ්පාදන අපනයන ප්‍රතික්ෂේප වීම මත විදේශයන්ගෙන් මෙරටට නැවත හරවා එවා ඇති පොල් නිෂ්පාදන නැවිගත තොග සහ දේශීය හා විදේශීය පැමිණිලි මත ඉල්ලුම්කරනු ලබන ආදර්ශ පරීක්ෂා කිරීම ඉල්ලීම් පරිදි සිදුකෙරේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ ප්‍රජාව සහ අපනයනකරුවන් ආදී වූ ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව ලබාදේ.

වගුව 13: පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම

වර්ෂය	ඉලක්කය ආදර්ශ	ප්‍රගතිය ආදර්ශ	පරීක්ෂණ ගණන	ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
2023	700	1094	1917	156%
2024	1000	1337	4138	134%

මේ යටතේ පරීක්ෂා කල සියළුම ආදර්ශ වර්ග පහත දැක්වේ

ප්‍රස්ථාරය 05: පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරීක්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගැනීම



ඉල්ලුම්කරුවන් විසින් රසායනාගාර පරීක්ෂණ සේවාව ලබා ගැනීම සඳහා ආදර්ශ යොමුකර ඇති ආකාරය

වගුව 14: පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම

නිෂ්පාදන වර්ගය (ආදර්ශ ප්‍රමාණය)	2020	2021	2022	2023	2024
දිසිඳි පොල්	08	11	06	42	02
පුන්නක්කු	03	14	11	05	04
පොල් තෙල්	335	411	301	269	53
කොප්පරා	--	--	01	01	03
මද වශයෙන් මේදය ඉවත් කරන ලදි දිසිඳි පොල්	51	22	25	61	22
පොල් ක්‍රීම්/ කිරම	03	03	03	02	--
පිටි කල පොල්	02	--	--	02	--
පොල් කිරි	03	--	03	26	04
පොල් නොවන ආදර්ශ	04	01	01	--	--
දිසිඳි පොල් ආදර්ශයන්හි ඇෆ්ලටොක්සින් හා සල්ෆර් ඩයොක්සයිඩ්	453	300	232	238	
තැඹිලි වතුර	290	6	1	6	4
පොල් වතුර	05	06	01	06	04
ගෙඩි පොල්	--	04	01	--	01
ආනයනික පොල් මද	--	01	--	--	--
පොල් කටු අඟුරු	--	03	--	--	--
පොල් සීනි	--	02	02	07	--
විනාකිරි	--	--	--	06	--
දෛනික දිසිඳි පොල්හි - සල්ෆර් ඩයොක්සයිඩ් පරීක්ෂාව	--	--	--	02	--
ප්‍රති අපනයනය සඳහා යොමුවන නිෂ්පාදන ආදර්ශ - (TIEP) -පොල් තෙල්	--	--	--	135	279
ප්‍රති අපනයනය සඳහා යොමුවන නිෂ්පාදන ආදර්ශ - (TIEP) -පොල් සිනි	--	--	--	249	575
ප්‍රති අපනයනය සඳහා යොමුවන නිෂ්පාදන ආදර්ශ - (TIEP) -පොල් වතුර	--	--	--	--	25
ප්‍රති අපනයනය සඳහා යොමුවන නිෂ්පාදන ආදර්ශ - (TIEP) - දිසිඳි පොල්	--	--	--	--	04

නිෂ්පාදන වර්ගය (ආදර්ශ ප්‍රමාණය)	--	--	--	--	**03**
Organic Coconut Amino	--	--	--	--	51
පොල් බටර්	--	--	--	--	01
පොල් පැණි	--	--	--	--	01
පොල් සිරප්	--	--	--	--	08
නැවත හරවා එවා ඇති නැව් ගත තොග - පොල් තෙල්	--	--	--	02	
නැවත හරවා එවා ඇති නැව් ගත තොග - පොල් කිරි	--	--	--	37	03
නැවත හරවා එවා ඇති නැව් ගත තොග - පිටිකල පොල් කිරි	--	--	--	01	--
නැවත හරවා එවා ඇති නැව් ගත තොග -පොල් ක්‍රීම්	--	--	--	02	--
නැවත හරවා එවා ඇති නැව් ගත තොග - කොහු බත්	--	--	--	01	--
නැවත හරවා එවා ඇති නැව් ගත තොග - දිසිඳි පොල්	--	--	--	--	04
පරීක්ෂා කර ඇති සම්පූර්ණ ආදර්ශ ගණන	867	778	587	1094	1337
සිදුකර ඇති මුළු පරීක්ෂණ ගණන	**1521**	**1571**	**1185**	**1917**	**4138**

Q3. A) ISO/IEC 17025:2017 ප්‍රතීතන තත්ත්වයට අදාල කාර්යයන්

පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මගින් නිකුත් කරනු ලබන පරීක්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමාණුකූලව සිදුකිරීම සඳහා, ISO/IEC 17025:2017 ප්‍රතීතන තත්ත්වයට අදාල කාර්යයන් අංශයෙහි පවත්වා ගෙන යනු ලැබේ.

ඒ අනුව වාර්ෂිකව උපකරණ ක්‍රමාංකනය කිරීම, වාර්ෂිකව උපකරණ සේවා කිරීම, ජාත්‍යන්තර හා දේශීයව වෘත්තීය නිපුණතාවය පරීක්ෂා කිරීම වෘත්තීමය කුසලතා ඇඟයීමේ පරීක්ෂණ සඳහා පෙනී සිටීම, (Inter laboratory, Intra laboratory Proficiency Test) අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් සිදුකරනු ලබන ඇඟයීම් සඳහා පෙනී සිටීම යනාදී ප්‍රතීතන තත්ත්වය පවත්වා ගැනීමට අදාල වූ කාර්යයන් සිදුකර ඇත.

ප්‍රතීතන තත්ත්වය සඳහා රසායනාගාරයන්හි කටයුතු පවත්වා ගැනීමේ සතුටුදායක තත්ත්වය තක්සේරු කිරීමෙන් අනතුරුව 2026 ජුනි මස දක්වා ප්‍රතීතන තත්ත්වය රසායනාගාර සඳහා ප්‍රදානය කර ඇත.

2012 වසරේදී ආරම්භ කරනු ලැබූ ISO/IEC 17025/2017 ප්‍රතීතන තත්ත්වය ලබා ගැනීමේ වැඩසටහන ක්‍රමක්‍රමයෙන් පුළුල් කර ඇති අතර 2024 වසර වනවිට පහත දක්වා ඇති පරීක්ෂණ සඳහා ප්‍රතීතන තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර ඇත.

මේවන විට සමස්ථ වශයෙන් පොල් නිෂ්පාදන 13ක පරීක්ෂණ වර්ග 12ක් සඳහා ISO/IEC 17025/2017 ප්‍රතීතන තත්ත්වය හිමිකර ගෙන ඇත.

වගුව 15: පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රතීතන තත්ත්වය හිමිකර ගෙන ඇති පරීක්ෂණ වර්ග

	Product	Types of tests that have acquired Accreditation Status
1	පොල් තෙල්	දිලීර හා පුස් ණීෆ සම්පූර්ණ සනාවාස සංඛ්‍යාවඃ සැපොනිකරණ අගය, අයඩින් අගය, නිදහස් මේද අම්ල ප්‍රමාණය
2	දිසිඳි පොල්	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාවඃ දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
3	මේදය තරමක් ඉවත් කල දිසිඳි	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
4	පොල් කිරි	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
5	පිටිකල පොල් කිරි	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
6	පොල් කිරි ආශ්‍රිත නිෂ්පාදන	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
7	පොල් චතුර	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
8	කොහු බත් උපස්ථර	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
9	කොප්පරා	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
10	ගෙඩි පොල්	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්, සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව
11	පානීය ජලය	කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, ක්ලෝරයිඩ්, ජලයේ මුළු කඨිනත්වය, කැල්සියම්, මැග්නිසියම්
12	පොල් තලප	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්
13	පොල් ක්‍රීම්	සැල්මොනෙල්ලා, කෝලිෆෝම් සංඛ්‍යාව, ඊ-කෝලයි සංඛ්‍යාව, දිලීර හා පුස්

රූපය 24 :SLAB සහතික පත

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Chemical and Microbiology Laboratories
Quality Control and Quality Assurance Division
Coconut Development Authority

having being found to comply with the accreditation criteria for testing laboratories as described in ISO / IEC 17025: 2017, has been accredited as a Testing Laboratory under the field of

Chemical and Biological Testing

and has been assigned the accreditation number

TL 30-01

This certificate is issued on 30 June 2023 and is valid until

29 June 2026

The accreditation was granted for the first time to Chemical Laboratory on 12 June 2012 and to Microbiology Laboratory on 28 October 2015

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Director/CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

B) පුහුණු වැඩසටහන් පැවැත්වීම

තත්ත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO/IEC ප්‍රතිතන තත්ත්වයේ කටයුතු සඳහා සහ කාලීනව සංශෝධනය කර ඇති පොල් නිෂ්පාදන පරීක්ෂා කිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාර සේවක පිරිස වෙත ලබාදී ඇත. වාර්ෂික සැලැස්මට අනුව පහත පරිදි ප්‍රගතිය ලබා ඇත.

වගුව 16: තත්ත්ව පාලන අංශයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම

	පුහුණු වැඩසටහන	පුහුණුව පැවැත්වූ ආයතනය	සහභාගිවූ සාමාජිකයන් ගණන
1	අවිනිශ්චිතතාවය රසායනික අංශ පිළිබඳ මිනුම්	UNIDO – (ගාස්තු රහිත)	04
2	අවිනිශ්චිතතාවය ක්ෂුද්‍රජීව විද්‍යාත්මක අංශ පිළිබඳ මිනුම්	UNIDO – (ගාස්තු රහිත)	04
3	ක්‍රම වලංගුකරණය සහ සත්‍යාපනය	UNIDO - (ගාස්තු රහිත)	06
4	උපකරණ ක්‍රමාංකනය සහ අවදානම් කළමනාකරණය	UNIDO - (ගාස්තු රහිත)	06
5	අපජලය (BOD, COD, TSS, TDS, තෙල් සහ ග්‍රීස්) සහ පානීය ජලය පරීක්ෂා කිරීම (ක්ෂාරීයතාව, සම්පූර්ණ ඇමෝනියා, නයිට්‍රේට් සහ නයිට්‍රයිට්) පිළිබඳ පුහුණුව	UNIDO - (ගාස්තු රහිත)	07
6	ඇෆ්ලැටොක්සින් සහ PAH විශ්ලේෂණය	UNIDO - (ගාස්තු රහිත)	10
7	වැඩමුළුව - ගෑස් වර්ණදේහ විද්‍යාව සහ GCMS යෙදුම් ප්‍රායෝගික අත්දැකීම්	ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානය	02
8	ක්‍රම වලංගුකරණය පිළිබඳ පුහුණුව - රසායනික විශ්ලේෂණය	කාර්මික තාක්ෂණ ආයතනය (ITI)	06

Q4. අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය සුරක්ෂිත කිරීම

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමිතියානුකූල තත්ත්වය පරීක්ෂණාත්මකව නිර්ණය කිරීම සඳහා මාසිකව සැලසුම්කල වැඩසටහනකට අනුව ජංගම රසායනාගාරය භාවිතා කරමින් ආදර්ශ රැස්කිරීම, කර්මාන්තශාලා පරීක්ෂා කිරීම සහ ප්‍රමිතිය පවත්වා ගැනීමට අදාල උපදේශකත්වය සැපයීම මේ යටතේ සිදුකරනු ලැබේ. එම අවස්ථාවේදීම සිදුකරනු ලබන දිසිදි නිෂ්පාදනයෙන් ආදර්ශ රැස්කිරීම මාසිකව සිදුකරනු ලැබේ. මාස 6කට වරක් දිසිදි පොල් නිෂ්පාදනාගාරයක් ආවරණය වන පරිදි සැලැස්මක් අනුව පොල් සේදීමට ගන්නා ජලය පරීක්ෂා කිරීම සිදුකරයි.

වගුව 17: අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය

කාර්යය	2023				2024			
	ඉලක්ක ආදර්ශ	ප්‍රගතිය ආදර්ශ	පරීක්ෂණ ගණන	ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය	ඉලක්ක	ප්‍රගතිය	පරීක්ෂණ ගණන	ආදර්ශ ප්‍රමිතියෙන් අපගමනය වීමේ ප්‍රතිශතය
1.) දිසිදි ආදර්ශ පරීක්ෂා කිරීම	250	326 (130%)	1189	85%	250	327 (131%)	1097	84%

ප්‍රමිතියෙන් අපගමනය වීම % පරාමිතීන් අනුව (ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් අසමත්වී ඇත.)

පරාමිතිය	2023	2024
ඊකෝලි පැවතීම	25%	12%
කොලිෆෝම් ප්‍රමිතිය ඉක්මවා යාම	19%	14%
සම්පූර්ණ ඝනාවාස සංඛ්‍යාව ප්‍රමිතිය ඉක්මවා යාම	83%	84%
සල්ෆර්ඩයොක්සයිඩ් ප්‍රමිතිය ඉක්මවායාම	0.3%	0.3%

2) පොල් සේදීමට ගන්නා ජලය පරීක්ෂා කිරීම	100	85 *	850	48%	100	93	930	41%

* දිසිඳි පොල් නිෂ්පාදනාගාර ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබීම හේතුවෙන් ප්‍රගතිය අඩුවී ඇත.

ප්‍රමිතියෙන් අපගමනය වීම % පරාමිතීන් අනුව (ඇතැම් ආදර්ශ පරාමිතීන් කිහිපයකින් අසමත්වී ඇත)

පරාමිතිය	2023	2024
ක්ෂුද්‍රජීවී පරීක්ෂණ		
සැල්මොනෙල්ලා පැවතීම	3%	2%
ඊ-කෝලි පැවතීම	11%	16%
සම්පූර්ණ ඝනාවාස සංඛ්‍යාව ප්‍රමිතිය ඉක්මවායාම	අපගමනය වී නැත	අපගමනය වී නැත
රසායනික පරීක්ෂණ		
වර්ණය ප්‍රමිතිය ඉක්මවා යාම	අපගමනය වී නැත	අපගමනය වී නැත
නිදහස් ක්ලෝරීන් අවශේෂ ප්‍රමිතිය ඉක්මවායාම	අපගමනය වී නැත	අපගමනය වී නැත
ක්ලෝරයිඩ් ප්‍රමිතිය ඉක්මවායාම	3%	2%
සම්පූර්ණ කඨිනත්වය ප්‍රමිතිය ඉක්මවා යාම	3%	6%
pH නොගැළපීම	29%	2%
සම්පූර්ණ පෝස්පෙට් ප්‍රමිතිය ඉක්මවායාම	8%	13%
සම්පූර්ණ යකඩ ප්‍රමිතිය ඉක්මවා යාම	අපගමනය වී නැත	අපගමනය වී නැත

ක්ෂේත්‍ර රාජකාරි වාර ගණන			
ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
400	400	400	493

විශගතවීම සිදුවීමේදී කර්මාන්තශාලාවන්හි swab පරීක්ෂණ සිදුකිරීම

වගුව 18: අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය

	කාර්යය	පරීක්ෂා කිරීමේ ප්‍රගතිය (ආදර්ශ)	ප්‍රමිතියෙන් අපගමනය වීම %
1	M- 64 රත්කරවූ දිසිඳි සහ පොල්තෙල් මෝල	15	සැල්මොනෙල්ලා පැවතීම - 7 %

Q5. සැකසුම් සංවර්ධන අංශයේ නියාමන කාර්යයන්ට අදාලව පොල් නිෂ්පාදන විශ්ලේෂණය

පොල් නිෂ්පාදන කර්මාන්තශාලා නියාමනය කිරීමේ ක්‍රියාකාරකම යටතේ සැකසුම් සංවර්ධන අංශය විසින් පොල් නිෂ්පාදන ඒකකයන්ගෙන් ආදර්ශ රැස්කර රසායනාගාර පරීක්ෂණ සිදුකිරීම සඳහා යොමුකරනු ලැබේ. මෙම ආදර්ශ පරීක්ෂාකර වාර්තා නිකුත් කරනු ලැබේ. එහිදී, ප්‍රමිතියෙන් අපගමනය වන නිෂ්පාදන පිළිබඳව පරීක්ෂකවරුන් දැනුවත් වන අතර ඔවුන් විසින් කර්මාන්තකරුවන් දැනුවත් කරමින් පොල් නිෂ්පාදන ආයතනයන්හි අඩුපාඩු සකසා ගනිමින් උසස් තත්ත්වයේ නිෂ්පාදන බිහිකිරීමට අවශ්‍ය මඟපෙන්වීම මෙවැනි ආදර්ශ පරීක්ෂා කිරීමෙන් අපේක්ෂා කෙරේ.

වගුව 19: සැකසුම් සංවර්ධන අංශයේ නියාමන කාර්යයන්ට අදාලව පොල් නිෂ්පාදන විශ්ලේෂණය

නිෂ්පාදනය		2023			2024		
		ඉලක්ක ආදර්ශ	ප්‍රගතිය ආදර්ශ	පරීක්ෂණ ගණන	ඉලක්ක ආදර්ශ	ප්‍රගතිය	පරීක්ෂණ ගණන
1	i. පොල් තෙල් නිෂ්පාදනාගාරයන්ගෙන් රැස්කල ආදර්ශ	200	19 (60%)	57	200	30 (91%)	90
	ii. වෙළඳපල පොල්තෙල		101	303		151	453
2	නැවුම් පොල්තෙල්	50	74 (148%)	370	50	67 (134%)	335
3	කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන	120	59 (49%)	354	150	168 (112%)	873
4	පොල් කිරි	80	74 (125%)	222	80	79 (136%)	237
	පිටිකල පොල් කිරි		26	104		30	120
5	පොල් කටු අඟුරු	20	1 (5%)	3	20	12 (60%)	36
6	මද වශයෙන් මේදය ඉවත් කල දිසිදි පොල්	120	97 (81%)	485	120	100 (83%)	500
7	පොල්තෙල් (ලියාපදිංචියේදී ඇෆ්ලටොක්සින් පරීක්ෂා)	120	153 (128%)	153	200	167 (84%)	167

වෙනත් ක්‍රියාකාරකම්

1. දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගි වීම

වගුව 20: දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගි වීම

	සිදුකල කාර්යය	වැඩසටහන් ප්‍රමාණය
1	ගම්පහ දිස්ත්‍රික්කයේ කර්මාන්ත සංවර්ධනය උදෙසා "One stop shop" - Industry Clinic නමින් සේවාවක් පැවැත්වීම - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	01
2	කුරුණෑගල දිස්ත්‍රික්කයේ කර්මාන්ත සංවර්ධනය උදෙසා "One stop shop" - Industry Clinic නමින් සේවාවක් පැවැත්වීම - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය	01
3	තාක්ෂණික හුවමාරු වැඩසටහන (Quality Control and Standardization of coir products) - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම	01
4	පොල්තෙල් කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - පොල් සංවර්ධන අධිකාරිය මඟින් මෙහෙයවීම (ගාල්ල, ගම්පහ, තංගල්ල, කිලිනොච්චි, පුත්තලම, කුරුණෑගල)	06
5	තාක්ෂණික හුවමාරු වැඩසටහන (Production processes of the Coconut Oil Product technology)- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවීම	01

2. වැඩමුළු සඳහා සහභාගි වීම

වගුව 21: වැඩමුළු සඳහා සහභාගි වීම

	වැඩමුළුව
1	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවන ලද Organizing Sri Lanka Pavilion at Foode· Saudi 2024 Trade Fair වැඩමුළුව
2	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවන ලද Organizing Outward Trade Delegatμon to Melbourne, Australia වැඩමුළුව
3	වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද National Orientation Workshop on Upgraded value chain and payment for Ecosystem Services වැඩමුළුව
4	ජාතික ශාක නිරෝධායන සේවයඃ කෘෂිකර්ම දේපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද Training Program on Role of National Plant Quarantine Service for Trade Facilitation of Plant Products at National Plant Quarantine Services වැඩමුළුව
5	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවන ලද Harmonization of the Sri Lanka Organic Standards SLS 1324(2018 with the GB organic regulation and for its recognition and inclusion in the IFOAM Family of standards වැඩමුළුව
6	වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද Focal Point details of stakeholders for the GCF Knuckles Project වැඩමුළුව
7	කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද පොල් ක්ෂේත්‍රය සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම සඳහා පවත්වනු ලබන වැඩසටහන
8	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවන ලද Sri Lanka's participation ar Sri Lanka palvlion at international food and drink event වැඩමුළුව
9	වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද පොල් ක්ෂේත්‍රය සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම අදාලව UNIDO සමඟ පැවැත්වූ වැඩමුළුව
10	Sri Lanka Association for the advancement of quality and productivity(SLAAQP) ආයතනය විසින් සංවිධානය කරන ලද Beyond boundaries (A quest for quality" Productivity and innovation වැඩමුළුව
11	Association of SAACRFOODS in Sri Lanka විසින් සංවිධානය කරන ලද Annual Scientific Sessμons -2024 වැඩමුළුව

3. ප්‍රදර්ශන සඳහා දායකත්වය ලබා දීම

පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය වෙනුවෙන් තත්ත්ව පාලන අංශයේ දායකත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහා පහත ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

වගුව 22: ප්‍රදර්ශන සඳහා දායකත්වය ලබා දීම

1	යාපනේ දිස්ත්‍රික්කයේ 2024 ජනවාරි මස 17 සිට 19 දක්වා පැවැත්වූ Jaffna Trade Fair වෙළඳ ප්‍රදර්ශනය
2	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද 2024 පෙබරවාරි 29 සිට මාර්තු 06 දක්වා ඇඹිලිපිටිය බටඅත පැවති කෘෂි තාක්ෂණ ප්‍රදර්ශනය
3	කොළඹ දේවි බාලිකා විද්‍යාලයේ 2024 මාර්තු 14 වන දින පැවැත්වූ ප්‍රදර්ශනය
4	ජාතික වැවිලි කළමණාකරණ ආයතනය අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් සංවිධානය කරන ලද 2024 මාර්තු 28 දින අතුරුගිරිය හි පවත්වනු ලැබූ වෙළඳ ප්‍රදර්ශනය
5	පොල් සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කරන ලද 2024 ජුනි 19-24 දක්වා යාපනේ පැවත්වූ දකුණු ආසියාතික කර්මාන්ත ප්‍රදර්ශනය
6	ගම්පහ බණ්ඩාරණායක විද්‍යාලයේ සංවත්සරය සඳහා සංවිධානය කරන ලද 2024 ජුලි 23 -28 දක්වා පැවැත්වූ Xband ප්‍රදර්ශනය
7	ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය හා ලංකා ප්‍රදර්ශනය හා සම්මේලන පුද්ගලික සමාගම විසින් 2024 අගොස්තු 23- 25 දක්වා සංවිධානය කරන ලද BMICH හි පැවැත්වූ Profood Propack ප්‍රදර්ශනය
8	ගාල්ල නගර සභාව විසින් සංවිධානය කරන ලද 2024 ඔක්තෝම්බර් 24 -26 දක්වා ගාල්ලේ පැවති රස සරණය ප්‍රදර්ශනය
9	පොල් සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කරන ලද 2024 දෙසැම්බර් 10-12 දක්වා යාපනේ පැවත්වූ කර්මාන්ත ප්‍රවර්ධන ප්‍රදර්ශනය

රූපය 25,26,27,28 : දායකත්වය ලබා දුන් ප්‍රදර්ශන













රූපය 29,30,31,32 : දායකත්වය ලබා දුන් ප්‍රදර්ශන





4. ප්‍රමිති සංශෝධන සහ නව ප්‍රමිති සකස් කිරීමේ සාකච්ඡා සඳහා සහ HS Code සකස් කිරීමේ කටයුතු සඳහා සහභාගිවීම

වගුව 23: ප්‍රමිති සංශෝධන සහ නව ප්‍රමිති සකස් කිරීමේ සාකච්ඡා සඳහා සහ HS Code සකස් කිරීමේ කටයුතු සඳහා සහභාගිවීම

	කාර්යය	ප්‍රගතිය
1	Standards Revision of Coir Fibre Pith Substrate ප්‍රමිතිය	ප්‍රමිතිය මහජන අදහස් සඳහා යොමු කර ඇති
2	ඉදල් හා කොසු සම්බන්ධ ප්‍රමිතිය	ප්‍රමිතිය සකස් වෙමින් පවතී
3	Low - Fat Desiccated Type Coconut And Partially Defatted Desiccated Type Coconut ප්‍රමිතිය	ප්‍රමිතිය සකස් කිරීම අවසන් කර ක්‍රියාත්මක තත්ත්වයේ පවතී

5. අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම

වගුව 24: අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම

1.	කොලඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා සහ පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ සිසු සිසුවියන් 13 දෙනෙකු හා උපදේශකවරු තිදෙනෙකු සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනාගාර කටයුතු පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකාවක් සිදුකිරීම හා රසායනාගාර කාර්යයභාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම්

6. විශ්ව විද්‍යාලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපාධි සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු (Industrial Training) අවස්ථාව සැපයීම

වගුව 25: විශ්ව විද්‍යාලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපාධි සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු (Industrial Training) අවස්ථාව සැපයීම

	විශ්ව විද්‍යාලය	සහභාගි වූ ශිෂ්‍යයන් ගණන
1	කොළඹ විශ්ව විද්‍යාලය - රසායනික විශ්ලේෂණ සඳහා	02
2	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය - ක්ෂුද්‍රජීවී / රසායනික විශ්ලේෂණ සඳහා	01
3	කැළණිය විශ්ව විද්‍යාලය - ක්ෂුද්‍රජීවී /රසායනික විශ්ලේෂණ සඳහා	07
4	නැගෙනහිර විශ්ව විද්‍යාලය, චෙන්කල්ලාඩි - රසායනික විශ්ලේෂණ සඳහා	01
5	University of Vocational Technology - Rathmalana	02
6	කුලියාපිටිය කාර්මික විද්‍යාලය - රසායනික විශ්ලේෂණ සඳහා	01
	සම්පූර්ණ අවස්ථා ගණන	**14**

7. තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් සහභාගිවීම

වගුව 26: තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් සහභාගිවීම

	කාර්යය	සහභාගිවූ නිලධාරි
1	අධිකාරියේ සේවකයන් සඳහා සැත්කම් හා රෝහල් ගාස්තු රක්ෂණාවරණය ලබා ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව	එස්. එස්. පුරසිංහ මිය
2	2024 වර්ෂය සඳහා ක්ෂුද්‍රජීවී මාධ්‍ය මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව	මධුරි විජේබණ්ඩාර මිය
3	2024 වර්ෂය සඳහා උපකරණ මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව	සමදරා දිසානායක මිය
4	2024 වර්ෂය සඳහා වීදුරු භාණ්ඩ හා උපාංග සුළු මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව	මධුරි විජේබණ්ඩාර මිය
5	202 4 වර්ෂය සඳහා රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව	අශෝක පුෂ්පකුමාර මයා
6	රසායනාගාර උපකරණ සේවා කිරීම සඳහා සේවා ගිවිසුම් සකස් කිරීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව	සමදරා දිසානායක මිය
7	රසායනාගාර සුළු මිලදී ගැනීම් සහ රසායනාගාර උපකරණ අළුත්වැඩියා සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව	සමදරා දිසානායක මිය

මීට අමතරව අධිකාරියේ පොදු කාර්යයන් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරීන්ගේ දායකත්වය ලබාදී ඇත.

8. තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීමේ සාරාංශය

වගුව 27: තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීමේ සාරාංශය

කාර්යය	2023	2024
පරීක්ෂා කර ඇති ආදර්ශ ප්‍රමාණය	18,684	19,964
සිදුකර ඇති පරීක්ෂණ ගණන	76,665	81,988
ආදායම් ඉපයීම (රු. මිලියන)	54.7	74.43

03. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයක් ලෙස අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් 2024 වසර තුල සපයන ලද ප්‍රධාන සේවාවන් පහත පරිදි විය;

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයට ඇති ප්‍රධාන වගකීම් අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි අපනයන ආදායමක් ශ්‍රී ලංකාවට ලබා ගැනීම වන අතර එහිදී ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳව අපනයනකරුවන්/ නිෂ්පාදකවරුන් දැනුවත් කිරීම, ඔවුන් සහභාගී කරවීම හා ඒ සඳහා සහභාගි වීමට සහය ලබාදීම.
- උසස් ප්‍රමිතියකින් යුතු පොල් සහ තැඹිලි ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි අපනයනය කිරීම සඳහා අදාල අවසරපත් නිකුත් කිරීම සහ ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂා කරන අපනයනාභිමුඛ ව්‍යවසායකයින් සඳහා තාවකාලික අපනයන අවසරපත් නිකුත් කිරීම.
- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු හා සම්බන්ධ වී සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අනුමැතීන් ලබාදුන් අතර අපනයනයන් අධීක්ෂණ කිරීම.
- දේශීය සහ විදේශීය වෙළඳ ආරවුල් නිරාකරණය සහ සමථයන්ට පත්කිරීම.
- පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපළ මිල ගණන් මුද්‍රිත මාධ්‍ය වෙත දිනපතා ලබා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන / ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපලේ පොල් ආශ්‍රිත මිල ගණන් ඇතුළත් වාර්තා නිකුත් කිරීම.
- ගෙඩි පොල් වෙන්දේසිය නොකඩවා පැවත්වීම.
- පාල් ආශ්‍රිත නිෂ්පාදන දේශීය වෙළඳපොල තුල ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශීය වෙළඳ ප්‍රදර්ශන සහ ප්‍රවර්ධන වැඩසටහන් වලට සහභාගී වී පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ ඒවා භාවිතා කිරීමෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභයන්හි වැදගත්කම පිළිබඳව මහජනතාව සහ පාසැල් සිසුන් දැනුවත් කිරීම.
- කෘෂි කර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ වෙළඳ ගිවිසුම් හා බැඳි සාකච්ඡා වටයන්ට සහභාගි වී පොල් ආශ්‍රිත අපනයන භාණ්ඩ පිළිබඳ තොරතුරු සහ අදාල ගිවිසුම් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳව අදාල අංශ දැනුවත් කිරීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීමට කටයුතු කිරීම.
- ගෘහාශ්‍රිත ගෙඩි පොල් පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කර ගැනීමේ අරමුණින් ගෙඩි පොල් සඳහා ආදේශකයක් වන පැකට් කල පොල් කිරි හා පොල් කිරි පිටි භාවිතය පිළිබඳව සහ පොල් කටු සහ පොල් ලෙලි අපතේ යාම අවම කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම. සඳහා මුද්‍රිත මාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා දැන්වීම් පළකිරීම සහ දේශීය ප්‍රදර්ශනවලදී ජනතාව දැනුවත් කිරීම සහ සජීවී නිරූපණ සිදු කිරීම.
- පාසැල් කේන්ද්‍ර කර ගනිමින් පොල් කටු එකතු කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ලෝක වෙළඳපලේ ඇති ඉල්ලුම, පොල් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ දායකත්වය, පොල් ක්ෂේත්‍රය සම්බන්ධ කාලීන තොරතුරු සමාජ මාධ්‍ය හරහා ලබාදීම නොකඩවා සිදු කිරීම.
- දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් සඳහා දැනට ඇති ප්‍රධාන රටවල් හඳුනාගැනීම සහ එක් එක් රටවලින් එක් ඒකකයක් සඳහා ගෙවන මිල පිළිබඳ විශ්ලේෂණයන් කිරීම.
- අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කරන ලද අතර ඔවුන්ට අවශ්‍ය උපදේශණ සේවාවන් ලබා දීම.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම 2024 වසරේදී රු. බිලියන 258 ක් හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 855 ක් ලබාගැනීමට හැකි වූ අතර අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ සේවාවන් කාර්යක්ෂමවත්, ඵලදායි ලෙසත් 2024 වර්ෂයේ දීද ඉටු කරන ලදී.

1. 2024 වර්ෂය තුළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකරන ලද කාර්යයන් විස්තර වශයෙන් පහත දක්වා ඇත;

1.1 ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වීම

පොල් ආශ්‍රිත නිෂ්පාදන ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගන්නා එක් ක්‍රමවේදයක් වන විදේශ රටවල සංවිධානය කරනු ලබන, වැඩි ජාත්‍යන්තර ගැණුම්කරුවන් ප්‍රමාණයක් සහභාගීවෙතැයි අපේක්ෂා කල හැකි විදේශීය වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයන / නිෂ්පාදන ආයතන සම්බන්ධ කරවීම පොල් සංවර්ධන අධිකාරිය විසින් සෑම වසරකම සිදු කර ඇත. මෙසේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගීවීමෙන් විදේශ ඇණවුම් වැඩි වශයෙන් ලබාගැනීමටත්, නව ගැණුම්කරුවන් හඳුනාගැනීමටත්, තරඟකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, ජාත්‍යන්තර ප්‍රජාවගේ පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ඇති නව ප්‍රවණතා සහ අවශ්‍යතාවයන් හඳුනාගැනීමටත්, දිනෙන් දින යාවත්කාලීන වන නිෂ්පාදනයන්ගේ ප්‍රමිතීන් පිළිබඳව දැනුවත් වීමටත්, ඇසුරුම්කරණය පිළිබඳ නව ප්‍රවණතා හඳුනාගැනීමටත්, පවතින වෙළඳපොළ ආරක්ෂා කර ගැනීමටත් හැකියාව ලැබේ.

ජාත්‍යන්තර වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් සඳහා නිෂ්පාදන/අපනයනකරුවන් සහභාගී කරවීමෙන් ශ්‍රීලංකාව සඳහා වූ විදේශ වෙළඳපල තවදුරටත් පුළුල් වන අතර පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහල නැංවීමට හැකියාව ලැබීමෙන් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ. තවද, එම රටවල තානාපති කාර්යාල, වාණිජ මණ්ඩල හා සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකික පොල් නිෂ්පාදන සඳහා නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය ක්‍රියා කර ඇත.

2024 වසරේදී ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගී කරවීම සඳහා පොල් සංවර්ධන අධිකාරියේ අනුග්‍රාහකත්වය ලබාදීමේ අරමුණින් ප්‍රදර්ශන ගණනාවක මූලික කටයුතු සිදු කරන ලදී. නමුත් ඒ අතරින් ප්‍රදර්ශන 3ක් (Fi - Europe lfe - London/Fine Food - Australia) සඳහා අධික පිරිවැය සහ සුදුසු ප්‍රදර්ශන කුටියක් නොලැබීම වැනි කරුණු හේතුවෙන් අපනයනකරුවන් සහභාගී වීම සඳහා උනන්දුවක් නොදක්වන ලදී. එසේ වුවත් පහත ප්‍රදර්ශන සඳහා පොල් සංවර්ධන අධිකාරියේ දායකත්වය දක්වන ලදී.

1. දෝහා කටාර් හී පැවති Agri Tech 2024 ප්‍රදර්ශනය සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන සාම්පල ප්‍රදර්ශනයක් සිදු කිරීම.
2. නෙදර්ලන්තයේ පැවති Green Tech 2024 වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන් 8 දෙනෙකු සඳහා අර්ධ අනුග්‍රහය දැක්වීම.
3. ඉන්දුනීසියාවේ පැවති 60 වන ICC සමුළුව සහ ප්‍රදර්ශනය සඳහා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ නිලදාරිනියක් සහභාගී වූ අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන සාම්පල ප්‍රදර්ශනයක් සිදු කිරීම.
4. සෞදි අරාබියේ රියාද් නුවර පැවති සෞදි කෘෂිකර්ම ප්‍රදර්ශනය 2024 සඳහා අපනයනකරුවන් 9 දෙනෙකු සඳහා අර්ධ අනුග්‍රහය දැක්වීම
5. චීනයේ ෂැංහයි නුවර පැවති 7 වන චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය (CIIE) 2024 සඳහා චීන තානාපති කාර්යාලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය හරහා පොල් ආශ්‍රිත නිෂ්පාදන සාම්පල ඉදිරිපත් කිරීම.

2024 වසර තුළ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා විදේශ වෙළඳාම වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් මැලේසියානු නියෝජිත පිරිස සමඟ සහ සෞදි අරාබියේ තානාපතිවරයා සමඟ සාකච්ඡා පැවැත්වීම.

ඉහත සාකච්ඡා වලට අමතරව ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ වාණිජ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විදේශීය ගැණුම්කරුවන් ශ්‍රී ලාංකික අපනයනකරුවන් හා සම්බන්ධ කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය පහසුකම් සැලසීම සිදු කරන ලදී. ඒ අනුව ඩුබායි හි මහ කොමසාරිස්වරයාගේද සහභාගීත්වයෙන් ඩුබායි හි තැඹිලි ගැණුම්කරුවන් සහ ශ්‍රී ලංකාවේ තැඹිලි අපනයනකරුවන් අතර Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡාවක් සිදු කරන ලද අතර එහිදී එක්සත් අරාබි එමීර් රාජ්‍යට තැඹිලි අපනයනය කිරීමේදී පැනනගින ගැටළු පිලිබඳ සාකච්ඡා කිරීමටත් ඒවාට විසඳුම් ලබාදීමටත් හැකි විය.

ඊට අමතරව 2024 වර්ෂයේදී සෞදි අරාබියේ ගරු තානාපතිවරයා සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් අතර Zoom තාක්ෂණය ඔස්සේ තවත් සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී

රූපය 33 : ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්



ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන සෞදි අරාබියේ ප්‍රවර්ධනය කිරීම පිලිබඳ සාකච්ඡා කල අතර එහි එක් ප්‍රතිපලයක් ලෙස ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා පොල් නිෂ්පාදන සාම්පල ලබා දීම.

1.2 දේශීය අලෙවි ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම

2024 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් පරිසර හිතකාමී පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ භාවිතය සහ ගෘහස්ත පොල් නාස්තිය අවම කර ගැනීම පිළිබඳව මහජනතාවට හා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ අරමුණින් දේශීය වෙළඳ ප්‍රදර්ශන දහයකට (10) සහභාගී වන ලදී.

වගුව 28: දේශීය අලෙවි ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම

ප්‍රදර්ශනයේ නම	ස්ථානය	සංවිධානය
ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - යාපනය	මුත්තුවෙලි ක්‍රීඩාංගණය	ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන සේවා පුද්ගලික සමාගම සහ යාපනය දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
බට අත කෘෂි තාක්ෂණ ප්‍රචාරණ වැඩසටහන	බට අත කෘෂි තාක්ෂණික උද්‍යානය - හම්බන්තොට	කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
Desafio නව නිපැයුම් ප්‍රදර්ශනය	දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 08	දේවි බාලිකා විද්‍යාලයීය තාක්ෂණික අංශය
හලාවත වෙළඳ ප්‍රදර්ශනය	හලාවත නගර ශාලා පරිශ්‍රය	පුත්තලම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
NIPM Open Day වැඩසටහන	ජාතික වැවිලි කළමනාකරණ ආයතන පරිශ්‍රය - අතුරුගිරිය	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
වසත් සිරිය - 2024	ගාලු මුවදොර පිටිය	ජනාධිපති කාර්යාලය

ප්‍රදර්ශනයේ නම	ස්ථානය	සංවිධානය
ජාතික කර්මාන්ත හා වැවිලි කර්මාන්ත ප්‍රදර්ශනය - 2024	සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානය	කර්මාන්ත අමාත්‍යාංශය හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
X - ban අධ්‍යාපනික ප්‍රදර්ශනය - 2024	බණ්ඩාරනායක විද්‍යාලය - ගම්පහ	ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය
ප්‍රෝෆුඩ් ප්‍රෝපැක් හා ඇග්බිස් ප්‍රදර්ශනය	සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානය	ශ්‍රී ලංකා ආහාර සැකසුම් කර්මාන්තකරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන සේවා ආයතනය
රුහුණු රස සරණිය	ගාල්ල නගර ශාලා පරිශ්‍රය	කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළඳ සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

රූපය 34 : දේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්



1.2.1ගෘහස්ත පොල් අපතේ යාම අවම කර එතුළින් පොල් නිෂ්පාදන ආයතන සඳහා වැඩි පොල් ප්‍රමාණයක් ලබාදීමේ අරමුණින් ගෙඩි පොල් වෙනුවට පොල් කිරි නිෂ්පාදන භාවිතය සුලබ කිරීම, පොල් කටු හා පොල් ලෙලි එකතු කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ජනතාවට පැහැදිලි කිරීම, පොල් නිෂ්පාදන වල ඇති වැදගත් කම, තත්ත්ව පරීක්ෂාවෙන් උසස් නිෂ්පාදන සඳහා ඉහල ඉල්ලුමක් ලබාගන්නා ආකාරය, පොල් ආශ්‍රිත නිෂ්පාදන වලින් විදේශ විනිමය උපයා ගන්නා ආකාරය සම්බන්ධයෙන් පුවත් පත් දැන්වීම් සහ ලිපි, යොදා ගනිමින් මහජනතාව සහ කර්මාන්තකරුවන් දැනුවත් කරන ලදී.

රූපය 35 : පුවත් පත් දැන්වීම




1.2.2 ගෙඩි පොල් භාවිතයේදී සිදුවන අපතේ යාම අවම කිරීමට පොල් කිරි, පොල් කිරිපිටි හා පොල් ක්‍රීම් භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය සහභාගී වූ දේශීය ප්‍රදර්ශන වලදී ප්‍රායෝගික වැඩසටහන්ද සහිතව ඉතා වටිනා වැඩසටහන් පවත්වා ඇති අතර මෙම වැඩසටහන සඳහා ඉතාමත් ඉහල ජනතා ප්‍රතිචාර ලැබුණි.

1.2.3 ශ්‍රී ලංකාවේ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ ඔවුන් දිරිගැන්වීමේ අදහසින් පොල් සංවර්ධන අධිකාරිය විසින් සම්මාන උළෙලක් පැවැත්වීමට කටයුතු කරනු ලැබීය. මෙම සම්මාන උළෙල ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ (ICC) 60 වන අමාත්‍ය මණ්ඩල සැසිවාරයට සමගාමීව කොළඹ හිල්ටන් හෝටල් පරිශ්‍රයේ Grand Ballroom හිදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙහිදී 2023 වසර තුළ පොල් කර්මාන්තයෙන් වැඩිම අපනයන ආදායමක් උපයන ලද අපනයන ආයතන 50 අගයනු පිණිස සම්මාන සහ සහතික පත් පිරිනමන ලදී. මෙම වැඩසටහන සඳහා පොල් කර්මාන්තකරුවන් වෙතින් ඉහල ප්‍රතිචාර ලැබුණු අතර සමස්ථයක් ලෙස පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රතිරූපය ඉහල නැංවීමටද ඉවහල් විය.

රූපය 36,37 : ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ (ICC) 60 වන අමාත්‍ය මණ්ඩල සැසිවාරයට සමගාමීව පැවැත්වූ සම්මාන උළෙල





1.2.4 පොල් මද ආශ්‍රිත අපනයනකරුවන්/නිෂ්පාදකවරුන් වෙනුවෙන් තත්ත්වයෙන් සහ ගුණාත්මකභාවයෙන් උසස් සන්නාමයන් සහිත පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ලෝක වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම හා ලෝක වෙළෙඳපොළේ ඒ සඳහා පවතින ඉල්ලුම පිළිබඳ දැනුවත් කිරීමටත්, තැඹිලි අපනයනයේදී ඇති ගැටළු ගැන සොයාබැලීමටත්, කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයේදී/අපනයනයේදී අපද්‍රව්‍ය එකතු නොවන ආකාරයෙන් කටයුතු කිරීමටත් සාකච්ඡා වට පවත්වන ලදී.

1.2.5 රට පුරා විසිරී සිටින පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ නිරත විවිධ පාර්ශවකරුවන් සහ අනාගතයේ පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි නිරත වීමට අදහස් කරන පුද්ගලයන්ට පොල් කර්මාන්ත පිළිබඳ දැනුම ලබාදීමට 2024 වසරේදී සමාජ මාධ්‍ය උපයෝගී කරගන්නා ලදී. එහිදී පොල් කර්මාන්ත ක්ෂේත්‍රය තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වැදගත්කම, පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ඇති වැදගත්කම, පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය නඟා සිටුවීමට පොල් සංවර්ධන අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාවන් සහ නිෂ්පාදන ආයතන විසින් තම නිෂ්පාදන වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය මුල්‍යමය ණය සහන පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදී.

රූපය 38 :දැන්වීම



1.2.6 පාසැල් කේන්ද්‍ර කර ගනිමින් දීප ව්‍යාප්ත පොල් කටු එකතු කිරීමේ වැඩසටහනක් ආරම්භ කල අතර එහි සමාරම්භක වැඩ සටහන 2024 ජාත්‍යන්තර පොල් දිනයට සමගාමීව පුද්ගලික අංශයේ ද සහභාගීත්වයෙන් නුගේගොඩ අනුලා විද්‍යාලයේදී පවත්වන ලදී.

1.3 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම


පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි සියල්ලන්ට සිය වෙළඳ තීරණ ගැනීමේදී තීරණාත්මක සාධකයක් වනුයේ නිවැරදි තොරතුරු ලබාගෙන ඒවා විශ්ලේෂණය කිරීමය. මෙහිදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව 2024 වසරේදී ද විශේෂ කාර්යයභාරයක් පහත පරිදි ඉටු කර ඇත.

- පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන තොරතුරු, දේශීය හා ජාත්‍යන්තර අපනයන සහ ආනයන දත්ත ලබාගැනීම හා අදාල පාර්ශවකරුවන් වෙත බෙදාහැරීම.
- ගොවිපල මිල ගණන් සම්බන්ධයෙන් අදාළ තොරතුරු සහ දත්ත විධිමත්ව රැස්කිරීම හා බෙදාහැරීම.
- ගෘහස්ත පොල් හා පොල්තෙල් පරිභෝජනය පිළිබඳව දත්ත විධිමත්ව රැස්කිරීම, සසඳා බැලීම
- නවතම අලෙවි ක්‍රම හඳුන්වාදීම මඟින් අපනයන ආදායම වැඩිකර ගැනීමට සහය වීම.
- වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳව තොරතුරු විධිමත්ව රැස්කිරීම, සටහන් කිරීම හා ප්‍රචාරණය කිරීම.

පහත සඳහන් ආයතන වලින් මෙම තොරතුරු ලබාගැනීමේදී සිය දායකත්වය නොමසුරුව ලබාදෙන ලදී.

- ශ්‍රී ලංකා රේගුව
- ශ්‍රී ලංකා මහ බැංකුව
- ජන ලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව
- කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය, ආර්ධ රාජ්‍ය ආයතන
- තවද, විදේශීය ආයතන වන ජාත්‍යන්තර පොල් ප්‍රජාව (International Coconut Community), විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP Indian Coconut Journal) ආදියෙන්ද පොල් කර්මාන්තය සඳහා ලබාගන්නා විශේෂිත තොරතුරු නිරතුරුවම ශ්‍රී ලංකා පොල් ප්‍රජාවට ලබාදීමේ කාර්යභාරය 2024 වසරේදී ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් සාර්ථකව ඉටුකරන ලදී.
- දෛනිකව ලබාගන්නා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල දේශීය මිල ගණන්, ඉංග්‍රීසි සහ සිංහල මුද්‍රිත මාධ්‍යයෙන් 2024 වසරේදීද ප්‍රකාශයට පත්කරන ලදී.
- ගෙඩි පොල් මිල ගණන්, දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ගොවිපළ මිල ගණන්, තොග මිල ගණන් හා ජාත්‍යන්තර මිල ගණන් ඇතුළත් "Coco Market Focus" සති වාර්තාවේ ප්‍රකාශන හතලිස් අටක් (48) අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් 2024 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පොල් ආශ්‍රිත භාණ්ඩයන්ගේ අපනයන ප්‍රමාණයන්, මිල ගණන්, අපනයනය කරන ලබනු රටවල් සහ ආනයනය කරනු ලබන පොල්තෙල් ඇතුළු අනෙකුත් බාද්‍ය තෙල් ආනයන ප්‍රමාණයන් සහ මිල ගණන් ඇතුළත් "Coco Market Focus" මාසික සඟරාවේ ප්‍රකාශන දොලහක් (12) අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව සම්පාදනය කොට 2024 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදී.
- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන "Sri Lanka Coconut Statistics - 2023" ප්‍රකාශනය 2024 වසරේදී ද සම්පාදනය කොට ඉදිරිපත් කරන ලදී. එම ප්‍රකාශනයේ ඇතුළත් වසර පහක (05) දත්තයන් අතර ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද සියලුම පොල් ආශ්‍රිත භාණ්ඩ වල අපනයන ප්‍රමාණ හා මිල ගණන්, නිෂ්පාදන ප්‍රමාණයන්, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ පොල් තෙල් ඇතුළු අනෙකුත් බාද්‍ය තෙල් වර්ගවල ප්‍රමාණ හා මිල ගණන්, අන්තර්ජාතික පොල් ඵලදාව, නිෂ්පාදන සහ අපනයන තොරතුරු සඳහන් කල හැකියි පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අපනයන ක්ෂේත්‍රයේ නියැළි පාර්ශවකරුවන්ට සිය වෙළඳ තීරණ ගැනීමේදී මෙම ප්‍රකාශන බෙහෙවින් ඉවහල් විය.

රූපය 39 : Sri Lanka Coconut Statistics - 2023 ප්‍රකාශනය



1.4 පොල් කර්මාන්තයේ අපනයන ආදායම

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හී පසුගිය වසර 15ක අපනයන ආදායම (2010 - 2024) පහත දක්වා ඇත.

වගුව 29: පොල් කර්මාන්තයේ අපනයන ආදායම

වසර	වටිනාකම	
	(රු. මිලියන)	(ඇ.ඩො. මිලියන)
2010	32,433	286.86
2011	47,306	427.85
2012	46,667	365.72
2013	47,952	371.40
2014	72,880	558.21
2015	75,259	553.63
2016	84,702	581.74
2017	91,198	598.19

වසර	වටිනාකම	
	(රු. මිලියන)	(ඇ.ඩො. මිලියන)
2018	94,722	583.81
2019	108,946	609.77
2020	122,514	661.04
2021	166,034	834.12
2022	262,933	816.99
2023	228,720	700.47
2024	257,921	854.93

ප්‍රස්ථාරය 06: පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනයන ආදායම




2024 වසරේදී පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනයෙන් ලද ආදායම ඇ.ඩො. මිලියන 855 ක් වූ අතර එය 2023 වසරට සාපේක්ෂව 22% ක වර්ධනයක් සේම පොල් කර්මාන්ත ඉතිහාසයේ අත් කරගත් වැඩිම අපනයන ආදායම විය.

2024 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායම ඇ.ඩො. මිලියන 459.6 ක් ද අගය එකතු කළ කොහු නිෂ්පාදන අපනයන ආදායම ඇ.ඩො.මිලියන 216.8 ද වූ අතර පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන්හී ආදායම ඇ.ඩො.මිලියන 157.80ක් විය. එය 2023 වසරට සාපේක්ෂව පිළිවෙලින් 26% ක්, 18% සහ 22%ක කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි.

අමුද්‍රව්‍ය ස්වරූපයේ කොහු අපනයනයන්හී ආදායම ඇ.ඩො.මිලියන 16.5 සහ අනෙකුත් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන්හී ආදායම ඇ.ඩො.මිලියන 4.2 වූ අතර එය 2023 වසරට සාපේක්ෂව පිළිවෙලින් 3% ක සහ 17% ක අඩු වීමක් පෙන්නුම් කරයි.

2023 වසරට සාපේක්ෂව 2024 වසරේදී සමස්ථයක් ලෙස පොල් ආශ්‍රිත අපනයන ආදායමේ ඉහල යාමට ජාත්‍යන්තර වෙළඳපොල තුළ පොල් නිෂ්පාදන සඳහා පැවති මිල ගණන් ඉහල යාම සහ වැඩි ඇණවුම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත යොමුවීමට හේතු විය. නමුත් වසර අවසාන භාගය තුළ පැවති ඉහල පොල් මිල හේතුවෙන් දේශීය අපනයන කර්මාන්තකරුවන් අර්බුදකාරී තත්ත්වයකට පත්වූ අතර මෙම මිල ගණන් ඉහල යාම නොවන්නට වැඩි අපනයන ආදායමක් ළඟාකර ගැනීමේ විභවයක් කර්මාන්තය සතු විය.

ප්‍රස්ථාරය 07: පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනයන ආදායම පොල් එලදාව සහ අපනයන ආදායම හැසිරීම



කෙසේ වුවත්ද 2030 වසර වන විට පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයෙහි අපනයන ආදායම ඇ.ඩො. බිලියන 1.5ක් දක්වා වැඩි කර ගැනීම අපේක්ෂාවයි.

මෙම ඉලක්කය සපුරා ගැනීමේදී දේශීයව වැඩි පොල් ඵලදාවක් ලබාගැනීම මෙන්ම ගෘහස්ථව සිදුවන පොල් අපතේ යාම අවම කර ගැනීමත් තුළින් වැඩි පොල් ප්‍රමාණයක් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදා ගැනීම සිදුකල යුතුව ඇත. එසේම, පොල් කර්මාන්තය තුළ වැඩි පොල් ප්‍රමාණයක් මෑතකාලීනව වැඩි විදේශීය ඉල්ලුමක් දක්නට ලැබුණු මද ආශ්‍රිත නිෂ්පාදන වන පොල් කිරි සහ කිරි ආශ්‍රිත අගය එකතුකළ නිෂ්පාදන, පොල් වතුර සහ පොල් වතුර ආශ්‍රිත අගය එකතුකළ නිෂ්පාදන නිපදවීම සඳහා යොමු කිරීම තුළින් මද ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහල නංවා ගැනීම සිදු කල යුතු වේ.

එසේම, නවීන කෘෂිකර්මාන්තය සඳහා යොදාගන්නා පරිසර හිතකාමී වගා මාධ්‍ය සඳහා වන ගෝලීය පෙළඹුමේ වර්ධනය හේතු කොටගෙන කොහු බත්, පොල් ලෙලි කැබලි, කොහු කෙඳි සහ ඒ ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන වගා මලු ඇතුළු උද්‍යාන වගාව සඳහා යොදාගන්නා කොහු නිෂ්පාදන සඳහා වන ඉල්ලුමේ වර්ධනයක් පවතින අතර ඒ සඳහා වැඩි පොල් ලෙලි ප්‍රමාණයක් යොමු කිරීම තුළින් වැඩි අපනයන ආදායමක් ලඟා කර ගත හැක.

තවද, පොල් කටු යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන වඩා වාසිදායක නිෂ්පාදනය වන විදේශ වෙළඳපොල තුළ ඉහල ඉල්ලුමක් පවතින පොල් කටු සක්‍රීය කාබන් නිෂ්පාදනය සඳහා වැඩි පොල්කටු ප්‍රමාණයක් යොමු කිරීම තුළින් පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහල නංවාගැනීමට කටයුතු කල හැක.

1.5 අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනයද සහ වෙළඳපල ප්‍රවේශය ඉහළ නැංවීම

1.5.1 ඇණවුම් වැඩි ගණනක් ලැබීම හේතුවෙන් 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වන පොල් තෙල්, නැවුම් පොල් තෙල්, දිසිදි පොල්, පොල් කිරි, පොල් කිරිපිටි, පොල් වතුර, පොල් ක්‍රීම්, පොල් පිටි, පොල් සීනි ඇතුළු බොහෝ නිෂ්පාදන අපනයනයේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

1.5.2 පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය (www.cda.gov.lk) මගින් වඩාත් විධිමත් ලෙස දත්ත හුවමාරු කර ගැනීමේ කටයුතු 2024 වසරේදී ද සිදු කරන ලදී.

1.5.3 අගය එකතු කළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන හා පරිසර හිතකාමී පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වලට ජනතාව යොමු කිරීමටත් එමඟින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් වැඩි කරගැනීමේ අරමුණින් පුවත්පත් දැන්වීම් සහ සමාජ මාධ්‍ය හරහා ප්‍රවර්ධන සේවාවන් 2024 වසරේදී සිදු කරන ලදී.

1.6 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණය සම්බන්ධ සියලු පාර්ශවයන් ලියාපදිංචි කිරීම

2023 වසරට සාපේක්ෂව 2024 වසරේදී පොල් ආශ්‍රිත අපනයන ආයතනයන්ගේ ලියාපදිංචිය 6% කින් අඩුවී ඇත. එයට හේතු වී ඇත්තේ 2022, 2023 කාලය පුරාවට පැවති අයහපත් ආර්ථික තත්ත්වය සහ අඩු පොල් ඵලදාව හේතුවෙන් ඇතැම් සුළු පරිමාණ අපනයනකරුවන් කර්මාන්තයෙන් ඉවත්වීමයි. මේ අනුව අපනයනකරුවන් අඩු ප්‍රමාණයක් 2024 වසරේදී ලියාපදිංචිය ලබාගෙන ඇත. පොල් ඵලදාව අඩුවීම හේතුවෙන් 2023 වසරට සාපේක්ෂව 2024 වසරේදී පොල් වෙන්දේසිය සඳහා ද ගෙඩි පොල් ලැබීම 30% කින් අඩු වී තිබුනු අතර වෙන්දේසියට සහභාගීවන්නන්ගේ ලියාපදිංචිය ද 2023 වසරට සාපේක්ෂව 2024 වසරේදී අඩුවීමක් දක්නට ලැබේ.

වගුව 30: පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියලු පාර්ශවයන් ලියාපදිංචි කිරීම

ලියාපදිංචි කටයුතු - 2022/2023/2024

ලියාපදිංචි කිරීම	2022	2023	2024
අපනයනකරුවන්	868	801	753
බ්‍රෝකර්වරුන්	23	17	16
වෙළඳුන්	69	67	66
පොල් වතු	135	123	153

1.7 පොල් වෙන්දේසි පැවැත්වීම

1.7.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

1994 වසරේදී ආරම්භ කරන ලද ගෙඩි පොල් වෙන්දේසිය 2024 වසරේදී ද පවත්වන ලදී. නමුත් 2024 අගභාගයේදී පැවති ඉහල පොල් මිල ගණන් හේතුවෙන් පොල් මිල පාලනය සඳහා පියවරක් ලෙස 2024 ඔක්තෝබර් අවසාන සතියේ සිට මිල පාලනයක් යටතේ වෙන්දේසිය පැවැත්වූ අතර දෙසැම්බර් මාසය තුළ පොල් වෙන්දේසිය තාවකාලිකව අත්හිටුවන ලදී. කෙසේ වුවත්, පොල් වගාකරුවා හා ගැණුම්කරුවා යන දෙපාර්ශවයටම අවාසියක් නොවන ආකාරයට වෙන්දේසි 45 ක් 2024 වසරේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

වගුව 31: කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

වර්ෂය	ගෙඩි ප්‍රමාණය		සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට)
	ඉදිරිපත් කළ ප්‍රමාණය	විකුණුම් ප්‍රමාණය	
2022	58,305,234	39,164,730	60,137.20
2023	39,459,341	29,539,384	70,890.79
2024	27,600,884	21,640,118	80,308.72

1.7.2 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේදී ඇති වූ වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා 2024 වසරේදී ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සිය දායකත්වය ලබා දෙන ලද අතර පොල් වෙන්දේසිය ක්‍රියාත්මක කිරීමේදී අලෙවිකරුවන් හා ගැණුම්කරුවන් අතර ඇතිවන වෙළෙඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා මැදිහත්කරු ලෙස අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2024 වසරේදී ද සුවිශේෂී කාර්යයභාරයක් ඉටු කරන ලදී.

පොල් නිෂ්පාදිත අපනයන - 2023/2024

වගුව 32: පොල් නිෂ්පාදිත අපනයන - 2023/2024සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන

නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය (මෙ.ටො.)			වටිනාකම (ඇ.ඩො. මිලියන)		
	2023	2024	% වෙනස	2023	2024	% වෙනස
1. පොල් මද නිෂ්පාදිතයන්						
1) පොල් තෙල්	5,518	7,391	34	11.83	18.30	55
2) නැවුම් පොල්තෙල්	14,728	16,214	10	55.06	64.75	18
3) දිසිඳි පොල්	37,988	40,250	6	73.69	99.48	35
4) කොප්පරා	979	344	-65	1.26	0.48	-62
5) ගෙඩි පොල් (ගෙඩි 000)	14,127	17,246	22	6.62	7.70	16
6) තැඹිලි (ගෙඩි)	12,909,100	8,007,031	-38	10.19	6.75	-34
7) පුන්නක්කු	25,647	3,165	-88	8.28	1.44	-83
8) ඔයිල් කේක්	177	406	129	0.10	0.33	243
9) පොල් කිරම	20,673	25,391	23	36.09	45.01	25
10) පොල් කිරි	58,013	77,832	34	86.97	111.22	28
11) පොල් කිරිපිටි	8,407	11,428	36	40.36	57.23	42
12) මේදය ඉවත් කළ පොල්	2,366	4,048	71	2.43	6.06	150
13) පොල් වතුර	29,220	36,348	24	25.41	30.92	22
14) පොල් අරක්කු (ලීටර්)	34,723	31,558	-9	0.19	0.19	-3
15) විනාකිරි (ලීටර්)	43,403	44,063	2	0.14	0.10	-29
16) ෆැටි ඇසිඩ්	253	578	129	0.18	0.46	152
17) පොල් බටර්	182	112	-38	0.61	0.48	-21
18) පොල් පිටි	3,594	3,928	9	3.10	3.85	24
19) පොල් සීනි / පැණි / සිරප්	118	240	104	0.34	0.80	137
20) පොල් ඇමයිනෝ	622	790	27	3.05	3.72	22
21) ගාන ලද පොල්	-	115	-	-	0.36	-
උප එකතුව - පොල් මද නිෂ්පාදිතයන්	**13,209,838.00**	**8,328,478.00**	**-36.95**	**365.90**	**459.63**	**26**

නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය (මෙ.ටො.)			වටිනාකම (ඇ.ඩො. මිලියන)		
	2023	2024	% වෙනස	2023	2024	% වෙනස
2. කෙඳි නිෂ්පාදිතයන්						
21) ගුදිරි කෙඳි	68,888	62,964	-9	11.43	11.54	1
22) බ්‍රිස්ටල් කෙඳි	1,853	1,750	-6	2.05	1.89	-8
23) අඹරන ලද කෙඳි	13,315	10,826	-19	3.57	3.07	-14
උප එකතුව - කෙඳි නිෂ්පාදිතයන්	**84,056**	**75,540**	**-10**	**17.05**	**16.50**	**-3**
3. පොල් කටු නිෂ්පාදිතයන්						
24) පොල් කටු අඟුරු	9,975	11,085	11	5.01	6.47	29
25) පොල් කටු කැබලි හා කුඩු	285	186	-35	0.15	0.13	-16
26) සක්‍රීය කාබන්	51,540	58,381	13	123.97	151.21	22
උප එකතුව - පොල් කටු නිෂ්පාදිතයන්	**61,800**	**69,652**	**13**	**129.13**	**157.81**	**22**
4. නිමි භාණ්ඩ නිෂ්පාදිතයන් (කොහු කෙඳි ආශ්‍රිත)						
27) කොහු ලණු	801	814	2	0.53	0.59	12
28) කොහු කඹ	6,678	4,046	-39	7.81	4.37	-44
29) තවාෂි බුරුසු (සංඛ්‍යාව 000)	20,918	18,111	-13	3.88	3.25	-16
30) කොසු හා බුරුසු (සංඛ්‍යාව000) (තවාෂි බුරුසු හැර)	12,452	12,438	0	8.83	8.56	-3
31) රබර් මිශ්‍ර කොහු පෑඩ් හා ඇඳන් මෙට්ට (සංඛ්‍යාව)	661,575	319,508	-52	0.64	0.90	41
32) කොහු ලණු පැදුරු හා බුමුතුරුණු (වර්ග මීටර්)	268,665	158,043	-41	1.09	0.92	-16
33) කොහු කලාල (වර්ග මීටර්)	5,450	1,874	-66	0.02	0.01	-46
34) කොහු බත්	23,915	21,994	-8	5.99	5.27	-12
35) පොල් ලෙලි කැබලි	3,352	9,065	170	1.16	3.20	177
36) මිහිසළු	4,197	3,886	-7	4.49	4.14	-8
37) උද්‍යාන වගා සඳහා යොදා ගන්නා කොහු නිෂ්පාදිතයන්	303,022	360,160	19	148.94	185.61	25
උප එකතුව - කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදිතයන්	**1,311,025.00**	**909,939.00**	**-30.59**	**183.38**	**216.82**	**18**
5. වෙනත් නිෂ්පාදිතයන්						
38) පොල් ඉරටු	14,113	11,231	-20	4.96	4.08	-18
39) පොල් ලී	9	14	67	0.06	0.07	14
40) පරිණත පත්‍ර පදනම් කරගත් නිෂ්පාදන	-	0.123	-	-	0.001	-
උප එකතුව - වෙනත් නිෂ්පාදිතයන්	**14,122**	**11,245.12**	**-20.37**	**5.02**	**4.15**	**-17**
මුළු අපනයන ආදායම	**14,680,841.00**	**9,394,854.12**	**-36**	**700.48**	**854.92**	**22**

04.පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සියළු අංශයන් සඳහා සහය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම, අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියළුම ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීම මඟින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහයවීම මෙන්ම සමස්ථ ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

4.1 සේවක සංඛ්‍යාව

මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2024 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 181ක් වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් තිස් එක් දෙනෙකු (31) කළමනාකරණ මට්ටමේ අය වූහ. සේවක සංඛ්‍යාව පහත සේවා ගණයන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය
2. කළමනාකාර සේවා ගණය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය
4. ආශ්‍රිත නිලධාරී සේවා ගණය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය

මෙම අධිකාරිය සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම සහ බඳවාගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා කාර්යය මණ්ඩල පරිපාලනයට අදාළ සියළුම කටයුතු සිදු කිරීම පරිපාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

වගුව 33: 2024.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

2024.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම				
1	අධ්‍යක්ෂ ජනරාල්(HM 2-1)	1		1
2	අධ්‍යක්ෂ (පරිපාලන) (HM 1-1)	1		1
3	අධ්‍යක්ෂ (මුදල්) (HM 1-1)	1	1	
4	අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) (HM 1-1)	1		1
5	අධ්‍යක්ෂ(තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) (HM 1-1)	1	1	
6	අධ්‍යක්ෂ(අලෙවි සංවර්ධන හා පර්යේෂණ) (HM 1-1)	1	1	
7	අධ්‍යක්ෂ -අලෙවිකරණ (ජාත්‍යන්තර) (HM 1-1)	1		1
8	සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)(MM 1-1)	1	1	
9	සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)(MM 1-1)	1	1	
10	සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) (MM 1-1)	4	3	1
11	සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ)(MM 1-1)	2	2	
12	සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ)(MM 1-1)	2	1	1
13	අභ්‍යන්තර විගණක(MM 1-1)	1	1	
14	රසඥ (MM 1-1)	1	1	
15	ඉංජිනේරු(සිවිල්)(MM 1-1)	1		1
16	නීති නිලධාරි(MM 1-1)	1	1	
	එකතුව	**21**	**14**	**7**
තෘතීය මට්ටම				
17	පරිපාලන නිලධාරි/මානව සම්පත් නිලධාරි (JM 1-2)	1		1
18	පර්යේෂණ නිලධාරි (JM 1-2)	1	1	
19	අලෙවි නිලධාරි(JM 1-2)	1		1
20	තොරතුරු නිලධාරි (JM 1-2)	1	1	
21	අභ්‍යන්තර විගණන නිලධාරි (JM 1-2)	1		1
22	තත්ත්ව පාලන නිලධාරි (JM 1-2)	1	1	
23	ජ්‍යෙෂ්ඨ පරීක්ෂක(JM 1-2)	9	8	1

අනු අංකය	තනතුර	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
24	මූල්‍ය නිලධාරි(JM 1-2)	1	1	
25	ආර්ථික පර්යේෂණ නිලධාරි (JM 1-2)	1		1
26	සැකසුම් සංවර්ධන නිලධාරි (JM 1-2)	5	2	3
27	සභාපති - ලේකම්(JM 1-2)	1		1
	එකතුව	**23**	**14**	**9**
ද්විතීයන මට්ටම				
28	වැඩසටහන් සහකාර(තත්ත්ව පාලන) (MA 3)	7	2	5
29	වැඩසටහන් සහකාර(අලෙවි පර්යේෂණ)(MA 3)	3		3
30	වැඩසටහන් සහකාර(සැකසුම් සංවර්ධන)(MA 3)	2		2
31	වැඩසටහන් සහකාර(ආර්ථික පර්යේෂණ)(MA 3)	1	1	
32	වැඩසටහන් සහකාර(තොරතුරු) (MA 3)	1	1	
33	වැඩසටහන් සහකාර(අභ්‍යන්තර විගණන)(MA 3)	2	1	1
34	වැඩසටහන් සහකාර (තාක්ෂණික සේවා)(MA 3)	25	10	15
35	පොත්තබන්නා (MA 2-2)	2	2	
36	කාර්මික සහකාර(ප්‍රවාහන)(MA 2-2)	1		1
37	කාර්මික සහකාර(යාන්ත්‍රික විදුලි)(MA 2-2)	1	1	
38	පරීක්ෂක (MA 2-2)	30	26	4
39	රසායනාගාර කාර්මික ශිල්පී (MA 2-2)	11	10	1
40	කළමනාකරණ සහකාර(MA 1-1)	58	46	12
41	අධ්‍යක්ෂ ජනරාල්- ලේකම්(MA 1-1)	1	1	
42	ක්ෂේත්‍ර සහකාර(MA 1-1)	2		2
43	රසායනාගාර ක්ෂේත්‍ර සහකාර(MA 1-1)	2		2
	එකතුව	**149**	**101**	**48**
ප්‍රාථමික මට්ටම				
44	රියදුරු(PL 3)	20	17	3
45	රසායනාගාර සහායක (PL2)	13	9	4
46	කාර්යාල සහායක(PL1)	18	13	5
47	ක්ෂේත්‍ර සහායක (PL 1)	15	13	2
	එකතුව	**66**	**52**	**14**
	සම්පූර්ණ එකතුව	**259**	**181**	**78**

4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලඟා කරගැනීම සඳහා වඩා ඵලදායීව හා සඵලදායීව යොදා ගැනීමට හැකිවන පරිදි මෙම අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2024 වර්ෂයේ දේශීය පුහුණු සංවර්ධන පාඨමාලා විවිධ විෂයන් ඔස්සේ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පුහුණු සංවර්ධන පාඨමාලා මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් පාඨමාලා සංවිධානය කිරීමට කටයුතු කර ඇත. 2024 වර්ෂයේ දී අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත පසුගිය වර්ෂයන් වලදී ලබාදීමට නොහැකි වූ හා අත්‍යාවශයෙන්ම ලබා දිය යුතු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීම පාලන අංශයේ අරමුණ විය.

පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය, නවක කාර්යය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ අවබෝධය ලබා දීම, කණ්ඩායම් හැඟීම වර්ධනය, රැකියා පරිසරයේ ඇති වී තිබෙන නව්‍යතා හඳුන්වා දීම හා ආයතනික පරිසරය කෙරෙහි හැඩගැස්වීම පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීමේ අරමුණ වී ඇත.

ඒ අනුව කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා වැය කරන මුදල් අනාගත ආයෝජනයක් සේ සළකා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාළ පුහුණු කටයුතු සඳහා යොමු කිරීම සිදු කර ඇත.

දේශීය පුහුණු සංවර්ධන කටයුතු

අංකය	පාඨමාලාවේ නම	පවත්වන ලද ආයතනය	සහභාගී වූ ගණන
01	ලංසු කැඳවීමේ ලේඛන පිළියෙළ කිරීම	Skills Development Fund Ltd	01
02	Workshop On Public Procurement Procedures	Skills Development Fund Ltd	04
03	කම්කරු නීතියේ නව ප්‍රවණතා	Chartered Institute of Personal Management	01
04	Public Sector Accounting Standards	National Institute of Education	02
05	Expenditure and Payment Procedure	Prag Service (Pvt) Ltd	04
06	රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිය	Prag Service (Pvt) Ltd	02
07	National Audit Act & Responsibilities of Public Officers	Prag Service (Pvt) Ltd	03
08	Master of Science in Human Nutrition	University of Wayamba	01
09	Training Programme on Quality Assurance of Microbiological Laboratory	Industrial Technological Institute	03

පාලන අංශයේ වෙනත් කාර්යයන්

- ආයතනයේ ස්ථාවර වත්කම් සම්බන්ධ වත්කම් ලේඛන පවත්වාගෙන යාම, වාර්ෂික තොග සමීක්ෂණ සම්බන්ධ සියළු කටයුතු ඉටුකිරීම.
- අධිකාරියට අවශ්‍ය සියළුම ප්‍රාග්ධන භාණ්ඩ ලිපිද්‍රව්‍ය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයෙහි ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ අංශය, රසායනික විශ්ලේෂණ අංශය හා සංවේදී රසායනාගාරය යන මූලික රසායනාගාර හා ඊට අනුබද්ධව පවතින මාධ්‍ය සැකසුම් ඒකකය, සංවේදී උපකරණ අංශය හා සේදුම් ඒකකය වැනි තත්ත්ව පාලන ඒකක සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ, රසායනික ද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය මිලදී ගැනීම.
- සේවකයින් ආයතනික පරිපාලනමය නීතිරීති වලට අවනත නොවීම යන කරුණු කාරණා වලදීත් ආයතනයේ විනය පාලනයට අවශ්‍ය සියළුම ක්‍රියා පරිපාටි සහ කම්කරු විනිශ්චය සභා කාර්මික අධිකරණයේ නීති කටයුතු සිදුකිරීම.
- ප්‍රවාහන කළමනාකරණය සම්බන්ධ සියළු කටයුතු සිදුකිරීම.
- ඉදිකිරීම්, නඩත්තු හා සේවා සම්බන්ධ සියළු කටයුතු සිදුකිරීම.
- අධිකාරියට අවශ්‍ය ආරක්ෂක සේවාව,පවිත්‍රතා සේවාව, කාර්යය මණ්ඩලය ප්‍රවාහන සේවාව ලබාගැනීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම.
- අධිකාරියේ කාර්යය මණ්ඩලය සම්බන්ධව හා රථවාහන සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධව කටයුතු සිදු කිරීම.
- වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය,ඩ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ආදී ආයතන වෙත ඉල්ලුම් කරන අවස්ථා වලදී අදාළ වාර්තා, ප්‍රගතිය සම්බන්ධ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.
- අධිකාරියේ එක් එක් අංශ වලින් ලබාගන්නා ලද දත්ත ඇසුරින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම.
- එක් එක් අංශ වලින් ලබා ගන්නා ලද තොරතුරු හා විගණකාධිපති වාර්තා ඇතුලත් කර වාර්ෂික වාර්තාව සකස්කිරීම, අදාළ අනුමැතීන් ලබා ගැනීම හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අධිකාරියේ එක් එක් අංශ වලට අදාළ වන සියළුම මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- අධිකාරියට භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.
- අධිකාරියේ ගබඩාව නිසි තොග පාලනයක් යටතේ පවත්වා ගෙන යෑම.
- අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා ආපදා ණය, යතුරුපැදි ණය, උත්සව අත්තිකාරම් ආදී ණය මුදල් ලබා දීමේ කටයුතු සිදු කිරීම.
- අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා දුම්රිය වාර ප්‍රවේශපත් හා නිවාඩු දුම්රිය බලපත්‍ර ලබා දීමේ කටයුතු සිදු කිරීම.

05. මුදල් අංශය

පොල් සංවර්ධන අධිකාරියේ මුදල් අංශය මඟින් විවිධ අංශවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමේ වගකීම දරයි. ඒ අනුව, අයවැය සහ මූල්‍ය කාර්ය සැලසුම්වලට අනුකූල වූ අනුමත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් අංශය වගකීම දරයි. වරින් වර මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා පිළියෙල කිරීම ඇතුළුව මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම වැනි කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් ද මුදල් අංශය වගකීම උසුලයි. ආයෝජන කළමනාකරණය ඇතුළුව එහි අරමුදල් භාරව කටයුතු කරන්නේ ද මුදල් අංශයයි මුළු වත්කම් පාලනය කිරීම හා සම්බන්ධයෙන් වාර්තා තබාගැනීම මුදල් අංශයේ වගකීම වේ. කළමනාකරණ අවශ්‍යතා සඳහා විවිධ මූල්‍ය වාර්තා පිළියෙල කිරීම ද මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම මෙම අංශය මඟින් සිදුකෙරේ.

5.1 සාමාන්‍ය මෙහෙයුම් කටයුතු

- 2024 වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන ලෙස රු. මිලියන 145.89ක් ලැබී ඇති අතර රු. මිලියන 425ක් අභ්‍යන්තර ආදායම් උපයා ඇත.
- සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පුනරාවර්ථන වියදම රු. මිලියන 309ක් සහ ප්‍රාග්ධන වියදම් රු. මිලියන 58.47ක් දරා ඇති අතර, ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 10.79ක් වේ. (Working progress ඇතුළුව)

5.2 ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, සැකසුම් සංවර්ධන අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය යටතේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අදාල ව්‍යාපෘතීන් සඳහා අරමුදල් වියදම් කිරීම සිදුකරන අතර, ඒ සම්බන්ධව වෙනම ගිණුම් පොත් පත් පවත්වාගෙන යාම සිදු කරයි.

2024 වර්ෂයේ දී ද පහත සඳහන් කටයුතු නිම කිරීමට අධිකාරියේ මුදල් අංශයට හැකි වී ඇත.

- අරමුදල් කළමනාකරණය සහ සංවර්ධන ව්‍යාපෘති යන වැඩසටහන් පිළිබඳ මූල්‍ය වාර්තා සැපයීම.
	කුලී වියදම්					80,085	-
	දුන්කන්නාව වියදම්					17,730	2,155,606
	මුද්දර ගාස්තු					1,274,025	1,544,754
	වාහන නැවැත්වීමේ ගාස්තුව					47,040	42,560
	ගෙවිය යුතු කාසි					887	880
	සමාජ ආරක්ෂණ බද්ද 2.5%					353,179	259,971
	වැටුප් (කොන්ත්‍රාත් පදනම)					656,624	429,805
	ප්‍රවාහනය					8,400	210,925
	සුභසාධනය					162,500	129,140
	පුවත්පත්					101,860	-
	දැන්වීම්					166,144	-
	කාර්යාල අවශ්‍යතා					29,352	110,890
	වෙනත් වියදම්					16,732	210,203
	එකතු කළ අගය මත බදු-18%					188,854	4,499,663
						29,220,661	18,077,805

	උපචිත වියදම්					**2024**	**2023**
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල					රු.	රු.
	(2024 දී පුනරාවර්තන අරමුදලට මාරු කරන ලදී)						
	විදුලිය					-	25,082
	දැන්වීම්					-	74,382
	ජලය					-	1,766
	විගණන ගාස්තු (QA &QC)					-	717,050
						-	818,280
						29,220,661	18,896,085

17	**ප්‍රදාන සහ දායක මුදල්**					**2024**	**2023**
						රු.	රු.
	භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන දායකත්වය					88,943,221	88,943,221
	භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන ප්‍රදාන					77,652,767	77,652,767
						166,595,988	166,595,988
18	**සමුච්චිත අරමුදල**					**2024**	**2023**
	පුනරාවර්තන					රු.	රු.
	2024-01-01 දිනට ශේෂය					620,529,010	437,567,783
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල					46,460,575	-
						666,989,585	437,567,783
	පෙර වර්ෂයේ ගැලපීම						
	අරමුදල භාණ්ඩාගාරයට මාරු කරන ලදී					191,734,963	-
	2023 වර්ෂයේදී ලැබුණු පරිත්‍යාගය					(2,524,897)	-
	ISO පුහුණුව අධිප්‍රතිපාදන					(665,800)	-
	ඉඩම් සහ ගොඩනැගිලි					-	2,044,170
	ලැබිය යුතු පොළිය					-	1,382,008
	ගොඩනැගිලි නඩත්තුව					-	463,943
	රසායනාගාර අවශ්‍යතා					-	178,329
						188,544,266	4,068,450
	අතිරික්තය / හිඟය					134,804,593	187,029,677
	31-12-2024 දිනට ශේෂය					613,249,912	620,529,010
	PSS තෙල් අරමුදල					**2024**	**2023**
						රු.	රු.
	01.01.24 දිනට සමුච්චිත අරමුදල					402,403,279	376,904,948
	2024 අතිරික්තය / හිඟය					(6,850)	25,498,331
						402,396,429	402,403,279
	MDF				**ජය ඉසුර අරමුදල**	**මෝල්**	**එකතුව**
					රු.	රු.	
	ඉතිරි කිරීමේ ගිණුම	28-29 පිටුව				44,000,498	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් ලැබිය යුතු					25,335	
	ප්‍රදානය කළ ජය ඉසුර ණය				213,365,980	-	
	ඉතිරි කිරීමේ ගිණුම				18,474,195	-	
	ස්ථාවර තැන්පතු				59,911,012	-	
	Pss තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)				(40,516,083)	-	
	GBO තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)				(175,133,158)	-	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල				688,597	-	
	ලැබිය යුතු පොළිය				1,991,531	-	
	2024-01-01 දිනට ශේෂය				**78,782,074**	**44,025,833**	**122,807,907**
	ඉතිරි කිරීමේ ගිණුම	28-29 පිටුව				44,544,351	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් ලැබිය යුතු					25,335	
	ප්‍රදානය කළ ජය ඉසුර ණය	42-44 පිටුව			207,886,610	-	
	ඉතිරි කිරීමේ ගිණුම				30,888,823	-	
	ස්ථාවර තැන්පතු				65,672,444	-	
	Pss තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)				(40,516,083)	-	
	GBO තෙල් අරමුදලට ගෙවිය යුතු (ණය)				(175,133,158)	-	
	ප්‍රාග්ධන සංවර්ධන අරමුදල				688,597	-	
	ලැබිය යුතු පොළිය				1,425,994	-	
	31.12.2024 දිනට ශේෂය				**90,913,226**	**44,569,686**	**135,482,913**
	MDF ඉතුරුම් මුදල් ආපසු					543,853	
	P.S.S. තෙල් අරමුදල						
	MDF ජංගම/ගිණුම						**40,516,083**

හෙළිදරව් කිරීම්

නඩු

01. SC/FR 194/2017 -

පරිපාලන නිලධාරී තනතුර සඳහා කේ.ඩබ්ලිව්. රංජිත් මහතා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ තීරණය අත්හිටුවීමට නියෝගයක් ඉල්ලා පො.සං.අ. හි සේවිකාවක් වන ප්‍රීති රේණුකා ගුණසේන විසින් මෙම නඩුව ගොනු කරන ලද අතර පෙත්සම්කරු ඒ සඳහා වියදම් ඉල්ලා සිටින ලදී.

පොල් සංවර්ධන අධිකාරිය

2024.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සඳහා සටහන්

		2024	2023
1	**ලියාපදිංචි ගාස්තුව - අලෙවි අංශය**	රු.	රු.
	පොල් මඳ නිෂ්පාදන	3,260,000	4,108,650
	ගෙඩි පොල්	5,356,000	4,547,000
	පොල් මඳ නොවන නිෂ්පාදන	7,741,700	8,915,784
	වෙනත් පොල් නිෂ්පාදන	30,000	71,500
	සැකසුම් නොකළ පොල් ගෙඩි	30,000	1,740,000
	තැඹිලි	1,250,000	2,957,680
	වෙළෙඳුන් ලියාපදිංචි කිරීම්	81,500	97,500
	වතු ලියාපදිංචිය	45,125	72,225
	තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම	28,000	34,590
	ගාස්තු නිකුත් කිරීම සඳහා විරෝධතා නොදක්වන බවට ලිපි	543,169	1,684,040
	වෙනත්	-	483
		18,365,494	24,229,452

		2024	2023
2	**ලියාපදිංචි ගාස්තුව - සැකසුම් අංශය**		
		රු.	රු.
	දිසිඳි පොල්	1,097,500	1,509,300
	නැවුම් පොල්තෙල්	1,060,000	1,136,051
	පොල්තෙල්	581,000	915,736
	කුරුටු පොල්තෙල්	170,000	202,500
	කාර්මික පොල්තෙල්	20,000	10,000
	සුදු පොල්තෙල්	480,000	532,670
	කොප්පරා මෝල්කරු	16,000	22,000
	පිරිපහදු කළ විරංජනය කළ දුර්ගන්ධීකරණය කරන ලද පොල්තෙල්	280,000	272,400
	පොල්කිරි	600,000	395,000
	පොල්කිරි පිටි	217,500	320,000
	පොල්කිරි සකසනය	60,000	57,500
	පොල් විනාකිරි	30,000	16,719
	පොල් ක්‍රීම්	332,500	327,500
	පොල්කිරි ආශ්‍රිත නිෂ්පාදනය	122,500	190,000
	පොල් බටර්	192,500	157,500
	පොල් තැවරුම	105,000	87,500
	පොල් ඇම්නෝ	122,500	108,000
	පොල් පිටි	385,000	294,000
	පොල් ක්‍රීම්	297,500	265,000
	පොල් සීනි	157,500	140,000
	පොල් සිරප්	52,500	35,000
	පොල් මඳ කැබලි	157,500	105,000
	ශීත කළ ගාන ලද පොල්	105,000	70,000
	පොල් මෘදු ජෙල්	-	6,000
	පොල් පැණි	44,500	24,000
	දිසිඳි පොල් නැවත ඇසුරුම්කරණය	315,000	239,700
	පොල්තෙල් නැවත ඇසුරුම්කරණය	35,000	17,500
	පොල් වතුර	480,000	495,000
	කොහු මෝල්	367,000	259,951
	කොහුබත් උපස්ථරය	1,537,500	1,370,650
	පොල් කොහු	205,000	111,500

කැපූ කොහු / වර්ණය / FMT		51,500	100,000
සක්‍රිය කාබන්		180,000	180,000
පොල් කටු අඟුරු		54,805	101,100
සම්පීඩනයෙන් කුට්ටි කරගත් පොල් කටු අඟුරු		118,805	45,000
පොල් කටු කැබලි සහ කුඩු		9,000	17,000
විසිතුරු නිෂ්පාදන		10,500	24,000
කොසු සහ ඉදල්		13,000	92,000
කොහු ලණු /කොහු තූල්		321,000	246,000
පොල් රා		10,000	10,500
Mct පොල්තෙල්		60,000	60,000
Mct තෙල් කුඩු		40,000	85,000
පොල්වලින් සාදන ලද මධ්‍යසාර		100,000	80,000
පොල් කටු අඟුරු කැබලි		9,000	9,000
පොල් ලෙලි		48,000	52,500
මධ්‍යස්ථාන ක්‍රියාකරු		25,000	-
පොල් සම්බෝල		20,000	10,000
පොල් චිප්ස්/පොල් පිටි		87,500	20,000
පොල් කොහු ආශ්‍රිත නිපයුම්කරු පොකුර		10,000	-
පොල් ජෑම්		17,500	-
පොල් වතුර කුඩු		17,500	-
නැවුම් පොල්තෙල්		20,000	-
නැවුම් තෙල් කුඩු		35,000	-
කුරුට්ට සහිත පොල් මදයෙන් සාදන ලද පොල් තෙල්		10,000	-
කුරුට්ට සහිත පොල් මදයෙන් සාදන ලද නැවුම් පොල් තෙල්		60,000	-
කොහුබත් කුඩු		15,000	-
තැඹිලි වතුර		400,000	100,000
පොල් ක්‍රීම් සකසනය		-	20,000
		11,369,110	10,945,777

3	රසායනාගාර ආදායම	2024	2023
		රු.	රු.
	DC සාම්පල ලබා ගැනීමේ සහ පරීක්ෂණ ගාස්තු	4,519,436	29,184,004
	PDDC සාම්පල පරීක්ෂණ ගාස්තු	992,600	1,183,010
	DC නැවත ඇසුරුම් කිරීමේ සාම්පල පරීක්ෂණ ගාස්තු	-	853,972
	තත්ත්ව සහතික පරීක්ෂණ ගාස්තු	3,647,974	2,517,125
	ජල සාම්පල පරීක්ෂණ ගාස්තු	80,366	1,547,120
	කොහු කෙඳි පරීක්ෂණ ගාස්තු	8,217,578	3,842,658
	පොල්තෙල් පරීක්ෂණ ගාස්තු	25,352,015	5,984,250
	පොල් කිරි පරීක්ෂණ ගාස්තුව	216,289	1,217,861
	පොල් කටු අඟුරු පරීක්ෂණ ගාස්තුව	110,515	16,582
	පුන්නක්කු සාම්පල පරීක්ෂණ ගාස්තුව	13,300	34,755
	R.B.D. පොල්තෙල් පරීක්ෂණ ගාස්තුව	1,286,300	3,712,400
	සුදු පොල්තෙල් පරීක්ෂණ ගාස්තුව	1,961,234	25,155
	VCO පරීක්ෂණ ගාස්තුව	143,694	649,910
	WCO පරීක්ෂණ ගාස්තු	-	185,000
	උපස්ථර සාම්පල පරීක්ෂණ ගාස්තුව	19,150	2,439,898
	කොප්පරා සාම්පල පරීක්ෂණ ගාස්තු	6,905	27,650
	හදිසි ගාස්තු	-	1,414,303
	පොල් කිරිපිටි පරීක්ෂණ ගාස්තු	14,400	235,992
	තැඹිලි වතුර පරීක්ෂණ ගාස්තු	56,650.00	176,150
	පොල් සීනි පරීක්ෂණ ගාස්තු	148,450.00	44,750
	දිසිඳි පොල් දෛනික පරීක්ෂණ ගාස්තු	31,453,240	-
	වගා බෑග් පරීක්ෂණ ගාස්තු	-	37,650

පොල් ලෙලි සාම්පල පරීක්ෂණ ගාස්තු		-	182,850
ආපසු හරවා එවූ තොග පරීක්ෂණ ගාස්තු		-	867,523
පොල් ඇමිනෝ සහ සිරප් පරීක්ෂණ ගාස්තු		442,595.00	-
සක්‍රීය කාබන් පරීක්ෂණ ගාස්තු		-	2,555
පොල් ක්‍රීම් පරීක්ෂණ ගාස්තු		-	717,765
		78,682,691	57,100,888

4	විවිධ ආදායම	2024	2023
		රු.	රු.
	ටෙන්ඩර් ගාස්තුව	19,500	-
	නිවේදන පත්‍රිකා විකිණීම	94,000	58,490
	ප්‍රදර්ශන කුටි ගාස්තු	112,826	110,191
	විවිධ ආදායම	1,736,419	643,007
	ලේබල් පොත් සහ ස්ටිකර් ගාස්තු	4,777,745	8,550,939
		6,740,490	**9,362,627**

5	වෙන්දේසි ආදායම	2024	2023
		රු.	රු.
	තොග ගාස්තු ආදායම - කොප්පරා සහ ගෙඩි පොල්	1,083,463	1,443,498
	අඩු කළා: වෙන්දේසි ගාස්තුව	198,000	163,533
	සන්නිවේදන වියදම්	56,850	31,279
	වෙනත්	142,060	130,945
		396,910	325,757
		686,552	1,117,741

6	දුන්කන්නාව පොල් වත්ත	2024	2023
		රු.	රු.
	පොල්, කෙඳි සහ පැළ විකිණීම	3,888,111	6,136,593
	අඩු කළා: වියදම්		
	වැටුප් සහ වේතන	1,486,997	1,405,879
	සේ.අ.අ. සහ සේ.භා.අ.	469,842	628,410
	පොහොර	857,276	684,619
	විදුලිය	42,731	74,620
	රක්ෂණ	17,351	4,013
	අලුත්වැඩියාව, නඩත්තුව සහ අනෙකුත්	38,400	1,150,914
	ඇඳගෙන යෑමේ වියදම්	331,410	280,000
	දුරකථන	-	673
		3,244,007	4,229,127
		644,104	1,907,466

2024/04/04 දිනැති අංක 624/19/2024 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, පොල් ගෙඩි 6733 ක් පරිත්‍යාගයක් ලෙස කාර්ය මණ්ඩලයට බෙදා දෙන ලදී.

6.1	දුන්කන්නාව පොල් ආදර්ශ කම්හල	2024	2023
		රු.	රු.
	මුරකරුවන්ගේ වැටුප	1,072,684	892,092
	සේ.අ.අ. සහ සේ.භා.අ.	172,514	139,444
	විදුලිය	166,118	169,924
	රක්ෂණ	17,351	-
		1,428,667	1,201,460

7	*පොලී ආදායම*	2024	2023
		රු.	රු.
	පුනරාවර්තන		
	ස්ථාවර තැන්පතු සඳහා පොලිය	42,302,051	42,302,051
	කාර්ය මණ්ඩල ණය සඳහා පොලිය	1,155,461	1,155,461
	භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය		
	ආයෝජන සඳහා පොළිය -ඉතුරුම් ගිණුම්	5,314,770	5,314,770
		48,772,283	48,772,283

ප්‍රාග්ධන සංවර්ධන අරමුදල	2024	2023
	රු.	රු.
ස්ථාවර තැන්පතු සඳහා පොලිය	-	-

P.S.S. තෙල් අරමුදල	2024	2024
	රු.	රු.
බැංකු ණය පොලී ආදායම	837	837
භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය	1,985,520	1,985,520
ස්ථාවර තැන්පතු සඳහා පොලිය	35,111,594	35,111,594
ඉතිරි කිරීමේ ගිණුම් සඳහා පොලිය	125,791	125,791
	37,223,741	**37,223,741**

MDF අරමුදල	2024	2023
	රු.	රු.
ස්ථාවර තැන්පතු සඳහා පොලිය	5,195,895	9,176,898
බැංකු ණය සඳහා පොලිය	6,456,871	5,856,422
ඉතිරි කිරීමේ ගිණුම් සඳහා පොලිය	500,578	307,842
	12,153,343	**15,341,162**
	98,149,367	**101,337,186**

8	මෙහෙයුම් වියදම්	2024	2023
		රු.	රු.
	පුද්ගල පාරිශ්‍රමික		
	වැටුප් සහ වේතන	88,238,947	*94,886,713*
	ජීවන වියදම සහ අනෙකුත් දීමනා	35,963,051	*17,141,129*
	නිවාඩු දින ගෙවීම්	298,229	*413,157*
	සේ.අ.අ.	18,737,727	*16,855,339*
	සේ.භා.අ.	3,641,827	*3,196,720*
	වෘත්තීය දීමනාව	1,053,809	*1,038,000*
	ඉන්ධන සහ වාහන දීමනාව	2,090,659	*2,991,311*
	භාෂා / අතුරු දීමනාව	6,930	*688,414*
	දුරකථන දීමනාව	594,402	*1,111,979*
	වැඩ බැලීමේ දීමනාව	23,284	-
	මාසික දීමනාව	10,829,586	*10,975,522*
	ප්‍රසාද දීමනාව	4,500,000	
	අතිකාල	11,181,629	*9,713,614*
	රක්ෂණ - වෛද්‍ය	8,584,724	*7,236,452*
	පුහුණු සහ සම්මන්ත්‍රණ	1,235,622	*906,111*
	සුභසාධන වියදම්	5,504,071	*6,037,260*
	සාමාජිකත්වය සඳහා දායකත්වය	-	*4,500*
		192,484,497	173,196,220

ගමන් වියදම්		
ගමන් වියදම් (දේශීය)	12,081,376	*10,496,096*
වාහන නැවැත්වීමේ ගාස්තු	574,760	*542,850*
	12,656,136	11,038,946
සැපයුම් සහ අවශ්‍යතා		
ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍යතා	8,061,427	*12,734,712*
ඉන්ධන සහ ලිහිසි තෙල්	8,221,247	*10,281,172*
රසායනාගාර රසායනික ද්‍රව්‍ය අනෙකුත් පරිභෝගික භාණ්ඩ	22,394,128	*26,201,542*
වෙනත් අවශ්‍යතා	1,400,222	*1,203,171*
නිල ඇඳුම්	468,779	*939,635*
	40,545,804	51,360,232
අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව		
වාහන	10,679,640	*15,538,074*
යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ	5,078,886	*5,692,174*
ව්‍යුහයන් / ගොඩනැගිලි	15,225,212	*6,250,248*
	30,983,738	27,480,496
ප්‍රවාහනය, සන්නිවේදනය, උපයෝගිතා සහ අනෙකුත් සේවා		
ප්‍රවාහනය	3,819,000	*3,982,150*
තැපැල් ගාස්තු සහ මුද්දර ගාස්තු	357,167	*420,411*
සන්නිවේදන	2,948,796	*2,414,496*
විදුලිය	10,581,068	*11,745,786*
ජලය	1,497,612	*1,248,960*
රක්ෂණ - වාහන, ගිනි, පුද්ගලික අනතුරු	427,680	*1,741,553*
ආරක්ෂක සේවා	3,902,560	*3,243,941*
පිරිසිදු කිරීමේ සේවා	4,190,561	*3,580,764*
නීති ගාස්තු	277,200	*63,700*
විගණන ගාස්තු	329,160	*600,000*
සහරා සඳහා වෙළඳ දැන්වීම් / දායක මුදල්	2,543,878	*2,261,021*
සංග්‍රහ වියදම්	778,727	-
ගිණුම්කරණ පැකේජ නඩත්තු වියදම්	337,342	-
	31,990,751	31,302,782
බදු සහ අනෙකුත් බදු		
මුද්දර ගාස්තු	21,750	*16,550*
වරිපනම් සහ බදු	1,559,380	*1,559,380*
	1,581,130	1,575,930
වෙනත් වියදම්		
සභාපතිවරයාගේ සංග්‍රහ වියදම් සහ අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	234,278	*999,543*
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනාව	944,000	*688,096*
විගණන සහ කළමනාකරණ රැස්වීම් දීමනාව සහ ප්‍රවාහන දීමනාව	52,000	*166,000*
පුවත්පත්	366,510	*516,860*
වෙනත් වියදම්	-	*348,653*
ප්‍රාදේශීය කාර්යාල වියදම්	118,963	*101,842*
	1,715,751	2,820,994
	311,957,805	*298,775,600*

පොල් සංවර්ධන අධිකාරිය
මෝල් ඉතුරුම් ගිණුම - 2024

මෝල් අංකය	ගිණුම් අංකය		2024.01.01 දිනට ශේෂය	2024 පොළිය	ආපසු ගැනීම්	2024 සඳහා බදු	2024.12.31 දිනට ශේෂය
M 62	1-0065-30-0926-2	ඩෙසිකෝ ලංකා (පුද්ගලික) සමාගම.	416,431.50	11,824.35		591.22	427,664.63
M 63	1-0065-30-0928-9	හලාවත ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස්	1,073,443.61	30,491.62		1,524.58	1,102,410.65
M 64	1-0065-30-0929-7	රත්කරවිව ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස්	678,979.41	19,276.81		963.84	697,292.38
M 67	1-0065-30-0932-7	මාරවිල කොකනට් ප්‍රොඩියුසස් සී.එස්. සමාගම.	210,672.52	6,010.65		300.53	216,382.64
M 69	1-0065-30-0933-5	බදුවත්ත මිල්ස් (පුද්ගලික) සමාගම.	1,074,714.93	30,514.04		1,525.70	1,103,703.27
M 71	1-0065-31-8518-4	මාදම්පේ මිල්ස්	684,246.09	19,436.47		971.82	702,710.74
M 72	1-0065-30-0935-1	සෙන්ට් ජෝසප් ඩී.සී. මැනුෆැක්චර්ස් (පුද්ගලික) සමාගම.	403,591.84	11,456.75		572.84	414,475.75
M 75	1-0065-30-0936-0	සිරියන්ගනී ඩී.සී. සහ ෆයිබර් මිල්ස්	835,167.58	23,711.32		1,185.57	857,693.33
M 76	1-0065-30-0937-8	එස්. ඒ. සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා (පුද්ගලික) සමාගම.	2,958,493.33	83,994.01		4,199.70	3,038,287.64
M 77	1-0065-30-0938-6	සෙන්ට් ඇන්ස් ෆැක්ටරි	447,287.32	12,715.87		635.79	459,367.40
M 79	1-0065-30-0939-4	ෆාතිමා මිල්ස් ලිමිටඩ්	525,162.57	14,910.77		745.54	539,327.80
M 80	1-0065-30-0940-8	දුනගහ සී.පී.සී.එස්. සමාගම.	1,976,629.95	56,140.55		2,807.03	2,029,963.47
M 84	1-0065-30-2204-8	සොනික් එක්ස්පෝ (පුද්ගලික) සමාගම. (සොන්ලැක් (පුද්ගලික) සමාගම.)	1,313,385.33	37,300.06		1,865.00	1,348,820.39
M 85	1-0065-30-0941-6	මොඩර්න් ෆුඩ් ෆැක්ටරි (විවි ප්ලාන්ටේෂන්)	503,902.76	14,311.42		715.57	517,498.61
M 86	1-0065-30-0942-4	ජේ.පී.එම්. පින්ටෝ ඇන්ඩ් කම්පැණි (පුද්ගලික) සමාගම	652,560.68	4,470.87	627,560.68	223.54	29,247.33
M 87	1-0065-30-0943-2	සෙන්ට් වැලන්ටයින් ඩී.සී. ෆැක්ටරි	761,237.61	21,625.81		1,081.29	781,782.13
M 88	1-0065-30-0945-9	සෙන්ට් විස්ටෝපර් ඩී.සී. මිල්ස්	720,324.14	20,455.74		1,022.79	739,757.09
M 89	1-0065-30-0946-7	කුඩවැව මිල්ස්	924,394.51	26,252.80		1,312.64	949,334.67
M 90	1-0065-30-0947-5	නඩුන්ගමුව මිල්ස්	57,072.88	1,654.21		82.71	58,644.38
M 91	1-0065-30-0948-3	සඳලංකා සී.පී.සී.එස්. සමාගම	1,091,743.15	31,003.33		1,550.17	1,121,196.31
M 93	1-0065-30-0949-1	ග්‍රීන් පාම් ඩී.සී. මිල්ස්	1,977,684.21	56,185.52		2,809.28	2,031,060.45
M 94	1-0065-30-0950-5	සිරිකත ඩී.සී. මිල්ස්	634,841.69	18,033.75		901.69	651,973.75
M 95	1-0065-30-0951-3	බෙලිගල කොකනට් ප්‍රොඩියුසර්ස් (සී.බී.එල්. කොකෝස්)	1,417,147.06	40,241.26		2,012.06	1,455,376.26
M 98	1-0065-30-0953-0	එච්.සී.ඊ. සොයිසා සහ සමාගම (සෙරන්ඩිබ් සුපර් ෆුඩ්ස්)	1,327,717.06	37,689.98		1,884.50	1,363,522.54
M 102	1-0065-34-3528-8	නාරා කොකෝ (පුද්ගලික) සමාගම	359,202.51	10,200.82		510.04	368,893.29
M 103	1-0065-30-0957-2	සෙන්ට් තෙරේසා ඩී.සී. මිල්ස්	95,706.16	2,737.39		136.87	98,306.68
M 105	1-0065-30-0959-9	ඩයි ඇන්ඩ් ඩු රාජපක්ෂ (හේනේගම මිල්ස්)	61,641.75	1,749.74		87.49	63,304.00
M 107	1-0065-30-0960-2	චන්ද්‍රා ඩී.සී. ෆයිබර් සහ ටයිල් මිල්ස්	277,765.08	7,888.65		394.43	285,259.30
M 108	1-0065-30-0962-9	බත්තුලුඔය මිල්ස්	444,672.83	12,626.84		631.34	456,668.33
M 110	1-0065-30-0964-5	උණගහදෙණිය මිල්ස් (රේණුකා ඇග්‍රි ඔර්ගනික්ස්)	1,050,252.99	29,825.85		1,491.29	1,078,587.55

M 111	1-0065-30-0965-3	කුඩිරිජ්පුව ඩී.සී. මිල්ස්	1,052,409.95	29,874.74		1,493.74	1,080,790.95
M 113	1-0065-30-0967-0	බැලුම්මහර ඩී.සී. මිල්ස්	154,053.04	4,388.29		219.41	158,221.92
M 114	1-0065-30-1243-3	නාත්තන්ඩිය මිල්ස් (පුද්ගලික) සමාගම	867,655.36	24,641.91		1,232.10	891,065.17
M 115	1-0065-30-0968-8	බෝගමුව ඩී.සී. මිල්ස්	54,835.16	1,561.86		78.09	56,318.93
M 119	1-0065-30-0970-0	මාතම්මන ඩී.සී. මිල්ස්	1,595,482.62	45,298.53		2,264.93	1,638,516.22
M 120	1-0065-30-0971-8	ෆානිමා ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස්	150,995.12	4,292.88		214.64	155,073.36
M 122	1-0065-30-0972-6	සෙන්ට් ජෝසප් ඩී.සී. ඇන්ඩ් ෆයිබර් මිල්ස්	1,637,686.08	46,502.75		2,325.14	1,681,863.69
M 124	1-0065-30-0973-4	මිනුවන්ගොඩ මිල්ස්	109,228.14	3,105.26		155.26	112,178.14
M 126	1-0065-30-0974-2	ඩේවිඩ් ඩී.සී. මිල්ස් (ලක්ෂ්මි ඩී.සී. මිල්ස්)	1,071,799.14	30,445.20		1,522.26	1,100,722.08
M 127	1-0065-30-0976-9	වික්ටෝරියා ඩී.සී. මිල්ස් (ඩබ්ලිව්.එම්. ප්‍රනාන්දු ඇන්ඩ් සන්ස්)	936.55	29.42		1.47	964.50
M 130	1-0065-30-0978-5	බෝයගනේ ඩී.සී. මිල්ස් (පුද්ගලික) සමාගම	764,896.15	21,721.89		1,086.09	785,531.95
M 131	1-0065-30-0979-3	ජයකොඩි ඩී.සී. මිල්ස් (පුද්ගලික) සමාගම	141,124.82	4,017.14		200.86	144,941.10
M 132	1-0065-30-0980-7	ඒෂියන් ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගම	1,573,546.82	44,683.55		2,234.18	1,615,996.19
M 133	1-0065-34-3527-0	උපාලි ඩී.සී. මිල්ස්	128,063.55	3,635.80		181.79	131,517.56
M 134	1-0065-30-0981-5	ගුණවර්ධන ඩී.සී. මිල්ස්	1,092,250.30	31,017.56		1,550.88	1,121,716.98
M 136	1-0065-30-0982-3	වෙල්වින් ඩී.සී. මිල්ස්	490,962.10	13,947.03		697.35	504,211.78
M 138	1-0065-30-0984-0	කම්මල්පත්තු සී.පී.සී.එස්. ලිමිටඩ්	1,076,195.53	30,576.28		1,528.81	1,105,243.00
M 139	1-0065-31-0919-4	සංහිඳ මිල්ස් (පුද්ගලික) සමාගම	898,894.65	25,519.66		1,275.98	923,138.33
M 144	1-0065-31-2830-0	ස්වානි මිල්ස් ලිමිටඩ්	1,430,359.01	40,608.98		2,030.45	1,468,937.54
M 145	1-0065-31-8981-3	දුනගහ සී.පී.සී.එස්. ලිමිටඩ්	1,366,964.84	39,281.08		1,964.05	1,404,281.87
M 148	1-0065-32-9122-7	ආර්.එම්.පී. කොකනට් ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගම	736,234.07	19,795.23		989.76	755,039.54
M 149	1-0065-34-3526-1	මවික්සාල් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම	1,299,881.34	36,907.93		1,845.40	1,334,943.87
M 150	1-0065-34-4854-1	එන්ඩීසී එක්ස්පෝර්ට් (පුද්ගලික) සමාගම	629,651.97	16,760.84		838.04	645,574.77
M 151	1-0065-34-4855-0	වයඹ ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස්	406,609.23	10,823.08		541.15	416,891.16
M 152	1-0065-34-7387-2	සන්මික් ෆුඩ් (පුද්ගලික) සමාගම	61,471.82	1,744.94		87.25	63,129.51
M 153	1-0065-34-7389-9	නාවික් මිල්ස් (පුද්ගලික) සමාගම	209,197.70	5,938.41		296.92	214,839.19
M 155	1-0065-34-8482-3	වගුරුවෙල ඔයිල් මිල්ස් (පුද්ගලික) සමාගම	38,904.36	1,094.45		54.72	39,944.09
M 156	1-0065-34-9029-7	වී.එස්.එස්. ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගම	4,135.24	114.85		5.74	4,244.35
			44,000,497.71	**1,233,066.79**	**627,560.68**	**61,653.32**	**44,544,350.50**

පොල් සංවර්ධන අධිකාරිය
මෙහෙයුම් වියදම්

*සටහන අංකය - **8***

රු.

2023	***2024***	***විස්තරය***	***උප එකතුව***	***2024***
තථ්‍ය	*ඇස්තමේන්තුගත*			*එකතුව*
		පුද්ගලික පාරිශ්‍රමික		*රු.*
94,886,713	*110,000,000*	වැටුප් සහ වේතන	*88,238,947*	
17,141,129	*48,060,000*	ජීවන වියදම් සහ අනෙකුත් දීමනා	*35,963,051*	
413,157	*500,000*	නිවාඩු දින ගෙවීම්	*298,229*	
16,855,339	*23,709,000*	සේ.අ.අ.	*18,737,727*	
3,196,720	*4,742,000*	සේ.හා.අ.	*3,641,827*	
1,038,000	*1,940,000*	ඍත්තීය දීමනාව	*1,053,809*	
2,991,311	*2,400,000*	ඉන්ධන සහ වාහන දීමනාව	*2,090,659*	
688,414	*10,000*	භාෂා / අතුරු දීමනාව	*6,930*	
1,111,979	*600,000*	දුරකථන දීමනාව	*594,402*	
-	*50,000*	වැඩ බැලීමේ දීමනාව	*23,284*	
10,975,522	*12,000,000*	මාසික දීමනාව	*10,829,586*	
	-	ප්‍රසාද දීමනාව	*4,500,000*	
9,713,614	*9,700,000*	අතිකාල	*11,181,629*	
7,236,452	*10,000,000*	රක්ෂණ - වෛද්‍ය	*8,584,724*	
906,111	*4,000,000*	පුහුණු සහ සම්මන්ත්‍රණ	*1,235,622*	
6,037,260	*7,000,000*	සුභසාධන වියදම්	*5,504,071*	
4,500	*1,200,000*	සාමාජික දායකත්වය	-	
	235,911,000			***192,484,497***
		ගමන් වියදම්		
10,496,096	*12,000,000*	ගමන් වියදම් (දේශීය)	*12,081,376*	
542,850	*720,000*	වාහන නැවැත්වීමේ ගාස්තු	*574,760*	
	12,720,000			***12,656,136***
		සැපයුම් සහ අවශ්‍යතා		
12,734,712	*9,000,000*	ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍යතා	*8,061,427*	
10,281,172	*10,000,000*	ඉන්ධන සහ ලිහිසි තෙල්	*8,221,247*	
26,201,542	*24,000,000*	රසායනාගාර රසායනික ද්‍රව්‍ය අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	*22,394,128*	
1,203,171	*2,000,000*	වෙනත් අවශ්‍යතා	*1,400,222*	
939,635	*900,000*	නිල ඇඳුම්	*468,779*	
	45,900,000			***40,545,804***
		අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව		
15,538,074	*10,000,000*	වාහන	*10,679,640*	
5,692,174	*6,000,000*	යන්ත්‍රෝපකරණ කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ	*5,078,886*	
6,250,248	*7,000,000*	ව්‍යුහයන් / ගොඩනැගිලි	*15,225,212*	
	23,000,000			***30,983,738***
		ප්‍රවාහනය, සන්නිවේදනය, උපයෝගිතා සහ අනෙකුත් සේවා		
3,982,150	*5,000,000*	ප්‍රවාහනය	*3,819,000*	
420,411	*400,000*	තැපැල් ගාස්තු සහ මුද්දර ගාස්තු	*357,167*	
2,414,496	*2,600,000*	සන්නිවේදනය	*2,948,796*	
11,745,786	*14,000,000*	විදුලිය	*10,581,068*	
1,248,960	*3,000,000*	ජලය	*1,497,612*	
1,741,553	*7,000,000*	රක්ෂණ -වාහන, ගිනි, පුද්ගලික අනතුරු	*427,680*	
3,243,941	*5,000,000*	ආරක්ෂක සේවා	*3,902,560*	
3,580,764	*5,000,000*	පිරිසිදු කිරීමේ සේවා	*4,190,561*	
63,700	*1,000,000*	නීති ගාස්තු	*277,200*	
600,000	*1,000,000*	විගණන ගාස්තු	*329,160*	
2,261,021	*1,500,000*	සහරා සඳහා වෙළඳ දැන්වීම්/ දායක ගාස්තු	*2,543,878*	
	500,000	සංග්‍රහ වියදම්	*778,727*	
	-	ගිණුම්කරණ පැකේජ නඩත්තු වියදම්	*337,342*	
	46,000,000			***31,990,751***
		බදු සහ අනෙකුත් බදු		
16,550	-	මුද්දර ගාස්තු	*21,750*	
1,559,380	*2,000,000*	වරිපනම් සහ බදු	*1,559,380*	
	2,000,000			***1,581,130***
		වෙනත් වියදම්		
999,543	*1,050,000*	සභාපති සංග්‍රහ සහ අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	*234,278*	
688,096	*1,750,000*	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනාව	*944,000*	
166,000	*200,000*	විගණන සහ කළමනාකරණ රැස්වීම් දීමනාව සහ	*52,000*	
516,860	*500,000*	පුවත් පත්	*366,510*	
348,653	*2,000,000*	වෙනත් වියදම්		
101,842	*1,000,000*	ප්‍රාදේශීය කාර්යාල වියදම්	*118,963*	
	6,500,000			***1,715,751***
298,775,600	***372,031,000***	**මුළු වියදම**		***311,957,805***

06. අභ්‍යන්තර විගණන අංශය

6.1 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වාර්තාවන්

2024 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම, අධිකාරියේ ක්‍රියාකාරී අංශ වන සැකසුම් සංවර්ධන අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයන්හි ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි සහ ඊට අමතරව පරිපාලන අංශය සහ මුදල් අංශ වල කටයුතු ආවරණය වන ආකාරයට සකස් කර හා විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය මත ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, අනුමත කරන ලද විගණන සැලැස්ම පරිදි විගණන පරීක්ෂාවන් සිදුකර 2024 වර්ෂය තුළ වාර්තාවන් 20ක් ඉදිරිපත් කරන ලදී. කළමනාකාරීත්වය විසින් පවරන ලද විශේෂ විමර්ශනයන් වර්ෂය තුළ සිදුකරන ලද අතර, එම විමර්ශන වලට අදාළ වාර්තාවන් 10ක් එම වර්ෂය තුල කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කර ඇත.

6.2 විගණන හා කළමනාකරණ කමිටුව

6.2.1 සංයුතිය

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් 2021.11.16 දිනැතිව නිකුත්කර ඇති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳව මාර්ගෝපදේශය නම් වූ චක්‍රලේඛය ප්‍රකාරව පොල් සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇති අතර එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව එම කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම සිදුකෙරේ. විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩලය, අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත වේ. 2024 වර්ෂයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන්, කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

1. එන්.එස්. වනසිංහ මයා - අමාත්‍යාංශ නියෝජිත (කමිටු සභාපති)

2. පී.එස්. නිලංකි මිය - මුදල් අමාත්‍යාංශ නියෝජිත

3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයකු සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, 2024 වර්ෂයේ පවත්වන ලද සියළුම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා නිරීක්ෂකවරුන් ලෙස සහභාගි වී ඇති කමිටුවෙහි, අධිකාරියේ කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. අධිකාරියේ සභාපතිතුමා, ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගීවී ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල්තුමා, ආරාධනයෙන් වර්ෂයේ එක් රැස්වීමක් සඳහා සහභාගි වී ඇත. කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගිත්වය කමිටුවට අවශ්‍ය වූ විට, රැස්වීම සඳහා සහභාගිවීමට ආරාධනා කරනු ලබයි.

6.2.2 කමිටුවෙහි කාර්යභාරය

- අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය කරමින් කමිටු උපදෙස් සහ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලීම.
- පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම සහ ආකෘති ඇතුළුව අන්තර්ගතය සමාලෝචනය කිරීම.
- වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සහ සැලැස්මේ සියලුම ප්‍රධාන වෙනස්කම් අනුමත කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මූලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියාමාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා‍ හා බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.
- නියාමන, මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගත වීම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපටිපාටීන් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

6.2.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් දිනයන්හිදී සියලුම සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී.

- 2024.03.07
- 2024.06.13
- 2024.09.10

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු වලට අදාළව 2024 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සැළකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලැබූ අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කර, වැඩිදුරටත් විගණනයට භාජනය කලයුතු ක්ෂේත්‍රයන් පිළිබඳ උපදෙස් දීම සහ විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම මණ්ඩලීය අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- 2023 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අභ්‍යන්තර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම
- අනාගතයේදී නැවත සිදුවීම් වළක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයාගැනීම් හා ඒවා සඳහා කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.

බාහිර විගණනය

- 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම්වලට අදාළව පිළිතුරු යැවීමේ ප්‍රගතිය ඇගයීම සහ කළමනාකරණය විසින් දක්වන ලද පිළිතුරු සමාලෝචනයට ලක් කරන ලද අතර, විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටළු නැවත ඇතිවීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී.

- 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 2018 අංක 19 දරණ විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර වාර්තාව සහ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහිත එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන ලද විස්තරාත්මක විගණකාධිපති වාර්තාව මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කමිටුව විසින් අවධානය යොමුකල අතරෙ එම කරුණුවලට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් සිදුකර ඇත.
- 2023.07.06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කමිටු රැස්වීමේදී ලබාදී ඇති නිර්දේශ පිළිබඳව සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව කමිටුව විසින් අවධානය යොමු කොට ඇති අතර, ඒවා සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකරන ලදී.

මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී මණ්ඩලයට සහය වන ලදී.
- සංකීර්ණ හෝ අදාළ රෙගුලාසි ප්‍රමිත වලින් බැහැර ඇතුළු සැලකිය යුතු ගිණුම්කරණ සහ වාර්තා කිරීමේ ගැටළු සමාලෝචනය කිරීම හා ඊට අදාළ නිර්දේශ ලබාදීම සිදු කරන ලදී.

රැස්වීම් වාර්තා / මණ්ඩලයට වාර්තා කිරීම්

කමිටු පැවැත්වීම පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා අභ්‍යන්තර විගණන අංශය මඟින් පවත්වාගෙන යනු ලැබේ රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කරගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබාගනු ලැබේ.

සැලකිය යුතු කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ. අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ඇත.

07. විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිජ්එල්/එෆ්/සීඩීජ්/01/2024/16 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 29 දින

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொலதுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්ත්වාංගණනය කළ මතය සඳහා පදනම

(අ) 2024 වර්ෂය තුළ පැවැත්වූ ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ 60 වන සංවත්සර සැමරුම වෙනුවෙන් 2025 වර්ෂයේදී ගෙවන ලද රු.5,241,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස උපචිත කර නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ 60 වන සංවත්සර සැසිවාරය සඳහා අධිකාරිය විසින් 2024 අගෝස්තු 7 දින අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ රු.7,000,000 ක් වූ වියදමට අදාළ වියදම් විස්තරයක් හා අදාළ බිල්පත් ඉදිරිපත් කර නොතිබූ බැවින් එම වියදමෙහි නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් තැන්පතු ශේෂය රු.2,833,390 ක් සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් හඳුනා ගත් ශේෂයක් ලෙස සලකා වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද ඊට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ගිණුම්ගත කිරීම්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) රු. 1,250,000 ක විදුලි තැන්පතු මුදල් සඳහා සමුච්චිත වර්ෂයට අදාල රු.312,625 ක් වූ පොලිය ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2023 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු.2,524,897 ක දේපල පිරියත හා උපකරණ 2024 වර්ෂයේ දී ගිණුම්ගත කර තිබුණද 2023 වර්ෂයට අදාළ රු.252,490 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රයෝජනවත් ජීව කාලය අවසන් වූ රු.2,096,164 ක දේපල පිරියත හා උපකරණ සම්බන්ධව හෙළිදරව් කිරීමට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 වගන්තිය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අඩු වශයෙන් සෑම වාර්ෂික වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේ සමාලෝචනය කිරීම සහ අපේක්ෂිත තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වේ නම් එම වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 – "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි" ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම් ගත කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

(උ) 2024 දෙසැම්බර් 31 දිනට සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අධිකාරියට අයවිය යුතු මුදල රු.400,506 වුවත් එය රු.191,555 ක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් ලැබිය යුතු වටිනාකම් රු.208,951 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) නිලධාරිනියකට ගෙවිය යුතු රු.290,460 ක විශ්‍රාම පාරිතෝෂික වටිනාකම් ගිණුම්ගතකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ-වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. චෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) යන ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33 (4) වගන්තිය	පොල් පිළිබඳ සෙස් බද්ද පැනවීම, අය කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි වුවද ඒ සම්බන්ධයෙන් කිසිදු නියෝගයක් මේ දක්වා සකස් කර නොතිබුණි. කිසිදු නියෝගයක් සෑදීමකින් තොරව 2007 වර්ෂය දක්වා මෝල් සංවර්ධන අරමුදලට ලද සෙස් ආදායමින් හා ඊට පසු වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රදානවලින් ලැබූ අපනයනය කරන දිසිදි පොල් කි. ග්‍රෑ 1 කට ශත 20 බැගින් ලද මුදලක් උපයෝගී කරගෙන අපනයනය කරන මෝල් හිමියන් නමින් ගිණුම් පවත්වාගෙන ගොස් නිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ මෝල් හිමියන් නමින් ගිණුම් 58 ක රු.44,544,351 ක ශේෂයක් වූ අතර 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එම ගිණුම් වලින් රු.12,442,516 ක මුදලක් එම මෝල් හිමියන් වෙත ආපසු ගෙවා නිබුණි.
(ආ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 20 (ඒ) වගන්තිය	ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වයන් නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් සිදු කළ හැකි වුවත් ඇසුරුමක් රහිතව දේශීය වෙළඳපළට ඉදිරිපත් කරන පොල්තෙල් වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට අවශ්‍ය නියෝග සකස් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව අනුව නාගරික ප්‍රදේශවලින් බැහැරව ග්‍රාමීය ප්‍රදේශ වල අලෙවි කරන පොල්තෙල් නියාමනය නොකිරීම හේතුවෙන් ඒවායේ ඇෆ්ලටොක්සින් අඩංගු වීම පිළිබඳ අනතුරු හඟවා

තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබූ අතර ඇසුරුමක් රහිත පොල්තෙල් වෙලඳපලට පැමිණීම වැළැක්වීමට නියෝගයක් මඟින් නීතිමය පියවර ගතහැකි වුවද අධිකාරිය විසින් එසේ සිදුකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) පොල් නිෂ්පාදන මිල අඩු වැඩි වීම මත වෙළඳපලට පොල් නිෂ්පාදන නිකුත් කිරීමේ මිල ස්ථායීකරණය අරමුදලක් ආරම්භ කර තිබුණද මෙවැනි අරමුදලක් ඇති කිරීමට ව්‍යවස්ථාපිත නියෝගයක් නිකුත් කර තිබූ බවක් නිරීක්ෂණය නොවුණි. සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෙම අරමුදලේ ශේෂය රු. 439,620,170 ක් වූ අතර අරමුදල පිහිටුවීමේ මූලික අරමුණුද මේ දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය 2020 සැප්තැම්බර් මස සිට වසර 4 කට අධික කාලයක් වසා දැමීම හේතුවෙන් දිගින් දිගටම නිශ්කාර්යව පැවතීම නිසා ඒ තුළ තිබූ යන්ත්‍ර 18 ක් භාවිතයට ගත නොහැකි තත්වයට පත්වී තිබුණි.

(ඇ) අපනයනය සඳහා වූ තාවකාලික ආනයන ක්‍රියාවලියේදී (TEIP) ආනයනය කරන ලද තාවකාලික ආනයන, අගය එකතු කර නැවත අපනයනය කිරීමේදී අධිකාරිය නියැදි පරීක්ෂාවක් සිදු කරන අතර රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා දීමට ප්‍රථම එම ප්‍රතිඅපනයන ක්‍රියාවලිය සම්පූර්ණ වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 2 දක්වා නිෂ්පාදිත හතරකට අදාළව කිලෝ ග්‍රෑම් 3,525,648 ක් ප්‍රතිඅපනයනය කිරීමට පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර අධිකාරිය විසින් අනුමැතිය ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ එවැනි පරීක්ෂා කිරීම් 164 ක් සිදු කර තිබූ අතර එහි වාර්තාවන් ඉදිරිපත් කිරීම සඳහා මාස 1 ත් මාස 3 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණි. ඒ සඳහා අධිකාරිය සමාලෝචිත වර්ෂයේ පරීක්ෂණ ආදායම වශයෙන් රු.14,384,250 ක් ප්‍රතිඅපනයනකරුවන්ගෙන් අයකරගෙන තිබුණත් ඒ සඳහා ප්‍රශස්ථ සේවාවක් එම පාර්ශවයන් සඳහා ලබා දී නොතිබුණි. රසායනාගාර වාර්තා ලබාදීමට පෙර ප්‍රතිඅපනයනයට අවසර දීම මත පොල් නිෂ්පාදනය කෙරෙහි ජනතා විශ්වාසය බිඳීයාමේ අවධානමක් නිරීක්ෂණය විය.

(ඇ) කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එළඹී අවබෝධතා ගිවිසුමේ 3.3 වගන්තිය ප්‍රකාරව කාරක ණය ගිණුමේ උපරිමය රු.මිලියන 10 කට සීමා වන අතර අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු ගිණුමට මාරු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාරක ණය ගිණුමේ රු.30,888,823 ක ශේෂයක් පැවතියද රු.20,888,823 ක් වූ අතිරික්තය ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කිරීමට අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2024 නොවැම්බර් 30 දින වන විට දුන්කන්නාව වත්තේ පොල් වගාව ආශ්‍රිතව සියලුම එල දරන ගස් සියයට 100 ක්ම සුදු මැස්සා හානියට ලක්ව තිබුණු අතර මෙම රෝගය පළමු වරට 2022 ඔක්තෝබර් මාසයේදී හඳුනාගෙන තිබුණි. මේ සම්බන්ධව අවස්ථා දෙකකදී පාලන ක්‍රියාමාර්ග ගෙන තිබුණද 2023 අප්‍රේල් මාසයෙන් පසු විගණිත දින දක්වා වන වසර එකයි මාස හතකට අධික කාලයක් සුදුමැස්සා හානිය වළක්වාලීම සඳහා උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් පරපෝෂිතයන් ලබාගැනීමට ඉල්ලීම් සිදු කිරීම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) 2023 ජූලි 06 දැනි රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදී අධිකාරිය සඳහා නිර්දේශ 07 ක් ක්‍රියාත්මක කිරීමට නියෝග කර තිබුණද ඉන් පහත සඳහන් නියෝග 4 ක් ක්‍රියාත්මක කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

i. සවුදි අරාබියේ වගා ව්‍යාපෘතියක් සඳහා පොල් ලෙලි අපනයනය කිරීම පිළිබඳ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

ii. පොල් වගාවේ වර්තමාන ගැටළු පිළිබඳ රූපවාහිනී වැඩසටහනක් හරහා දැනුවත් කිරීමට පියවර ගැනීම.

iii. දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය පිළිබඳ වාර්තාවක් මසක් තුළ රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට ලබා දීම.

iv. පොල් සංවර්ධන අධිකාරිය, පාරිභෝගික සේවා අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ ගුණාත්මයෙන් අඩු පොල්තෙල් ආනයනය කිරීම පිළිබඳ සෞඛ්‍යමය ගැටළු සාකච්ඡා කිරීම.

ඒ.ඒ.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)